a වයසි, වයසක් වාච්‍යතන්හි; හායනාත් ච, (සංඛ්‍යාවක් පූජා කොට ඇති) හායන ශබ්දයාකෙරෙන් ද ඊප්ප්‍රත්‍යය වේ; විහායනී ("වෙඉ" හායනෙඉ යස්‍යාඃ සා" ඉන වාක්‍යයෙහි) "විහායනී" යනු වේ. (අවුරුදුදෙකක් වයසැති ස්ත්‍රියයි.) චතුර්හායණී, ("චතුර්හායනා යස්‍යාඃ සා" යන වාක්‍යයෙහි) "චතුර්හායණී" යනු වේ. (අවුරුදුහතරක් වයසැති ස්ත්‍රියයි.) පරිමාණෙ, ප්‍රමාණයක්වාච්‍ය තන්හි; පුරුෂාත්, (සඛ්‍යාවක් පූජාකොට ඇති) පුරුෂශබ්දයා කෙරෙන්; වා, විකල්පයෙන් ඊප්ප්‍රත්‍යය වේ. විපුරුෂී, ("වෙඉ පුරුෂෙඉ යස්‍යාඃ සා" යන වාක්‍යයෙහි) "විපුරුෂී" යනුද; විපුරුෂා වා, විකල්පයෙන් "විපුරුෂා" යනුද වේ. පරිඛා, (පුරුෂ ප්‍රමාණ දෙකක්ඇති) දිග අඟලයි. (මෙහි 'හායන" ශබ්දයා කෙරෙන් හා 'පුරුෂ"ශබ්දයා කෙරෙන් ඊප්ප්‍රත්‍යය වත් ම සංඛ්‍යාපූජාබහුව්‍රිහි සමාසයාකෙරෙන්ම වේ.)

250 ඉන්ද්‍රාදෙඃ, ඉන්ද්‍රාදිගණයාකෙරෙන්; ආනීප්, (සත්‍රිඅර්‍ථයෙහි) ආනිප්ප්‍රත්‍යය වේ.

b ඉන්ද්‍රාදෙඃ ගණාත්, ඉන්ද්‍රාදිගණයාකෙරෙන්; සත්‍රියාම්,සත්‍රි අර්‍ථයෙහි; ආනීප්ප්‍රත්‍යයඃ භවති, "ආනීප්" ප්‍රත්‍යය වේ. (ඉන්ද්‍රා දෙඃ ඉති, "ඉන්ද්‍රාදෙඃ" යන මෙහි; ආදිශබ්දාත්, ආදිශබ්දයෙන්; ඉන්ද්‍ර, ඉන්ද්‍රශබ්දය; බ්‍රහ්මන්, "බ්‍රහ්මන්" ශබ්දය; රුද්‍ර "රුද්‍ර" ශබ්දය; භව, "භව" ශබ්දය; ශර්ව, "ශර්ව" ශබ්දය; මෘඩ, "මෘඩ"

---

† මේ සූත්‍රය ඇතැම් කෙනෙක් "ඉන්ද්‍රාදෙරානීප්ච" යනුවෙන් දක්වා "ඉන්ද්‍රා දෙඃ, ඉන්ද්‍රාදිගණයා කෙරෙන්; ආන්, "ආන්" ආගමද; ඊප්ච, ඊප්ප්‍රත්‍යයද වේයයි" අර්‍ථ කියන්. සමහරු මෙහි වග්‍රහණයෙන් මානුලාදියෙන් පරව විකල්පයෙන් "ආනිප්" ප්‍රත්‍යය වේයයිද කියන්.

a "මාතුලෝපාධ්‍යායක්ෂත්‍රියාවයෝවා" මාතුලානී-මාතුලී. උපාධ්‍යායානී-උපාධ්‍යායී, "අයෂීක්ෂත්‍රියාභ්‍යාං වා සවාළුඕ" අයෂ්‍යාණී-අයෂ්‍යා, ක්ෂත්‍රියාණී-ක්ෂත්‍රියා, ආවායෂ්‍යාණී.

ශබ්දය; වරුණාදයඃ, "වරුණ" ශබ්දය යන මේ ආදිහු (ගණු ලැබෙත්). ඉන්‍ද්‍රාණී "ඉන්‍ද්‍ර" ශබ්දයා කෙරෙන් "ආනීප්" ප්‍රත්‍යය කළ කල්හි "ඉන්‍ද්‍රාණී" යනු වේ. (ඉන්‍ද්‍රපත්නියයි). බ්‍රහ්මන්ශබ්දස්‍ය, "බ්‍රහ්මන්" ශබ්දයාගේ; නලොපඃ, නකාරලොපය; වාච්‍යඃ, කිය යුතුයි "බ්‍රහ්මාණී, රුද්‍රාණී භවානී, ශර්‍වාණී, මෘඩානී, වරුණානී" යන තන්හි "බ්‍රහ්මන්, රුද්‍ර, භව, ශර්‍ව, මෘඩ, වරුණ" ශබ්දයන් කෙරෙන් "ආනීප්" ප්‍රත්‍යයයි. "බ්‍රහ්මාණී" යනු බ්‍රහ්ම පත්නියයි. "රුද්‍රාණී මෘඩානී" යනු ශිවපත්නියයි. "වරුණානී" යනු වරුණ දෙවපත්නියයි.

a මාතුල, "මාතුල" ශබ්දය; උපාධ්‍යාය, 'උපාධ්‍යාය" ශබ්දය; අයෂ්‍ය, "අයෂ්‍ය" ශබ්දය; ක්ෂත්‍රිය, "ක්ෂත්‍රිය" ශබ්දය; ආවායෂ්‍ය. "ආවායෂ්‍ය' ශබ්දය යන මොහු කෙරෙන්; වා, විකල්පයෙන් 'ආනීප්" ප්‍රත්‍යය වේ. මාතුලානී-මාතුලී, මාතුල ශබ්දයාකෙරෙන් 'ආනීප්' ප්‍රත්‍යයවූ කල්හි "මාතුලානී" යනුද විකල්පයෙන් නුවූතන්හි' "මාතුලී" යනුද වේ (මාතුලපත්නියයි). උපාධ්‍යායානී-උපාධ්‍යායී, "උපාධ්‍යාය" ශබ්දයා කෙරෙන් 'ආනීප්" ප්‍රත්‍යයවූ තන්හි"උපාධ්‍යායානී" යනුද, විකල්පයෙන් නුවූතන්හි 'උපාධ්‍යායී' යනු ද වේ. (උපාධ්‍යාය පත්නියයි) අයෂීක්ෂත්‍රියාභ්‍යාං, "අයෂීක්ෂත්‍රිය ශබ්ද දෙකෙන්; සවාළුඕ, සවාළුඕයෙහි හෙවත් සවකිය සන්ධියෙහි; වා, විකල්පයෙන් "ආනීප්" ප්‍රත්‍යය වේ. අයෂ්‍යාණී-අයෂ්‍යා, 'අයෂ්‍ය" ශබ්දයා කෙරෙන් "ආනීප්' ප්‍රත්‍යය වූතන්හි "අයෂ්‍යාණී" යනු ද විකල්පතන්හි "අයෂ්‍යා" යනුද වේ. (වෛශ්‍යජාතීයසන්ධියයි) ක්ෂත්‍රියාණී-ක්ෂත්‍රියා "ක්ෂත්‍රිය" ශබ්දයා කෙරෙන් "ආනීප්" ප්‍රත්‍යය වූතන්හි "ක්ෂත්‍රියාණී' යනුද විකල්පතන්හි "ක්ෂත්‍රියා" යනුද වේ. (ක්ෂත්‍රියසන්ධියයි). ආවායෂ්‍යාණී, යන තන්හි "ආවායෂ්‍ය" ශබ්දයා කෙරෙන් "ආනීප්' ප්‍රත්‍යයයි. (ආවායෂ්‍යපත්නියයි).

මෙකී ඉන්‍ද්‍රාදිගණයට "ඉන්‍ද්‍ර වරුණ භව ශර්‍ව රුද්‍ර මෘඩ හිම අරණ්‍ය යව යවන මාතුල උපාධ්‍යාය අයෂ්‍ය ක්ෂත්‍රිය ආවායෂ්‍ය" යන මොහු ඇතුළත් වෙත්. එහි "ඉන්‍ද්‍ර" ශබ්දය පටන් "යවන" ශබ්දය අවසන් කොට ඇත්තවුන් කෙරෙන් **නිත්‍ය**යෙන්ද

a "භිමාරණ්‍යයොඃ භයතෙව" මහද්භිම=භිමානි, මහදර ණ්‍යමරණ්‍යානි, "යවාදෙදුෂෙ" දුෂ්‍යතා යවෙ=යවානි, "යව නාලලිප්‍යාම්" යවනානාං ලිපිඃ=යවනානි.

b "ඊප්සමාහාරෙ ගුණාත්‍රය" ත්‍රයාණාං සමාහාරං=† ත්‍රයි "පුංයොගාත්‍ර ච" ශුද්‍රස්‍ය භාර්‍යා=ශුද්‍රි, ගණිකා. "ගොපාලකා දිනාං න" ගොපාලිකා, පාශුපාලිකා. "සුයම්‍යාදෙදවනාදයාං චාප්" සුයශ්‍රියා සන්‍ති දෙවනා=සුයම්‍යා, අන්‍යා=සුයී

"මාතුල" ශබ්දයිය හෙරෙන් විකල්පයෙන්ද 'ආනීප්' ප්‍රත්‍යය වේයයි කියනලදී. එහිද "ඉන්‍ද්‍ර වරුණ භව ශර්‍ව රුද්‍ර මෘඩ මාතුල උපාධ්‍යාය ආචාර්‍ය්‍ය" යන මොවුන්හෙරෙන් පුංයොගයෙහි ද, "ආර්‍ය්‍ය ක්ෂත්‍රිය" දෙකෙන් පුංයොගරහිත සඛ්‍යිය ස්ත්‍රීත්වයෙහිද වේ. තවද "මාතුල-සුයම්‍යාඛා" යන මෙහි වාඃශබ්දයාගේ ව්‍යවස්ථාව යෙන් පුංයොගයෙහි "ආචාර්‍ය්‍ය" ශබ්දයා හෙරෙන් නිත්‍යයෙන් ආනීප් ප්‍රත්‍යය වේ. පුංයොගරහිත තන්හි ආප්ප්‍රත්‍යයව 'ආචාර්‍ය්‍යා' කියාද වේ. මාතුලාදියෙන් විකල්පයෙන් "ආනීප්" ප්‍රත්‍යය වේ. මාතුලොපාධ්‍යාය ශබ්ද දෙකෙන් ඊප්ප්‍රත්‍යයද විකල්පව "මාතුලා, උපාධ්‍යායා" යනුද වේ. චන්‍ද්‍රකීර්තිටීකාවෙහි සුයම්‍යී ශබ්දයා හෙරෙන්ද ආනීප් ප්‍රත්‍යය කොට 'සුයම්‍යාණි" කියාද දක්නා ලැබේ. "භිම" ශබ්දයියෙන් "ආනීප්" ප්‍රත්‍යය යෙදෙන තැන් දක්වනු පිණිස "භිමාරණ්‍යයොඃ" යනාදිය කිහු.

a මහත්භෙ, මහත්බවක් වාච්‍යතන්හි; භිමාරණ්‍යයොඃ, "භිම අරණ්‍ය" ශබ්දදෙක සම්බන්‍ධව "ආනීප්" ප්‍රත්‍යය වේ. මහන් භිමම්, මහත්වූ පින්න; භිමානී. "භිමානී" නම් වේ. මහත් අරණ්‍යම්, මහත්වූ වනය; අරණ්‍යානී, "ආරණ්‍යානී" නම් වේ. දෙෂෙ, දෙෂ යක් වාච්‍යතන්හි; යවාත්, "යව" ශබ්දයාහෙරෙන් "ආනීප්" ප්‍රත්‍යය වේ. දූෂ්‍යඃ, දූෂ්‍යවූ; යවඃ, යවධාන්‍යය; යවානී, "යවානී" නම් වේ. ලිප්‍යාම්, ලිපියක් (අක්ෂරවින්‍යාසයක්) වාච්‍යතන්හි; යවනාත්, "යවන" ශබ්දයා හෙරෙන් "ආනීප්" ප්‍රත්‍යය වේ. යවනානාම්, යවනුන්ගේ; ලිපිඃ, ලිඛිතාක්ෂරවින්‍යාසය; යවනානී. "යවනානී" නම් වේ. (මෙහි "භිම" ශබ්දයිය හෙරෙන් "ආනීප්" ප්‍රත්‍යයයි).

b සමාහාරෙ, සමාහාරාර්‍ථයෙහි; ඊප්, "ඊප්" ප්‍රත්‍යයද; ගුණඃ ච, නාම්න්ස්වරයට ගුණද වේ. ත්‍රයාණාම්, තුන්දෙනෙකුන්ගේ;

---

* "ත්‍රි" යන්න ඇතැම් පොත්වල "අයව්" ප්‍රත්‍යයාන්ත "ත්‍රය" ශබ්දයා හෙරෙන් වඤාරම්භත්වයෙන් "ෂට ත්‍රිතඃ" යන සූත්‍රයෙන් ඊප්ප්‍රත්‍යය කොට සිඛ හෙරෙන්.

251. ජාතෙරයොපධාත්. (ජාතෝඃ 5, 1; අයොපධාත් 5, 1;)

a ජාතිවාචිනෝ 'යකාරෝපධාදකාරාන්තාච්ඡන්ත්‍රියාම්ප්‍රත්‍යයෝ භවති (අසන්ත්‍රීවිෂයාදිති වාච්‍යම්. තෙන මක්ෂිකා බලාකා ඉත්‍යාදෙඊ න.)

සමාහාරඃ, සමාහෘතීය (එක්කොටගැණීම); ත්‍රයී, "ත්‍රයී" නම් වේ. පුංයොගෙ ව, පුංයොගයෙහි ද (පුරුෂයෙකුගේ යොගය ඇති කල්හිද (ඊප්ප්‍රත්‍ය වේ) ශූද්‍රස්‍ය, ශූද්‍රයාගේ, භාර්‍යා, භාර්‍යාතොමෝ; ශූද්‍රී, ශූද්‍රි නම් වේ. ගණකී, ගණකයාගේ භාර්‍යාව "ගණකී" නම් වේ. (මෙහි පුංයොගයෙහි ඊප්ප්‍රත්‍යයයි) ගොපාලිකාදීනාම්, "ගොපාලිකා" ශබ්දාදීන් සමබන්ධව; න, (පුංයොගයෙහිද) ඊප්ප්‍රත්‍යය නොවේ. ගොපාලිකා, ගොපල්ලාගේ භාර්‍යාව 'ගොපාලිකා" නම් වේ. පාශූපාලිකා, පසුපල්ලාගේ භාර්‍යාව "පසුපාලිකා" නම් වේ. (මේ පිළිබඳව සිද්ධාන්තකෞමුදියෙහි "පාලකානන්තාන්න" යනු කිහු පාලකශබ්දය අන්තකොට ඇත්තහු කෙරෙන් පුංයොගයෙහි ඊප්ප්‍රත්‍යය නොවේ. යනු එහි භාවයයි.) සූර්‍යීත්, සූර්‍යීශබ්දයා කෙරෙන්; දෙවතාර්‍යාම්, දෙවතාඊයක් වාච්‍යතන්හි (පුංයොගයෙහි); ආප් ච, ආප්ප්‍රත්‍යය ද වේ. (වඡබද යෙන් දෙවතාවාචක නොවන තන්හි ඊප්ප්‍රත්‍යය ද වේ.) සූර්‍යීස්‍ය, සූර්‍යීයාගේ; සත්‍රී, සත්‍රීතොමෝ; දෙවතා, දෙවතා වූවා; සූර්‍යී, "සූර්‍යී" නම් වේ. අන්‍යා, අන්‍ය වූවා හෙවත් දෙවතා නුවූවා; සූරී, "සූරී" නම් වේ. ("යලොපශව" යන සූත්‍රයෙන් මෙහි යකාර ලොපයයි. මෙහි ඒ සූත්‍රය තඩිතයෙහි දක්නාලැබේ.)

251 ජාතෙඃ, (අකාරාන්ත) ජාතිවාචක ශබ්දයා කෙරෙන් ඊප්ප්‍රත්‍යය වේ. අයොපධාත්, යකාරය උපධාකොට ඇත්තහු කෙරෙන් නොවේ.

a අයකාරෙපධාත්, යකාරය උපධාසංඥකොට නැත්තාවූ; අකාරාන්තාත්, අකාරාන්තවූ; ජාතිවාචිනඃ, ජාතිවාචකශබ්දයා කෙරෙන්; සත්‍රියාම්, සත්‍රිඅර්‍ථයෙහි; ඊප්ප්‍රත්‍යයඃ භවති, ඊප්ප්‍රත්‍යය වේ. අසන්ත්‍රීවිෂයාත් ඉති, සන්ත්‍රීලිඞ්ගය විෂයකොට නැත්තහු කෙරෙන් යයි, හෙවත් නිත්‍යස්ත්‍රීලිඞ්ගවර්‍ජිතයා කෙරෙන් යයි; වාච්‍යම්, කියයුතුයි. තෙන, එහෙයින්; මක්ෂිකා බලාකා ඉත්‍යාදෙඊ, "මක්ෂිකා බලාකා" යනාදියෙහි; න, නොවේ. ("මක්ෂිකා" ශබ්දාදිය ජාතිවචකවුව ද නියතස්ත්‍රීලිඞ්ග බැවින් ඊප්ප්‍රත්‍යය නොවේ.)

a "ගවය හය මුඛය මත්‍සය මනුෂ්‍යාණාං න නිෂෙධඃ" ගවයි ඉත්‍යාදි. සුඛරී හංසි කුඛකුටී බ්‍රාහ්මණී. අයඛාරොපධග්‍රහණාත් ක්ෂත්‍රියා වෛශ්‍යා.

---

a ගවය හය මුඛය මත්‍සය මනුෂ්‍යාණාම්, "ගවය හය මුඛය මත්ස්‍ය මනුෂ්‍ය" යන මේ ශබ්දයන් සම්බන්ධව; නතිෂෙධඃ, ප්‍රති ෂෙධ නොවේ, හෙවත් ඊප්ප්‍රත්‍යය වේ ගවයි ඉත්‍යාදි, (එහෙයින්) "ගවයි" යනාදිය වේ. (මේ "ගවය" ශබ්දයේහි උපධාසංඥය යකාරය වූවද මොවුන් කෙරෙන් ඊප්ප්‍රතය්‍ය වේ.) 'සුඛරී" යන තන්හි ජාතිවාචකත්වයෙන් ස්ත්‍රීඅර්ථයෙහි ඊප්ප්‍රත්‍යය යි. "හංසී කුඛකුටී බ්‍රාහ්මණී" යන තන්හි ද එසේයි. අයඛාරොපධග්‍රහණාත්, යකාරය උපධාසංඥකොට නැත්තක් ගැණීමෙන්; ක්ෂත්‍රියා වෛශ්‍යා, "ක්ෂත්‍රියා වෛශ්‍යා" යනු වේ. හෙවත් "ක්ෂත්‍රියා වෛශ්‍යා" යන තන්හි ඊප්ප්‍රත්‍යය නොවේ.

මෙහි කී ජාතිලක්ෂණ දක්වන්නාවූ වෛයාකරණයෝ:-

"ආකෘතීග්‍රහණා ජාතිර්ලිඞ්ගානාච න සර්ව්භාක්,
සකෘදාඛ්‍යාතනිර්ග්‍රාහ්‍යා ගොත්‍රච චරණෛඃ සහ"

යනු කීහු. මෙහි භාවය-අවයවසංසථානයෙන් දැනගැණීම ඇත්තී හෝ අවයවසංසථාන දැනගැණීමට කරණවූවා ජාති නම් වේ. (යම් ශබ්දයක භින්නපදෘත්ති ඇතත් ඒ භින්නපදෘත්තියන් අවයව සටහනෙන් එකාකාරයොට දතහැකි නම් ඒ භින්නපදෘත්තියන් ඇති ශබ්දය ජාතියයි කියනු ලැබේ.) එනම් මනුෂ්‍ය ගො මෘග හංසාදීන්ගේ අවයවසටහනෙන් ලකුණුකරණු ලබන්නාවූ මනුෂ්‍යත්ව ගොත්ව මෘගත්ව හංසත්වාදියයි හෙවත් මිනිස්බැව් ආදියයි. මේ සාමාන්‍ය ජාතිලක්ෂණයි. මෙසේ ලක්ෂණවශයෙන් ගත්කල මනුෂ්‍යාදි ඒ ඒ ජාතිවලට ඇතුළත්ව පවත්නා ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදි ශබ්ද අවයවසටහන් වශයෙන් එකාකාර බැවින් පෘථග්ජාතිත්වයෙන් තොර වේ. එබැවින් ඒ ක්ෂත්‍රියබ්‍රාහ්මණාදිය ද වෙන් වෙන් වසයෙන් මනුෂ්‍යාදි සාමාන්‍ය ජාතිපදෘත්තියට ඇතුළත් පෘථග්ජාතියයි දක්වනු පිණිස "ලිඞ්ගානාව න සර්ව්භාක්" යනු කීහු. යමක් මනුෂ්‍යාදිය පිළිබඳ ආකාරසාම්‍යයෙන් යුක්තවුවත් සර්ව්ලිඞ්ග භජනය නො කෙරේ නම් හෙවත් පුලල්ලිඞ්ග සත්‍රිලිඞ්ගවය භජනය කෙරේ නම් ඒ ක්ෂත්‍රියබ්‍රාහ්මණාදිය ද ජාති යයි කියනු ලැබේ යනු එහි භාවයයි පූර්වොක්ත අවයවසටහනින්

a ''ශූද්‍රාජ්ජාතෞ න'' ශූද්‍රස්‍ය ජාතිඃ ශූද්‍රා. ''මහත්ස්‍ත්‍රීභ්‍යාං තු ඊප්'' මහාශූද්‍රි, ආභීරජාතිඃ. ''ස්ත්‍රියොගෙ ව'' මහාශූද්‍රස්‍ය'' භාෂ්‍යා=මහාශූද්‍රි.) ''ප්‍රථමවයොවාචිනොතඊප් වක්තව්‍යඃ'' (කාශ්‍යාශබ්දානා) කුමාරි, කිශොරි, බාලහි. ප්‍රථමවයොග්‍රහණාද්-වෘද්ධා සාවිත්‍රී ඉත්‍යාදෞ න (වධූර්ධ, විරණ්ටි, ඉත්‍යත්‍ර ඊප්භවත්‍යෙව.) අද්ග්‍රහණාච්ච්‍රියඃ.

නිශ්චය කොට දැනගැණීමත් ඇල්ලිඛහජනය නොකිරීමත් මේ ලක්ෂණයෙන් යුක්තාඛ්‍ය යුතුයයි දැක්වීම පිණිස ''සඤ්ඥාදඛ්‍යාතනිර්ග්‍රාහ්‍යා'' යනු කිහු. යමක් ඇදින ගැණීම එක්පිඬක ලා එක්වරක් උපදෙස් දුන්කල්හි නැවත අන්පිඬක දුටුවත් ඒ උපදෙශයෙන් එය නිශ්චය කොට ගතහැකි නම් ඒ ජාතිය යනු එහි භාවයයි. කුක්කුට සූකරාදි ඒ ඒ කොටස් එකවරක් උපදෙස් දී හැඳින්නීමෙන් පසු අන් කොටසකදී දුටුවත් වෙන්කොටගත හැකි බැවින් ජාති වෙත්. යමක් සියලුලිහු භජනය නොකළත් එසේ නිශ්චය කොට ගත නොහැකි නම් ඒ ජාති නොවේ. ඒ දෙවදත්තාදි සංඥා ශබ්දයෝයි. ඒ ඒ කොටස්වල ගොත්‍රවශයෙන් වෙනස්වූවන්ද වෙදෙසාදෙශ (ඒ ඒ ශිල්ප) වශයෙන් වෙන්වූවන්ද ආකාරලක්ෂණයෙන් භෙදයක් නැති බැවිනුත් සියලුලිහු භජනය කරණ බැවිනුත් පුළිලක්ෂණ වශයෙන් පෘථග්ජාතිඛ්‍යට ඇතුළත් නොවේ. එබැවින් ඔවුන්ද පෘථග්ජාතිඛ්‍යට ඇතුළත් කරගැණීමට ලක්ෂණානන්තරයක් වශයෙන් ''ගොත්‍රච චරණෛඃ සහ'' යනු කිහු. ඒ ඒ ජාතිවලට ඇතුළත් දරුමුනුබුරු පරම්පරාවෝ ද කඨාදිවෙදෛකදෙශයකින් යුත් කොටස්ද පාථග්ජාති වෙත්ය යනු එහි භාවයයි. මෙහි ''ආකෘති ග්‍රහණා ජාතිඃ'' යන ලක්ෂණයෙන් ''කුක්කුටි, සූකරි'' යනාදියද, ''ලිඛානාච්ච න සන්තීහාක්'' යන්නෙන් ''බ්‍රාහ්මණී වෘෂලී''යනාදිය ද, ''ගොත්‍රච චරණෛඃ සහ'' යන තන්හි ගොත්‍රලක්ෂණයෙන් ගාර්ගී' පෙතෘස්වසෙයි'' යනාදියද, ''චරණෛඃ'' යන්නෙන් ''කඨි, චරකි'' යනාදියද ගණු ලැබේ.

a (ජාතෞ, ජාතිවාචකතන්හි; ශූද්‍රාත්, ''ශූද්‍ර'' ශබ්දයා කොරෙන්; න, ඊප්ප්‍රත්‍යය නොවේ. ශූද්‍රස්‍ය, ශූද්‍රයාගේ; ජාතිඃ, ශූද්‍රා, ''ශූද්‍රා'' නම් වේ. මහත්ස්ත්‍රීභ්‍යාතු, මහත්ශබ්දය පුළුකොට ඇති ''ශූද්‍ර'' ශබ්දයා කොරෙන් වනාහි; ඊප්, ඊප්ප්‍රත්‍යය වේ. මහාශූද්‍රි, (එසල්හි) ''මහාශූද්‍රි'' යනු වේ. ආභීරජාතිඃ, ගොපොලුජාති යයි. (''මෙහි ජාතිවාචකවුවත් මහත් ශබ්දය පුළුකොට ඇති බැවින් ඊප් ප්‍රත්‍යය වේ.) ස්ත්‍රියොගෙ ව, ස්ත්‍රියොගයක් ඇතිකල්හිද ඊප්

252. සවාඞ්ගාවා. (සවාඞ්ගාත් 5, 1; වා 1, 1;)

a සවාඞ්ගවාචිනෝ වා සත්‍රියාම්ප්‍රත්‍යයෝ භවති. සුමුඛී–සුමුඛා, මෘගාක්ෂී--මෘගාක්ෂා, තන්වඞ්ගී–තන්වඞ්ගා.

ප්‍රත්‍යය වේ. මහාශූද්‍රයාගේ; භාර්‍යා, භාර්‍යාතොමෝ; මහාශූද්‍රී, "මහාශූද්‍රී" නම් වේ. (මෙහි පුංයොගලක්ෂණයෙන් ඊප්ප්‍රත්‍යයයි.) ප්‍රථමවයොවාචිනඃ, ප්‍රථමවයස වාචකවූ; අතඃ, අකාරාන්ත ශබ්දයා කෙරෙන්; ඊප්, ඊප්ප්‍රත්‍යය; වක්තව්‍යඃ, කියයුතුයි. කන්‍යාශබ්දත්, "කන්‍යා" ශබ්දයා කෙරෙන්; න, නොවේ. "කුමාරී" යන තන්හි "කුමාර" ශබ්දයා කෙරෙන් ප්‍රථමව යොවාචකත්වයෙන් ඊප්ප්‍රත්‍යය යයි. "කිශොරී, කලභී" යන තන්හිද එසේයි. ප්‍රථමවයොග්‍රහණාත්, ප්‍රථමවයස ගැණීමෙන්; වෘඩා සථවිරා ඉත්‍යාදෙෂු, "වෘඩා සථවිරා" යන මේ ආදියෙහි; න, (වරමවයස වාචක බැවින්) ඊප්ප්‍රත්‍යය නොවේ. වඩ්ඪිතී විරණ්ඪිතී ඉත්‍යත්‍ර, "වඩ්ඪිතී විරණ්ඪිතී" යන මෙහි; ඊප් "ඊප්" ප්‍රත්‍යය; භවති එව, වේමය. අද්‍රව්‍යග්‍රහණාත්, අකාරාන්තයා කෙරෙන් යයි ගැණීමෙන්; ශිශූඃ, 'ශිශු" නම් වේ, හෙවත් "ශිශු" යන්නෙන් පරව ඊප්ප්‍රත්‍යය නොවේ.

මෙහි ප්‍රථමවයොවාචක ශබ්දයන් කෙරෙන් ඊප්ප්‍රත්‍යය වේයයි සාමාන්‍යයෙන් කිවත් 'වඩ්ඪිතී, විරණ්ඪිතී" යන තන්හි ඊප් ප්‍රත්‍යය වීමෙන් මධ්‍යවයොවාචකශබ්දයන් කෙරෙන්ද වනබැව් හැඟේ. ඒ සඳහා සිද්ධාන්තකෞමුදියෙහි ' වයස්‍යචරම ඉතිවාච්‍යම්" යනු කීහු. චරමවයස නොවන තන්හි යයි කියයුතු වේ. යනු එහි භාවයයි. ප්‍රාණීන්ගේ වයස බෙදන්නාහු සමහර තන්හි ත්‍රිභෙද කොටද සමහරතන්හි චතුර්භේද කොටද දක්වත්. එය:-

"පිතා රක්ෂති කෞමාරෙ භර්තා රක්ෂති යෞවනෙ,
පුත්‍රාසතු සථාවිරෙ භාවෙ න ස්ත්‍රී ස්වාතන්ත්‍ර්‍යමර්හති"

යන්නෙන්ද:-

"ආද්‍යෙ වයසි නාධීතං විතීයෙ නාර්ජිතං ධනම්,
තෘතීයෙ න තපස්තප්තං චතුර්ථෙ කිං කරිෂ්‍යති"

යන්නෙන් ද ප්‍රකාශිතයි. මෙහි පූර්‍වශ්ලෝකයෙන් වයස්හුගේ ත්‍රිභෙදය ද විතීයශ්ලෝකයෙන් චතුර්භේදය ද නිර්දිෂ්ටයි.

252 සවාඞ්ගාත්, සවාඞ්ගවාචක ශබ්දයා කෙරෙන්; වා, විකල්පයෙන් (ස්ත්‍රීඅර්‍ථයෙහි) ඊප්ප්‍රත්‍යය වේ.

a සවාඞ්ගවාචිනඃ, සවාඞ්ගවාචක ශබ්දයා කෙරෙන්; ස්ත්‍රියාම්, ස්ත්‍රීඅර්‍ථයෙහි; වා, විකල්පයෙන්; ඊප්ප්‍රත්‍යයඃ භවති, ඊප්ප්‍රත්‍යය වේ.

a (සුෂ්ඨු ආ සමන්තාදඞ්ගං=සවාඞ්ගම්, සවස්‍ය ප්‍රාණිනොඞ්ගං සවාඞ්ගමිත්‍යුකෙතඞ්ගාඞ්ගිභාවෙනඤ්ඤාදෙරපි සවාඞ්ගත්වං සාත්. අතඃ සවාඞ්ගලක්ෂණමාහ:-

b "ප්‍රාණිසඨමද්‍රවං මූර්තිං සවාඞ්ගං ස්‍යාදවිකාරජම්,
තත්‍ර දෘෂ්ටමනඨං චෙත් සථිතං තවව්ව නාදෘශි"

සුමුඛි-සුමුඛා, ("සුෂ්ඨු මුඛං යස්‍යාඃ සා" යන වාක්‍යයෙහි) ඊප්ප්‍රත්‍යය වූ තන්හි 'සුමුඛි' යනුද විකල්පයෙන් නොවූ තන්හි "සුමුඛා" යනුද වේ. (සොඳුරු මුව ඇත්තියයි) මෘගාක්ෂි-මෘගාක්ෂා, ("මෘගස්‍යෙව අක්ෂිණී යස්‍යාඃ සා" යන වාක්‍යයෙහි) 'මෘගාක්ෂි" යනුද, විකල්පයෙන් "මෘගාක්ෂා" යනුද වේ. (මුවෙකුගේ වැනි දැස්ඇත්තියයි.) තන්‍වඞ්ගි-තන්‍වඞ්ගා, ("තනු කෘශං අඞ්ගං යස්‍යාඃ සා" යන වාක්‍යයෙහි) "තන්‍වඞ්ගි" යනුද, විකල්පයෙන් "තන්‍වඞ්ගා" යනුද වේ. (කෘශවූ මධ්‍යප්‍රදෙශ ඇත්තියයි.) (මෙහි "මුඛ අක්ෂින් අඞ්ග" යන ශබ්දයන් සවාඞ්ගවාචක ශබ්ද බැවින් විකල්පයෙන් ඊප්ප්‍රත්‍යය යයි, මෙතැන්පටන් මෙකී "සවාඞ්ග" යන්නෙහි නිර්වචන හා තල්ලක්ෂණ ද දැක්වීම පිණිස "සුෂ්ඨු" යනාදිය හා "ප්‍රාණිසඨං" යනාදියද කීහු.)

a සුෂ්ඨු, මනාකොට; ආ, "ආ" යි සේයි; සමන්තාත්, හාත් පස්හිවූ; අඞ්ගං, අවයවය; සවාඞ්ගම්, සවාඞ්ග නම් වේ. සවස්‍ය, "සවස්‍ය" යයි සේයි; ප්‍රාණිනඃ, ප්‍රාණියෙකුගේ; අඞ්ගම්, අවයවයද; සවාඞ්ගම්, "සවාඞ්ග" නම් වේ. ඉති උකෙන, මෙසේ කී කල්හි; අඞ්ගාංගීභාවෙන, අවයවය අවයව ඇත්තාය යන දෙදෙනාගේ භාවයෙන්; ඤ්‍යාදෙඃ අපි, ඤ්‍යාදිහුගේද; සවාඞ්ගත්වං ස්‍යාත්, සවාඞ්ගභාවය වන්නේය. අතඃ, එහෙයින්; සවාඞ්ගලක්ෂණම්, සවාඞ්ගලක්ෂණය; ආහ, කියයි:-

b ප්‍රාණිසඨං, ප්‍රාණියෙකු කෙරෙහි පිහිටියාවූ, හෙවත් සවෙතන ශරීරයෙහි පවත්නාවූ; අද්‍රවම්, ද්‍රවරහිතවූ (දියගතිරහිතවූ;) මූර්තීම්, ආකාරවත්වූ (කාසිනාදිසපර්‍ශී විශෙෂ ඇත්තාවූ); අවිකාරජම්, (ධාතුවෛෂම්‍යාදි) විකාරයකින් හට නොගත්තාවූ (යමක් වේ නම් එය;) සවාඞ්ගං ස්‍යාත්, සවාඞ්ග නම් වන්නේය. තත්‍ර, ඒ ප්‍රාණියෙකු කෙරෙහි; දෘශ්‍යම්, (චක්ෂුර්ග්‍රාහියෙහි) දක්නාලද්දක්; අතඨං වෙත්, ඒ ප්‍රාණියෙකුකෙරෙහි නොපිහිටියේ නමුත්, හෙවත් අප්‍රාණියෙකුකෙරෙහි පිහිටියේ නමුත් (අද්‍රවාදිගුණ යුක්ත නම්) සවාඞ්ග

a පූර්‍වාඛ්‍ය ප්‍රත්‍යුදාහරණානි:- සුමුඛා ශාලා, අප්‍රාණිසඪ වාත්. සුසෙවද, ද්‍රවත්වාත්. සුඥනා, අමූර්තත්වාත්. සුශොපා, විකාරජත්වාත්.

වේ. තවත්, ඒ ප්‍රාණියෙකු කෙරෙහි පිහිටියක් මෙන්; තාදෘශි, ඒ ප්‍රාණියෙකු වැන්නෙකු කෙරෙහි; සපිතං ච, සිටියේද (අද්‍රවාදි ගුණ යුකතවූයේ) සවාඛය නම් වේ.

මෙහි 'සවාඛභාවා" යන සූත්‍රයෙන් සවාඛභාවවාචකශබ්දයා කෙරෙන් විකල්පයෙන් ඊප්ප්‍රත්‍යය වේයයි කීහු. සවාඛය නම් ප්‍රාණියෙකු පිළිබඳ අවයවයෝයි, එකල්හිදු අඛභාඛභිභාවසම්බන්ධයෙන් ඥනාදි අඛභයන් ද ඇතුළත්වනබැවින් තන්නිරූකරණය කොට මේ වක්‍ෂ්‍යමාණලක්‍ෂණවලින් යුත් අඛභ පමණක් සවාඛභයයි වෙන්කොට හැඟීම පිණිස "ප්‍රාණිසඪම්" යනාදිය කීහු. දිය ගතිරහිතවූ ද ආකාරසහිතවූ ද ශොඵාදිවිකාරයකින් හටනොගත්තාවූ ද සවෙතන ශරීරයෙක්හි පිහිටි යම් අවයවයක් වේනම් ඒ සවාඛය වේ යනු පූර්‍වාඛ්‍යයෙහි භාවයයි. මේ කීමෙන් ප්‍රාණිසඪ අවයව පමණක් සවාඛභවයට ඇතුළත්වන බැවින් උකතප්‍රකාර ලක්‍ෂණවලින්ද යුකත නම් අප්‍රාණිසඪ අවයව ද සවාඛභවයට ඇතුළත් කරගැණීම පිණිස උත්තරාඛ්‍ය කීඅනලදී. අප්‍රාණියෙකු කෙරෙහි පිහිටි අවයවයක් වුවත් පෙර ප්‍රාණියෙකු කෙරෙහි දක්නාලද්දේ නම් එයද, ප්‍රාණය නැති නුමුත් ප්‍රාණියෙකු වැනි යමක්කෙරෙහි ප්‍රාණියෙකුගේ අවයවයක් මෙන් යමක් පිහිටියේ නම් ඒද පූර්‍වොකතලක්‍ෂණවලින් ද යුකත නම් සවාඛය වේ යනු එහි භාවයයි. මෙකී ලක්‍ෂණවලින් යුත් අවයවවාචක ශබ්දයන් කෙරෙන් විකල්පයෙන් ඊප්ප්‍රත්‍යය වේ.

a පූර්‍වාඛ්‍ය, (ශ්ලොකයාගේ) පූර්‍වාඛ්‍යට; ප්‍රත්‍යුදාහරණානි, විරුබොදාහරණ කියනුලැබෙත්. සුමුඛා, යහපත් මුඛයක් (චාරයක්) ඇත්තාවූ; ශාලා, ශාලාවයි. අප්‍රාණිසඪවාත්, (මෙහි සවාඛභාවාවක මුඛය තමා) අප්‍රාණියෙකු කෙරෙහි පිහිටි බැවින් ඊප්ප්‍රත්‍යය නොවීය. සුසෙවද, ඉතා ඛනඇත්තියයි; ද්‍රවත්වාත්, (මෙහි සෙවදය තමා) ද්‍රවබැවින් ඊප්ප්‍රත්‍යය නොවීය. සුඥනා, යහපත් ඥනය ඇත්තිය; අමූර්තත්වාත්, (මෙහි ඥනය තමා) ආකාර රහිත බැවින් ඊප්ප්‍රත්‍ය නොවීය. සුශොපා, ඉතා ශොඵ ඇත්තිය; විකාරජත්වාත්, (මෙහි ශොඵය තමා) විකාරයෙන් උපන් බැවින් සවාඛය නොවේයයි ඊප්‍රත්‍යය නොවීය.

a උත්තරාඩ්ස්‍යෝදාහරණානි:-සුකෙශි-සුකෙශා වා රථ්‍යා, අප්‍රාණ්සථස්‍යාපි ප්‍රාණ්නි දෘශ්‍යත්වාත්. සුඝනි-සුඝනා වා ප්‍රතිමා, ප්‍රාණ්වත් ප්‍රාණ්සදෘශෙ සථිතත්වාත්.

b සවාඛ්‍යතෙපි වාශබ්දස්‍ය ව්‍යවසථිතත්වාත් ඔඝාදිෂු විකල්පඃ, වදනාදිෂු න වක්තව්‍යඃ, බිමෙබාඝි බිමෙබාඝා, වාරුකර්ණිඝි වාරුකර්ණී, සමදනති-සමදනතා, පදම් වදනා මෘගනයනා.

---

a උත්තරාඩ්ස්‍ය, උත්තරාඩියට; උදාහරණානි, උදාහරණ කියනු ලැබෙත්. සුකෙශි, ඔහපත් කෙස් ඇත්තිය; සුකෙශා වා, "සුකෙශා" කියා හෝ වේ. රථ්‍යා, පිටියයි. අප්‍රාණිසථස්‍ය අපි, (මෙහි කෙශය තමා) අප්‍රාණියෙකු කෙරෙහි පිහිටි නුවුත්; ප්‍රාණිනි, ප්‍රාණියකු කෙරෙහි; දෘශ්වත්වාත් (පෙර) දක්නාලද බැවින් ඊප්ප්‍රත්‍යය වීය. සුඝනි, යහපත් පයොධර යුග්මයක් ඇත්තීය; සුඝනා වා, විකල්පයෙන් "සුඝනා" කියා ද වේ. ප්‍රතිමා, ප්‍රතිමාවයි. ප්‍රාණිවත්, ප්‍රාණියෙකුගේ (අවයවයක්) මෙන්; ප්‍රාණිසදෘශෙ, ප්‍රාණියකු වැනි ප්‍රතිමාව කෙරෙහි; සථිතත්වාත්, පිහිටි බැවින් ඊප්ප්‍රත්‍යය ද වීය. (මෙහි "සුඛ්‍ඛා" යන තන්හි ඊප්ප්‍රත්‍යය නොව "සුකෙශි" යන තන්හි වූයේ කෙසේද යත්? 'සුකෙශි" යන තන්හි කෙශය මෙහි අප්‍රාණිසථ වුවත් ඒ කෙශය ප්‍රාණියෙකු කෙරෙහි දක්නා ලද බැවින් ඊප් ප්‍රත්‍යය වීය. "සුඛ්‍ඛා" යන තන්හි ශාලාව පිළිබඳ මුඛය ප්‍රාණි යෙකු කෙරෙහි දක්නා ලද්දක් නොවන බැවින් ඊප්ප්‍රත්‍යය නොවීය.

b සවාඛ්‍යතෙ අපි, (වක්‍ෂ්‍යමාණ ශබ්දයන්ගේ) සවාඛ්‍යභාවය ඇති කල්හිද; වාශබ්දස්‍ය, සූත්‍රොක්ත වාශබ්දය තමා; ව්‍යවසථි තත්වාත්, ව්‍යවසථාකරණලද බැවින්; ඔඝාදිෂු, ඔඝාශබ්දාදීන් විෂයෙහි; විකල්පඃ, (ඊප්ප්‍රත්‍යය) විකල්ප වේ. වදනාදිෂු වදන ශබ්දාදියෙහි; න වක්තව්‍යඃ, නොකිය යුතුයි. බිමෙබාඝි-බිමෙබාඝා, (මෙහි ඔඝාදිය බැවින්) ඊප්ප්‍රත්‍යය වූතන්හි "බිමෙබාඝි" යනුද විකල්පයෙන් නුවූතන්හි "බිමෙබාඝා" යනුද වේ. "වාරුකර්ණි-වාරුකර්ණී, සමදනති=සමදනතා" යන තන්හිද එසේයි. "පදම් වදනා, මෘගනයනා" යන තන්හි වදනශබ්දාදිය බැවින් ඊප්ප්‍රත්‍යය නොවේ. 'බිමෙබාඝි-බිමෙබාඝා" යනු බිඹුපල වැනිතොල් ඇති සත්‍රියයි; "වාරුකර්ණි-වාරුකර්ණී" යනු මනොඥ වූ කණ්වලය ඇති සත්‍රියයි. "සමදනති-සමදනතා" යනු සමවූදත් ඇති සත්‍රියයි.

a "නඛමුඛයොශ්ච සංඥායාං නෙප්" ශූර්පණඛා, ගෞරමුඛා. "නාසිකාශබ්දාත් කෙවලාච්චනෙප්" නාසිකා. "කෘදිකාරාද කෙනාදීච් වා වකතව්‍යඃ" අඞ්ගුලි අඞ්ගුලිඃ, බ්ලි-බ්ලිඃ, ආජි-ආජිඃ, අකෙනරිති විශෙෂණාත්නාදෘතිඃ, හූතිඃ.

253. එචච මනවාදෙඃ. (එත් 1, 1; ච 1, 1; මනවාදෙඃ 5, 1;)

b මඤාදෙර්ගණාත් සත්‍රියාම්ප්‍රත්‍යයෝ භවති එකාරාදෙශශ්ච. චකාරාත්මනොලඤ්ඨරෑ වා. ආදිශබ්දාත්මඤ්ඨගති වෘෂාකපි පූතක්‍රතූ කුශින කුශිද ග්‍රාහ්‍යඃ මනෝඥියා=මනාඥි මනාච්. අත්‍ර විකල්පෙන පක්ෂෙ මනුඃ. අගෙනෝඥියා=අගනාඥි. (පූනාඃ ක්‍රතවෝ යෂාඤ්ඤති පූනක්‍රතූඃ) පූනක්‍රතෝඥියා=පූනක්‍රතාඥි, ඉත්‍යාදි.

"පද්මවදනා" යනු පියුමක් වැනි මුහුන ඇති ස්ත්‍රියයි. 'මෘග නයනා" යනු මෘගයකුගේ වැනි ඇස් ඇති ස්ත්‍රියයි.)

a සංඥායාම්, සංඥාවාචකතන්හි; නඛමුඛයොඃ ච, "නඛමුඛ" ශබ්දදෙක සම්බන්ධව ද; නර්ප්, ඊප්ප්‍රත්‍යය නොවේ. ශූර්ණඛා, ("ශූර්ප ඉව නඛා යස්‍යාඃ සා" යන වාක්‍යයෙහි 'ශූර්ණඛා" යනු වේ. කුලුවැනි නිය ඇති එනම් රාවණභගිනියයි. ගෞරමුඛා ("ගෞරං මුඛං යස්‍යාඃ" සා යන වාක්‍යයෙහි) "ගෞරමුඛා" යනු වේ. ගෞර වණී මුඛ ඇති එනම් ස්ත්‍රියයි. කෙවලාත්. හුදකලා වූ; නාසිකාශබ්දාත්, නාසිකා ශබ්දයා කෙරෙන්; නර්ප්, ඊප්ප්‍රත්‍යය නොවේ. "නාසිකා" යනු ඊට උදාහරණයි. අකෙනඃ, කනිප්‍රත්‍ය යානන්‍ය තොරකොට ඇත්තාවූ; කෘදිකාරාත්, කෘදන්ත ඉකාරය කෙරෙන්; වා, විකල්පයෙන්; ඊප්, ඊප්ප්‍රත්‍යය; වකතව්‍යඃ, කියයුතුයි. "අඞ්ගුලි-අඞ්ගුලිඃ" යන තන්හි කෘදන්ත ඉකාරය බැවින් ඊප්ප්‍රත්‍යය වීමෙන් "අඞ්ගුලි" යනුද, විකල්පයෙන් "අඞ්ගුලිඃ" යනුද වේ. 'බ්ලි-බ්ලිඃ, ආජි-ආජිඃ" යන තන්හිද එසේයි. අකෙනඃ ඉති, කනිප්‍රත්‍යයානන්‍යා කෙරෙන් නොවේ යයි; විශෙෂණාත්, වෙන්කොට කීමෙන්; කෘතිඃ හූතිඃ, "කෘතිඃ හූතිඃ" යනුවේ. (මෙහි කනිප්‍රත්‍යයානන්ත කෘදන්ත බැවින් ඊප් ප්‍රත්‍යය නොවේ.)

2,3. මඤාදෙඃ, මනුශබ්දාදිගණයා කෙරෙන් (සත්‍රිඅර්ථයෙහි ඊප්ප්‍රත්‍යය වේ.) එත් ච, (ශබ්දාන්තයට) එකාරාදෙශ ද වේ.

b මඤාදෙර්ගණාත්, මඤාදිගණයා කෙරෙන්; සත්‍රියාම්, සත්‍රිඅර්ථයෙහි, ඊප්ප්‍රත්‍යයඃ භවති, ඊප්ප්‍රත්‍යය වේ. එකාරාදෙශශ්ච,

254. පතන්‍යාදයඃ. (පතන්‍යාදයඃ, 1, 3;)

a පතන්‍යාදයඃ ශබ්දා නිපාත්‍යන්තෙ, පාණිග්‍රහණකර්තෘ පතිඃ, තස්‍ය සත්‍රී පත්නී; භර්තෘයොගෙ එව, අන්‍යත්‍ර ගවාං පතිඃ සත්‍රී. සමානඃ පතිර්‍යස්‍යාඃ සා සපත්නී, භර්තෘයොගෙ එව; අනන්‍යඤ්ඤනී, අන්‍යත්‍ර අනඤ්ඤනී; පතිවතනී සහර්තෘකා; අන්‍යා පත්‍යන්තී. ඝඞි අභිරවි අඩ්ප්‍රරති ස්‍රුවති. ප්‍රථමං සුශ්‍රොණඃ ස්‍රුවති සශ්‍යා. සා ස්‍රාව්, උදිව්, නාශබඳස්‍ය ණිජ් ප්‍රත්‍යයඃ භවති, "ණිජි පරෙ නුඞ්ඛිඩිඛ්‍යාව්‍යා" ආදි.

එකාරාදෙශද වේ. වකාරාත්, වශබ්දග්‍රහණයෙන්; මතොඃ, මනු ශබ්දයාගේ; ටෙඃ විසංඥයට; වා, විකල්පයෙන්; ඕ, ඕකාරාදෙශ වේ. ආදිශබ්දාත්, ආදිශබ්දයෙන්; මත්‍ර. මනු ශබ්දය; අග්නි, අග්නි ශබ්දඃ, වෘෂාකපි, වෘෂාකපිශබ්දය; පුතක්‍රතු, පුතක්‍රතු ශබ්දය; කුසිත, කුසිත ශබ්දය; කුසිදඃ කුසිද ශබ්දය යන මොහු; ග්‍රාහ්‍යාඃ ගත යුතුයි. මතොඃ, මනුහුගේ; භාර්‍යා, භාර්‍යාතොමෝ; මනායි-මනාවි, "මනායි" යනුද "මනාවි" යනු ද වේ. අත්‍ර, මෙහි; විකල්පෙන, විකල්පයෙන්; පක්ෂෙ, පසෙක්හි; මත්‍රඃ, මනු නම් වේ. අග්නෙඃ, අග්නිගේ; භාර්‍යා, භාර්‍යාතොමෝ; අග්නායි, "අග්නායි" නම් වේ. පූතාඃ පවිත්‍රවූ; ක්‍රතවඃ යාගයෝ; යස්‍ය ඉති, යමකුගේ නුයි; පුතක්‍රතුඃ, පුතක්‍රතු නම් වේ. (ශක්‍රස්‍යායි. පුත්‍රක්‍රතොඃ, ශක්‍රයාගේ; භාර්‍යා, භාර්‍යාතොමෝ; පුතක්‍රතායි. පුතක්‍රතායි නම් වේ. ඉත්‍යාදි, මේ ආදිය වේ.

254. පතන්‍යාදයඃ, "පතනී" ශබ්දාදීහු නිපාතනය කරණු ලැබෙත්.

a පතන්‍යාදයඃ ශබ්දඃ, පත්නී ආදි ශබ්දයෝ; නිපාත්‍යන්තෙ, නිපාතනය කරණු ලැබෙත්. පාණිග්‍රහණකර්තෘ, හස්තග්‍රහණය කරන්නේ; පතිඃ, පති නම් වේ. තස්‍ය, ඔහුගේ; සත්‍රී, සත්‍රීතොමෝ; පත්නී, පත්නී නම් වේ. භර්තෘයොගෙ එව, සවාම්යොග යෙහි ම මෙසේ වේ. අන්‍යත්‍ර, අන්තග්හි; (එසේ නොවේ'එනම්):- ගවාම්, ගෙරින්ගේ; පතිඃ, සවාම්වූ; සත්‍රී, ස්ත්‍රීතොමෝ. (යන තන්හි භර්තෘයොග රහිත බැවින් "පති" කියා වේ. "පත්නී" කියා නොවේ). සමානඃ, සමානවූ; පතිඃ, සවාම්තෙම; යස්‍යාඃ, යම් සත්‍රියකගේ ද; සා, ඕතොමෝ; සපතනී, "සපත්නී" නම් වේ.

a දරශබ්ද නිත්‍යං බහුවචනානතඃ පුංලිඞ්ගඃ, දරඃ, දරෞ, දරාඃ, දරං, දරෞ, දරයෝඃ, දරේඃ, දරභ්‍යඃ, දරභ්‍යඃ, දරස්‍යඃ, දරයෝඃ, දරාණාම්, දරේෂු.

භතීඃයොගෙ එව, සවාම්‍යොඃඅයෙනි ම මෙසේ වේ. අනතජීත්නී, (''අනතගීඃභීඃසත්‍යසත්‍යඃ'') යන වාක්‍යයෙහි ''අනතජීතනී'' යනු වේ. (ගැබිණියයි) අන්‍යත්‍ර, අන්තන්හි; අනතජීතී, ''අනතජීතී'' යනු වේ. පතිවත්නී, (''පතිරස්‍යා අස්‍තී'' යන වාක්‍යයෙහි) 'පතිවතනී'' යනු වේ. සනතීඃකා, සවාම්‍යා සහිත සත්‍රියයි. අන්‍යා, අන්‍යවූවා හෙවත් සවාම්‍රහිතවූවා; පතිමතී, ''පතිමනී'' නම් වේ. සඛී, ''සඛි'' ශබ්දයා කෙරෙන් ඊප්ප්‍රත්‍යය නිපාතනය කොට ''සඛී'' යනු වේ. (යෙහෙලියයි); අශිෂ්‍යී, ''නවිද්‍යතෙ ශිශුයස්‍යඃ සා'' යන වාක්‍යයෙහි) ''ශිශු'' ශබ්දයාකෙරෙන් ඊප්ප්‍රත්‍යය නිපාතනය කොට ''අශිෂ්‍යී'' යනු වේ. (දරුවන් නැති සත්‍රියයි). අඞ්ජරතී, ('අඞ්ඃ ජරත් යස්‍යඃ සා'' යන වාක්‍යයෙහි) ''අඞ්ජරත්'' ශබ්දයා කෙරෙන් ඊප්ප්‍රත්‍යය නිපාතනය කොට ''අඞ්ජරතී'' යනු වේ. (අඩක් ජරාව ඇති සත්‍රියයි). යුවති ''යුවතී'' ශබ්දයාකෙරෙන් ඊප්ප්‍රත්‍යය නිපාතනය කොට ''යුවතී'' යනු වේ. (තරුණියයි). ප්‍රථමං, පළමුකොට; සූයස්‍යීඃ, සූයස්‍යීතෙම; යඃස්‍යාං, යම්දිශාවෙක්හි; අඤ්චති, ගමන්කෙරේද; සා, ඕතොමෝ; ප්‍රාචී, ''ප්‍රාචී'' නම් වේ. පෙරදිගයි. උදීචී, ''උදචති සූඥෙස්‍යාඃඅස්‍යාං සා'' යන වාක්‍යයෙහි ''උදඤ්චි'' ශබ්දයෙන් ඊප්ප්‍රත්‍යය නිපාතනය කොට ''උදීචී'' යනු වේ. (උතුරුදිගයි). නඃශබ්දඃඅස්‍ය, නඃශබ්දය සම්බන්ධව; ණීප්‍රත්‍යයඃ භවති, ණීප්‍රත්‍යය වේ. ණීඊ පරෙ, ණීප්‍රත්‍යය පර කල්හි; නුඃ, නඃශබ්දඃඅව; වෘඞ්ඃ, වෘඞ්ඃඅ; වාච්‍යා, කියයුතුයි. ''නාරී'' යනු ඊට උදාහරණයි (මෙහි ''පත්නී, සපත්නී'' යන දෙතන්හි ''පති'' ශබ්දයා කෙරෙන් ඊප්ප්‍රත්‍යය හා නුට් ආගම ද විසංඥලොපය ද නිපාතනයෙන් සිඛයි. ''අනතජීත්නී'' යන තන්හි අනතජීත් ශබ්දයාකෙරෙන් ඊප්ප්‍රත්‍යය හා නුට් ආගමයි. ''පතිවත්නී'' යන තන්හි ''පති' ශබ්දයා කෙරෙන් වත් ප්‍රත්‍යය නුට්ආගම ඊප්ප්‍රත්‍යය යන තුණම නිපාතනයෙන් සිඛයි. මෙකී නිපාතනයෙන් සිඛවූ තවත් බොහෝ නාම දක්නා ලැබෙත්. එනම් ''භාජී, ගොණී, නාගී, සඵලී, කුණ්ඩී, කාලී, කුශී, කාමුකී, ඝටී, කවරී, නීලී'' යනාදියයි.

a දරශබ්දඃ, දරශබ්දයතෙම; නිත්‍යං, සතතයෙන්; බහුවචනානතඃ, බහුවචනානතයි; පුංලිඞ්ගඃ, පුංලිඟු වේ. ''දරඃ – දරෞ'' යනු පිළිවෙළින් ප්‍රථමාදි බහුවචනයයි. (මේ ''දර'' ශබ්දය අර්ධ

255. වෛර්ගුණාත්. [ඕ 1, 1; ඕඃ 5; 1, ගුණාත් 5; 1;]

a. උකාරාන්තාද්ගුණවාචිනෝ වා සත්‍රියාමිප් ප්‍රත්‍යයෝ භවති. පට්වී-පටුඃ, මෘදී-මෘද්වීඃ, තනූී-තනුඃ, "ඛරුසංයෝගොපධාත්" ඛරුඃ, පාණ්ඩුඃ.

වශයෙන් සත්‍රී වාචක වූවත් ශබ්දරූප වශයෙන් පුංලිඞ්ග අකාරාන්ත ශබ්දයක් මෙන් ව්‍යවහාර වේ. හෙද බහුත්වයෙහි පමණක් වේ.

255. ගුණාත්, ගුණවාචකවූ; ඕඃ, උකාරාන්තයාකෙරෙන්; වා, විකල්පයෙන්; ඊප්ප්‍රත්‍යය වේ.

a ගුණවාචිනඃ, ගුණවාචිවූ; උකාරාන්තාත්, උකාරාන්තයා කෙරෙන්; සත්‍රියාම්, සත්‍රිඅර්ථයෙහි; වා, විකල්පයෙන්; ඊප් ප්‍රත්‍යයඃ භවති, ඊප්ප්‍රත්‍යය වේ. පට්වී-පටුඃ, පටු ශබ්දයාකෙරෙන් ඊප්ප්‍රත්‍යය වූතන්හි "පට්වී" යනු ද, විකල්පයෙන් නුවතන්හි "පටු" යනු ද වේ. "මෘදී මෘද්වඃ, තනූී-තනුඃ" යන තන්හි "මෘදු, තනු" ශබ්දඤ්ඤයෙන් විකල්පයෙන් ඊප්ප්‍රත්‍යයයි ඛරුසංයොගොපධාත්, ඛරු ශබ්දයාකෙරෙන් හා සංයොගයක් උපධාසංඥ නොට ඇත්තහු කෙරෙන්; න, ඊප්ප්‍රත්‍යය නොවේ. "ඛරුඃ පාණ්ඩුඃ" යනු ඊට උදාහරණයි. (මෙහි "පාණ්ඩු" ශබ්දයාගේ උපධාසංඥය සංයොග සහිත බැවින් ඊප්ප්‍රත්‍යය නොවේ.) මේහි කී ගුණවාචක ශබ්දයන්ගේ ලක්ෂණ දක්වන්නාවූ වෛයාකරණයෝ:-

"සතෙව නිවිශතෙපෙති පෘථග්ජාතිෂු දෘශ්‍යතෙ,
ආධෙයශ්‍රයා ක්‍රියාජශ්‍රව සොසත්ත්වප්‍රකෘතිර්ගුණඃ"

යනු කීහු. යමක් ද්‍රව්‍යාශ්‍රවයට පැමිණ නැවත ඉන් පහවේ ද එසේම අන්‍යද්‍රව්‍යයන්හි දකිනුත් ලැබේ ද, ඒ ගුණ නම් වේ. මේසේ ගත්කල මෙකී ද්‍රව්‍යාශ්‍රයාපගමවයෙන් හා පෘථග්ද්‍රව්‍යයන්හි දැක්මෙන් ගමන පවනාදිකමීදගුණභාවයට පැමිණිය හැකිවෙත්. එබැවින් තනූනිවාරණය පිණිස යමක් උත්පාද්‍ය හෝ අක්‍රියාජන්‍ය (ඇතැම් දෙයක් අනිත්‍ය කෝ ඇතැම් දෙයක් නිත්‍ය) වේ නම් එපමණක් ගුණයයි කියනලදී. එනම්, පඤ්චකාදී ද්‍රව්‍යාශ්‍රිත රූපාදිය උත්පාද්‍යභවයෙන් අනිත්‍යගුණයි. ආකාශාදිය පිළිබඳ මහත්ත්වාදිය ක්‍රියාජන්‍ය නොවන බැවින් නිත්‍යගුණයි. ගම්‍ය

256. උත ඌඃ. (උතඃ 5, 1; ඌඃ 1, 1;)

a උකාරාන්තාන්නාම ඌප්‍රත්‍යයෝ භවති, පඬ්ගුඃ-පඬ්ගුඃ, වාමෝරුඃ වාමෝරුඃ, වාශබ්දද්‍රජ්ජ්වාදෞ නාන්‍යවති, රජ්ජුඃ, ධෙනුඃ.

පවනාදිකමීය වනාහි ද්‍රව්‍යාශ්‍රයත්වාදියෙන් යුක්තවුවත් සියලු හන්හි ම අනිත්‍යත්වයෙන් ම පවත්නා බැවින් ගුණවාචකත්වයට නො පැමිණේ. තවද අවයවිද්‍රව්‍යය අවයවයෙහි ඇතුළත්වන නිසාත් අවයවවිනාශයෙන් ඒ අවයවිද්‍රව්‍යය ඉන් පහව යන නිසාත් ඒ සවභාවය නොයෙක් ද්‍රව්‍යයන්හි දෘශ්‍යමාන නිසාත් ඒ ද්‍රව්‍යයන් ඇතැම් දෙයක් අනිත්‍යත්වයෙන් හා ඇතැම් දෙයක් නිත්‍යත්වයෙන් ද පවත්නා නිසාත් ද්‍රව්‍යය ද ගුණත්වයට පැමිණෙන බැවින් තන්නිවාරණය පිණිස යථොක්ත ලක්ෂණවලින් යුක්තව ද්‍රව්‍ය හි ඇතුවූයේ නම් ගුණයයි කියනලදී.

257. උතඃ, උකාරාන්තයාකෙරෙන්; ඌඃ, (විකල්පයෙන්) ඌ ප්‍රත්‍යය වේ.

a උකාරාන්තාත්, උකාරාන්තයාකෙරෙන්; වා, විකල්පයෙන්; ඌප්‍රත්‍යයඃ භවති, ඌප්‍රත්‍යය වේ. පඬ්ගුඃ-පඬ්ගුඃ, ඌප්‍රත්‍යය වීමෙන් "පඬ්ගුඃ" යනුද විකල්පයෙන් ඒ නොව "පඬ්ගුඃ" යනුද වේ; "වාමෝරුඃ-වාමෝරුඃ" යන තන්හිද එසේයි. වා ශබ්දයත්, වාශබ්දයෙන්; රජ්ජ්වාදෞ, "රජ්ජු" ශබ්දාදියෙහි; නභවති, නොවේ. "රජ්ජුඃ, ධෙනුඃ" යනු ඊට උදාහරණයි.

මේ සූත්‍රය මෙහි අවිස්තාරත්වයෙන් නිර්දිෂ්ටයි. මෙය සවිස්තාරත්වයෙන් දක්වන්නාවූ මුඞ්ඛබොධාචාර්‍යයෝ "උකොයුඞ්රජ්ජ්වාදෙර්නුප්‍රාණිජාතෙරුප්"යි සූත්‍රය රචනාකොට යකාරය උඞ් (උපධා) සංඥකොට ඇති ශබ්ද ද රජ්ජුශබ්දාදිය ද තොරකොට ඇත්තාවූ මනුෂ්‍යජාතිවාචක ශබ්දයාකෙරෙන් හා අප්‍රාණී ජාතිවාචක ශබ්දයා කෙරෙන් සත්‍රීඅර්‍ථයෙහි ඌප්‍රත්‍යය වේ යයි කීහු. එහි මනුෂ්‍යජාතිවාචකයා කෙරෙන් ඌප්‍රත්‍යයට "කුරුඃ" යනු ද, අප්‍රාණීජාතිවාචකයාකෙරෙන් ඌප්‍රත්‍යයට "කර්කීඞ්ගුඃ" යනු ද උදාහරණ කරණලදී. 'අඩයඞ්ගුඃ" යන තන්හියකාරය උඞ් (උපධා) සංඥ බැවින් නොවේයයි ද "රජ්ජුඃ, හනුඃ' යනාදියෙහි "රජ්ජු" ශබ්දාදිය බැවින් නොවේයයි ද කියනලදී. පසුව "වාම්

257. යූනස්තිෘ. (යූනඃ 5, 1; තිඃ 1, 2,)

a යුවන්ශබ්දාත් සත්‍රියාං තිප්‍රත්‍යයෝ භවති; සුවතිඃ, එභ්‍යෝ නාම්භ්‍යාත් සෘදශඃ, ආබන්තාන්න ''ආපඃ'' (ප්‍ර. සූ.) ඉති, ඊබන්තාත් ''හශෂපඃ ශෙලෝපඃ'' (ප්‍ර. සූ.) ඉති ශිලෝපඃ.

ඉති සත්‍රීප්‍රත්‍යයප්‍රක්‍රියා.

ලක්ෂණශඵඝසහිතසංඥිතොපමානාදූරොඃ'' යන සූත්‍රයෙන් 'වාම ලක්ෂණ ශඵ සහ සහිත සංඥිත' ශබ්දයන් කෙරෙන් හා උපමාන වාචකශබ්දයන් කෙරෙන් ද පර ''උඞරු'' ශබ්දයාකෙරෙන් උඞප් ප්‍රත්‍යය වේයයි කියා ''වාමොරූඃ, රමෙහොරූඃ''යි උදාහරණ කරණ ලදී. නැවත ''තන්වාදෙර්ඞ්'' යන සූත්‍රයෙන් ''තනු'' ශබ්දයෙහි විකල්පයෙන් වේයයි කියා ''තනූඃ-තනුඃ'' යනාදිය උදාහරණ කරණලදී. එහි ටීකාවෙහි තනුශබ්දයෙහි ''තනු, වඤ්චු, රෑරු, ඝීරු, කඬු, පඬු, ප්‍රීඬු, ගණ්ඩු, කුහු, සරයු'' යන මොහු ඇතුළත් කරණ ලද්දාහ. සිඩාන්තකෞමුදියෙහි ''පඬොශව' යන සූත්‍රයෙන් ''පඬු'' ශබ්දයා කෙරෙන් ද අවිකල්පයෙන් උඞප්ප්‍රත්‍යය වන බැවි කිහු; මුග්ධබොධටීකාවෙහි එහි ද විකල්පයෙන් වන බැවි කිහු.

257. යූනඃ, යුවන්ශබ්දයාකෙරෙන්; තිඃ, තිප්‍රත්‍යය වේ.

a යුවන්ශබ්දාත්, යුවන්ශබ්දයාකෙරෙන්; සත්‍රියාම්, සත්‍රිඅර්‍ථයෙහි; තිප්‍රත්‍යයඃ භවති, තිප්‍රත්‍යය වේ; 'යුවතිඃ'' යනු ර්‍ථව උදාහරණයි. එභ්‍යඃ, මේ (සත්‍රීප්‍රත්‍යයානන්තවූ) ශබ්දයන් කෙරෙන්; නාම්භ්‍යාත්, නාම බැඳින්; සෘදශඃ, සිආද්‍ය විභක්ති වෙත්. ආබන්තාත්, ආප්ප්‍රත්‍යයාන්තයා කෙරෙන්; ' ආපඃ'' ඉති, ''ආපඃ'' යන සූත්‍රයෙන් ද, ඊබන්තාත්, ඊප්ප්‍රත්‍යයාන්තයා කෙරෙන්; හශෂපඃ ශෙලෝපඃ ඉති, ''හශෂපඃ ශෙලෝපඃ'' යන සූත්‍රයෙන් ද; ශිලෝපඃ, ශිඹිහකතිලෝපය වේ. සත්‍රීප්‍රත්‍යය ප්‍රක්‍රියා, සත්‍රීප්‍රත්‍යයප්‍රක්‍රියාඃ; ඉති, මෙතෙකින් සමාප්තයි.

සත්‍රීප්‍රත්‍යයප්‍රක්‍රියාවිව්‍යාඛ්‍යාව.

විභක්ත්‍යර්ථප්‍රක්‍රියාර්ථව්‍යඛ්‍යාව.

a අථ විභක්ත්‍යර්ථා නිරූපණෙ, ක්‍රියාසිද්ධ්‍යුපකාරකං කාරකම්, තච්ච ෂඩ්විධම්.

b "කර්තා කර්ම ච කරණං සම්ප්‍රදානං තථෛව ච,
අපාදානාධිකරණ මිත්‍යාහුඃ කාරකාණි ෂට්.

c එකතානුක්තතයා මෙධා කාරකාණි භවන්ති ෂට්,
එකෙන තු ප්‍රථමෛව ස්‍යාදනුක්තෙන තු යථාක්‍රමම්,

d තානි විභක්තිර්ත්‍යහිධියතෙන.

විභක්තිරූපනිරූපණයෙන් අනතුරුව ඒ ඒ ප්‍රත්‍යයභෙදයෙන් නිපන් සත්‍රිලිඞ්ගවිශෙෂ දක්වා ඉක්බිති ඒ ඒ විභක්තීන්ගේ අර්ථ භෙද දක්වන්නාහු ' අථ විභක්ත්‍යර්ථාඃ" යනාදිය කිහු.

a අථ, සත්‍රිප්‍රත්‍යයට අනතුරුව; විභක්ත්‍යර්ථාඃ, (කර්තෘකර්මාදිය පවසන) ප්‍රථමාදි විභක්තීන්ගේ අර්ථසමූහය; නිරූප්‍යතෙ, ප්‍රකාශ කරණු ලැබේ. ක්‍රියාසිද්ධ පකාරකම්, ක්‍රියාසිද්ධියට උපකාරවන්නේ; කාරකම්, කාරක නම් වේ තත් ව, භෙද; ෂඩ්විධම්, සවැදෑරුම්වේ. (එනම්):—

b කර්තා, (ධාත්වර්ථය සිද්ධකරන්නාවූ) කර්තෘ ද; කර්ම ව, (ධාත්වර්ථය ව්‍යාප්තවන්නාවූ) කර්මය ද; කරණම්, (ධාත්වර්ථයට ඉවහල්වූ) කරණය ද; සම්ප්‍රදානම්, (ධාත්වර්ථය පිළිගැණීමට සුදුසුවූ) සම්ප්‍රදානය ද; අපාදානාධි කරණම් ඉති, (ධාත්වර්ථය පැවැත්මට ඉමවූ) අපාදානය හා (ධාත්වර්ථයට පිහිටවූ) අධිකරණය ද යන: ෂට්, මේ සය; කාරකාණි ආහුඃ, කාරකයයි කියත්.

c කාරකාණි ෂට්, මෙකී කාරක සය, උක්තානුක්තතයා, උක්තභාවයෙන් හා අනුක්තභාවයෙන්; භවන්ති, දෙපරිදි වෙත්. උක්තෙ තු, උක්තවූ තන්හි වනාහි; ප්‍රථමා එව ස්‍යාත්, ප්‍රථමාවිභක්තිය ම වන්නේය. අනුක්තෙ තු, අනුක්තකල්හි; යථාක්‍රමම්, පිළිවෙළින් (තෘතීයාදිහු) වෙත්. (මේ උක්තානුක්තභෙදය වක්‍ෂ්‍යමාණවූ "අන්‍යොක්තෙ ප්‍රථමා" යන සූත්‍රවිවරණයෙහි පවසන්නෙමු).

d තානි, ඒ කාරකයෝ; විභක්තීඃ ඉති, විභක්තියයි; අභිධියතෙතර, ප්‍රකාශකරණු ලැබෙත්.

258 ලිඞ්ගාත්ථේ ප්‍රථමා. (ලිඞ්ගාත්ථේ 7, 1; ප්‍රථමා 1, 1;)

a ධාතුප්‍රත්‍යයාතිරික්තනාමස්ථවචනබෝධකරූපං ලිඞ්ගං, තස්යෙව වාත්ථේ සනමාත්‍රේ ප්‍රථමා විභක්තිර්භවති. සකලකාරක භෙදශූන්‍යං වස්තු සත්තා. "ලිඞ්ගාත්ථේ ප්‍රථමා" එතස්‍ය සූත්‍ර ස්‍යෝදාහරණාත්, උවෙවඃ නීවෙවිත්‍යාදීනි, ල්ඞ්ඛාද යොපි ප්‍රථමාර්ථා ඉති සොචිත්; ආදිශබ්දාල්ලිඞ්ගවචනපරි මාණමාත්‍රේපි ප්‍රථමා-ඣාඃඣණඃ, ග්‍රීඃ, ඤුනම්; වචනෙ-එකඃ, බෞ, බහවඃ; පරිමාණෙ-ද්‍රොණඃ, ඛාරි, ආඪකම්.

මෙහි විභක්ත්‍යර්ථනිරූපණය කිරීමට පටන්ගෙණ විභක්ත්‍යර්ථ නම් (ප්‍රධාන වශයෙන්) කාරකාර්ථයයි දක්වන්නාහු පළමුකොට "කාරක" යන්නෙහි තත්‍ත්වාර්ථය දක්වමින් ක්‍රියා සිද්ධියට උප කාරය යන අර්ථයෙන් කාරකයයි ද ඒ කාරක කර්ත්‍රාදි වශයෙන් සයක්යයි ද, තත්කාරකාර්ථ උකතවූ කල්හි (ප්‍රත්‍යයාදියකින් කථිත කල්හි) ප්‍රථමාවිභක්තිය සෙවනය කෙරෙත් යයි ද උක්ත නු වූ කල්හි කර්ත්‍රර්ථයෙහි තෘතීයා විභක්තිය ද, කර්මාර්ථයෙහි ද්විතීයාව ද යනාදීන් ඒ ඒ විභක්ති සෙවනය කෙරෙත්යයි ද කිහු. මෙහි ක්‍රියා සිද්ධියට උපකාරාර්ථයෙන් කාරකයයි කිමෙන් සම්බන්ධය කාරකත්වයට අන්තර්ගත නොවේ. කුමක් හෙයින්දයත්? සම්බන්ධ යාගේ ක්‍රියාසිද්ධ්‍යුපකාරශක්තියක් නැති හෙයිනි, සියලු ක්‍රියාවෝම කර්තෘකර්මාදිකාරකයක් අපෙක්ෂාකොට පවතින්. සම්බන්ධය වනාහි එබදු අපෙක්ෂාවක් නොකෙරේ. "කාරුකෙණ කටඃ ක්‍රියතෙ" යන මෙහි "ක්‍රියතෙ" යන ක්‍රියාව "කාරුකෙණ" යන කර්ත්‍රර්ථයාගේ ද "කටඃ" යන කර්මාර්ථයාගේ ද උපකාරයෙන් තදපෙක්ෂකව සිද්ධ වූයේ වේ. අන්‍ය වූ කරණාදිකාරකයන්ගේ අපෙක්ෂාවෙන් ක්‍රියා වන්ගේ සිද්ධිය ද මෙසේ යි. "ස රාඥඃ පුරුෂෝ භවති" යන මෙහි "භවති" යන ක්‍රියාවගේ සිද්ධියට "පුරුෂඃ" යන කර්තෘපදය උපකාර වේ. "රාඥඃ" යන සම්බන්ධයෙන් වනාහි "පුරුෂඃ" යන්නෙහි වෙන සක් මුත් ඉන් ක්‍රියාසිද්ධියට උපකාරයක් නොවේ. මෙහි සම්බන්ධය කාරකයෙන් තොරවූවත් විභක්ත්‍යර්ථනිරූපණයෙහි ලා සම්බන්ධ ර්ථවිභාගය ද නිරූපණය කරණු ලැබේ, මෙහි පළමුකොට ප්‍රථමාර්ථ නිරූපණය කරන්නාහු "ලිඞ්ගාත්ථේ ප්‍රථමා" යනාදිය කිහු.

258. ලිඞ්ගාත්ථේ, ලිඞ්ගාර්ථයෙහි; ප්‍රථමා, ප්‍රථමාවිභක්තිය වේ.

a. ධාතුප්‍රත්‍යයාතිරික්තම්, ධාතුවෙන් හා ප්‍රත්‍යයෙන් තොරවූ; නොකොත් ධාතුප්‍රත්‍යය දෙකට වැඩිවූ; අර්ථවත්, අර්ථයෙන්

a * "අෂ්ටමුෂ්ටි භවෙත් කිඤ්චි කිඤ්චිදූනෝ ව පුෂ්කලම්,
පුෂ්කලානි ච චත්වාරි ආඪකං පරිකීර්තිතම්.
චතුර්භිරාඪකෛර්ද්‍රෝණඃ ඛාරි ෂොඩශභිඃ ස්මෘතඃ"

b තත් සත් බ්‍රහම.

යුක්තවූ; ශබ්දරූපම්, ශබ්දසවරූපය; ලිඞ්ගම්, ලිඞ්ග නම් වේ. තස්‍ය එව, ඒ ලිඞ්ගයාගේ ම; අර්‍ථෝ, අභිධෙයාර්‍ථයවූ; සන්මාත්‍රෙ, විද්‍යමාන (සවභාව) මාත්‍රය වාව්‍යකල්හි; ප්‍රථමාවිභක්තිඃ භවති, ප්‍රථමා විභක්තිය වේ. සකලකාරකභෙදශූන්‍යම්, සියලු කාරක විශෙෂයන්ගෙන් ශූන්‍ය වූ; වසතු, වසතුව; සත්තා, සත්තා (විද්‍යමාන සවභාව) නම් වේ. ලිඞ්ගාර්‍ථෝ ප්‍රථමා, "ලිඞ්ගාර්‍ථෝ ප්‍රථමා" යන; එතස්‍ය සූත්‍රස්‍ය, මේ සූත්‍රයට; ඉමානි උදාහරණානි, මේ උදාහරණ වෙත්. (එනම්):-උච්චෛඃ නීචෛඃ ඉත්‍යාදීනි, "උච්චෛඃ නීචෛඃ" යනාදීහුයි. ලිඞ්ගාදයඃ අපි, ලිඞ්ගාදිහුද; ප්‍රථමර්‍ථාඃ ඉති, ප්‍රථමාව අර්‍ථකොට ඇත්තාහුයයි; කෙවිත්, සමඟරු (පාණිනීන්‍යාදීහු) කියත්. ආදි ශබ්දයන්, "ලිඞ්ගාදයඃ" යන්නෙහි ආදිශබ්දයෙන්; ලිඞ්ගවචනපරිමාණමාත්‍රෙ අපි, ලිඞ්ගමාත්‍ර වචනමාත්‍ර පරිමාණමාත්‍ර යන මෙහිද; ප්‍රථමා, ප්‍රථමා විභක්තිය වේ. "කෘෂ්ණඃ ශ්‍රීඃ ෂුතම්" යනු ලිඞ්ගමාත්‍ර ප්‍රථමාවට උදාහරණයි. වචනෙ, වචන මාත්‍රයෙහි ප්‍රථමාවට උදාහරණ නම්; එකඃ වෛ බහවඃ, 'එකඃ වෛ බහවඃ" යනු වේ. පරිමාණෙ, පරිමාණමාත්‍රයෙහි ප්‍රථමාවට උදාහරණ නම්; ද්‍රොණඃ ඛාරි ආඪකම්, "ද්‍රොණඃ ඛාරි ආඪකම්" යනු වේ

a අෂ්ටමුෂ්ටි, අටමිටක්, කිඤ්චිත් භවෙත්, කිඤ්චිත් නම් වන්නේය; පුෂ්කලානි චත්වාරි ච, පුෂ්කල සතරක්; ආඪකං පරිකීර්තිතම්, ආඪකයයි ප්‍රකාශ කරණලදී. චතුර්භිඃ ආඪකෛඃ, ආඪක සතර කින්; ද්‍රොණඃ, ද්‍රොණයක් වේ. තෛඃ ෂොඩශභිඃ ච, ඒ ද්‍රොණ සොළසකින්; ඛාරි, ඛාරියක් වේ. (මෙහි කී 'අෂ්ටමුෂ්ටි" යනාදි යද පරිමාණවාචකලිඞ්ගාර්‍ථ ප්‍රථමාවට උදාහරණයි).

b තත්, ප්‍රසිඩවූ; නොහොත් ඥානදෘෂ්ටිගොවරවූ; සත්, විද්‍යමානවූ; නොහොත් අවිනාශි වූ හෝ ප්‍රධාන වූ; බ්‍රහම, පරබ්‍රහම තෙමේයි. (මේ "තත් සත් බ්‍රහම" යන පදත්‍රයද නපුංසකලිඞ්ගාර්‍ථ ප්‍රථමාවට උදාහරණයි). ‡

---

* මෙය බොහෝ පොත්වල දක්නා නොලැබේ.

† ඇතැම් ටීකාවන්හි "සත්, බ්‍රහම" යන දෙනන්හි ලිඞ්ගාර්‍ථ ප්‍රථමාවයයි ද "තත්" යනු ඊට විශෙෂණයයි ද, සමහර තන්හි "බ්‍රහම" යනු ලිඞ්ගාර්‍ථ ප්‍රථමා යයිද "තත්, සත්" යන දෙක ඊට විශෙෂණයයිද කියත්.

මෙහි කී "ලිඞ්ගාදෝ ප්‍රථමා" යන සූත්‍රයෙහි "ලිඞ්ගාදෝ" යන්න ඇතැම් වෛයාකරණයෝ "ලිඞ්ගස්‍ය අදීඃ=ලිඞ්ගාදීඃ" කියා ද, සමහරු "ලිඞ්ගඤ්ච අදීශ්ච තයෝඃ සමාහාරඃ=ලිඞ්ගාදීං" කියා ද වාක්‍යයොජනාව කෙරෙත්. එහි ප්‍රථමවාක්‍යයෙන් ලිඞ්ග යාගේ අදීයෙහි කියාද, අතිකෙන් ලිඞ්ගමාත්‍රයෙහි හා අදීමාත්‍ර යෙහි කියාද අදී ගතයුතු වෙත්. "ලිඞ්ග" යන්නෙහි නිර්වචන දක් වන්නාහු "ලිඞ්ග්‍යතෙනෙති විග්‍රහ්‍යතෙනෙති ඥ්‍යතෙනෙති පුංස්ත්‍රීනපුංසක තයා ශබ්දා අනෙනෙති ලිඞ්ගම්" යනු කීහු. මෙයින් ශබ්දයෝ පුංස්ත්‍රීනපුංසකසවභාවයෙන් ලකුණු කරණු ලැබෙන්නුයි දන්නා ලැබෙන්නුයි ලිඞ්ග නම් යනු එහි අදීයි. කෙවල ධාතුවට හා ප්‍රත්‍යයට අධිකාව ඒ දෙදෙනාගේ සඞ්ගතියෙන් පුංස්ත්‍රීනපුංසක සවභාවයෙන් සිඛවූ ශබ්ද ලිඞ්ගයෝයි. එහි කම්‍යාදි අදීාන්තර විරහිත සවාදීමාත්‍රය ලිඞ්ගාදීයි. "නාපදං ශාස්ත්‍ර ප්‍රයුජ්‍යත" යන න්‍යායයෙන් පදනුවූවක් ශාස්ත්‍රයෙහි නොයොදන්නේ යයි කී බැවින් ඒ ලිඞ්ගය පදබවට පමුණුවා ශාස්ත්‍රයෙහි යොදා තදදීමාත්‍රය ප්‍රකාශකිරීම පිණිස ව්‍යවහෘතවූ ප්‍රථමාව ලිඞ්ගාදී යෙහි ප්‍රථමාවයි. සිඛානතකෞමුදියෙහි "ප්‍රාතිපදිකාදීලිඞ්ගපරි මාණවචනමාත්‍රෙ ප්‍රථමා"ඔි සූත්‍රය හදුරා ප්‍රාතිපදිකාදීමාත්‍රය ලිඞ්ගමාත්‍රය පරිමාණමාත්‍රය වචනමාත්‍රය යන මෙහි ප්‍රථමාව වේ යයි ප්‍රකාශිතයි. මෙහි ප්‍රාතිපදිකාදීග්‍රහණය "සවර් පුනර් උවෙචඃ නීවෙඃ" යනාදි අලිඞ්ගයන් කෙරෙන් ද ප්‍රථමාවිභක්තිය වීම පිණිසයි.

යම්කලෙක්හි මෙකී ලිඞ්ගය කතීෘකම්මාදි අර්ථවිශෙෂයකින් යුක්තවුවොත් එකල්හි තල්ලිඞ්ගාදීතිරොහාවයෙන් විද්‍යමාන සවභාවය වෙනස් වේ. මෙකී ප්‍රථමාවෙන් එබදු වෙනසක් නොවන බැවින් මීට අවිශිෂ්ට පදාර්ථයයි ද ඇතැම් වෛයාකරණයෝ කියත්. මෙසේ අවිශිෂ්ට පදාර්ථසඞ්ඛ්‍යාත ලිඞ්ගාදීාදියෙහි ද වක්ෂ්‍ය මාණවූ "ආමන්ත්‍රණෙ ච" යන සූත්‍රයෙන් ආමන්ත්‍රණාදීයෙහි ද "අන්‍යෙභ්‍යොතෙත ප්‍රථමා" යන සූත්‍රයෙන් උක්තාදීයෙහි ද ප්‍රථමා විභක්තිය වේ.*

* ඇතැම්හු මේ ප්‍රථමාවිභක්තිය ලිඞ්ගාදීයෙහි පමණක් වේයයි ද, ඇතැම්හු ලිඞ්ගාදී උකතාදී යන දෙක්හිම වේයයි ද කියත්.

ශ්‍රීවොපදෙවාචාර්‍යයන් විසින් මේ ප්‍රථමාවිභක්තිය සඳහා "ල්‍යන්ත සම්බුබ්‍යුකතාසෙ ප්‍රථ" ඔි සූත්‍රය හදුරා ලිඞ්ගාදී සම්බොධනාදී උකතාවි යන

a * රවිරිව රාජතෙ රාජ රොෂානකුමාරි රොරුයතෙ,
බොභුජ්‍යතෙ භුවං භූපාලඃ ප්‍රාහාෂානාං රාමලක්ෂ්මණෞ.

---

a. රාජ, රජතෙම; රවිඃ ඉව, හිරු මෙන්; රාජතෙ, බබලයි, කුමාරී, කුමාරිතොමෝ; රොෂාත්, ක්‍රොධයෙන්; රොරුයතෙ, අතිශයින් හඬයි. භූපාලඃ, රජතෙම; භුවම්, පෘථුවිය; බොභුජ්‍යතෙ, අතිශයින් පාලනය කෙරේ. රාමලක්ෂ්මණෞ, රාම ලක්ෂ්මණ

අර්ථයෙහි ප්‍රථමාවිභක්තිය වේයයි කියන ලදි. සමහරු මේ ලිඞ්ගාර්ථ උක්තා ඒවය එකක්කොට සලකාත්යයි සිතාම තථෛකාෂවහි "නහි ක්‍රියාරහිතං වාක්‍යමස්තීති න්‍යායාත් සර්ෂත්‍රෙව ක්‍රියාඛ්‍යාහාරෙණ උක්තාර්ථවාත් ප්‍රථමා ප්‍රාප්නොෂි කර්ෂ්‍යාදිග්‍රහණමිති" යන්නෙන් ක්‍රියා රහිත වාක්‍යයක් නොමැත් තේය යන න්‍යායයෙන් සෑම තන්හිම ක්‍රියාඛ්‍යාහාරයෙන් උක්ත සවභාව යෙන් ප්‍රථමාර්ථයේ පැමිණීම ඇති කල්හි ග්‍රහණය (ලිඞ්ගාර්ථයෙහි ප්‍රථමාව වේයයි ගැණීම) කුමකටදැයි චොදනාකොට තත්පරිහාරවශයෙන් "යත්‍ර අසමාපකක්‍රියාපදං කර්ත්‍රාදි පදයුක්තං තත්‍රෙව ක්‍රියාඛ්‍යාහාරඃ, යත්‍ර තු කෙවලා රූඪශබ්දඃ ප්‍රයුජ්‍යතෙ තත්‍ර තන්‍යාය්‍යාවසරෝ නාස්තීති" යනු කියන ලදී. යම් තැනක වාක්‍ය සමාප්තිය නොකරන්නා වූ ක්‍රියාපදයක් කර්ත්‍රාදිපදයක් හා යුක්ත වේ නම් එහිම (අවශ්‍යයෙන්) ක්‍රියාඛ්‍යාහාරය වේ. යම් තැනක කෙවල රූඪශබ්දයක් යොදනු ලැබේ නම් එහි ඒ න්‍යාය ආවශ්‍යක නොවේ යනු එහි අර්ථයි. මෙයින් ප්‍රකාශිතවූයේ ක්‍රියානපෙක්ෂක කෙවල රූඪශබ්දයන්හි ලිඞ්ගාර්ථප්‍රථමාව ද ක්‍රියාපෙක්ෂකතන්හි උක්තාර්ථප්‍රථමාවද වන බවයි.

ලඝුභාෂ්‍යව්‍යාඛ්‍යාවෙහිද "ලිඞ්ගාර්ථෙ ප්‍රථමා" යන සූත්‍රවිවරණයෙහි "ඝවර්—අත්‍රෙතවාසි, චිනිඃ, කුලම්" යනාදීන් උදාහරණ කොට "නනු චිනි රිත්‍යාදාවස්තීත්‍යඛ්‍යාහාර්‍ය්‍ය තෙ නාන්‍යෙෂාක්තෙ ඉති සිඞ්ඝා ප්‍රථමා කිමත්‍රෙත" යනුවෙන් "චිනිඃ" යනාදියෙහි "අසති" යනු අඛ්‍යාහාර කොට එයින් "අන්‍යෙෂාක්තෙ" යනුවෙන් ප්‍රථමාව සිඞ්ඝා නොවේ ද? මේ "ලිඞ්ගාර්ථෙ ප්‍රථමා" යන සූත්‍රයෙන් කිම්දැයි චොදනාකොට ඊට පරිහාරවශයෙන් "අඛ්‍යාහාරෙණ ගෞරවාත්වෙයර්ථ්‍යාවව" යනු කීහ. අඛ්‍යාහාරවශයන් වාක්‍යය මහත් වන බැවින් ව්‍යර්ථ බැවිනුත් මෙසේ "ලිඞ්ගාර්ථෙ ප්‍රථමා" යන සූත්‍රය උව මනාවේ යනු එහි අර්ථයි. සිඞ්ධාන්තචන්ද්‍රිකා ආඛ්‍යාතාඛ්‍යාදි ව්‍යාකරණයන්හිද ලිඞ්ගාර්ථ ආමන්ත්‍රණාර්ථ උක්තාර්ථ යන තුනෙහිම වෙන්වශයෙන් ප්‍රථමාව වේයයි කීහ.

* ඇතැම් සාරස්වතයන්හි මේ ශෙලාකවලට මුලින් "අන්‍යෙෂාක්තෙප්‍රථමා" යන සූත්‍රය දක්නා ලැබේ. මෙහි මේ "රවිරිව රාජතෙ" යනාදී උදාහරණ විද්‍යමාන බැවින් ඒ යොග්‍යයයි ද හඟිමු.

a මනසි වචසි කායෙ පුණ්‍යපීයූෂපූර්ණා
සත්‍රිභුවනමුපකාරශ්‍රේණිභිඃ ප්‍රීණයන්තඃ,
පරගුණපරමාණූන් පර්වතීකෘත්‍ය නිත්‍යං
නිජහෘදි විකසන්තඃ සන්ති සන්තඃ කියන්තඃ.

b කුමාරාඃ ශෙරතෙ සෛවරං රොරූයතෙන ච නාරකාඃ,
ජෙගීයතෙන ච ගීතඥා මෙම්‍රීයතෙන රාජර්දිතාඃ.

259. ආමන්ත්‍රණෙ ච. (ආමන්ත්‍රණෙ 7, 1, ච 1, 1;)

දෙදෙන; ප්‍රාක්, පූර්වයෙහි; ආසන්නං, වූහ. (මෙහි "රාජතෙ" යන ක්‍රියාවෙන් "රාජා" යනු ද "රොරූයතෙ" යන ක්‍රියාවෙන් "කුමාරී" යනු ද "බොභුජ්‍යතෙ" යන ක්‍රියාවෙන් "භූපාලඃ" යනු ද "ආසන්නාම්" යන ක්‍රියාවෙන් 'රාමලක්ෂ්මණෞ" යනු ද උකත කර්ත්‍රර්ථයෙහි ප්‍රථමාසි.)

a මනසි, සිතෙහිද, වචසි වචනයෙහිද; කායෙ, කයෙහිද; පුණ්‍යපීයූෂපූර්ණාඃ, පින් නැමති අමා පිරුණාවූ; ත්‍රිභුවනං, භුවනත්‍රය; උපකාරශ්‍රේණිභිඃ, උපකාරරාශියෙන්; ප්‍රීණයන්තඃ, පිණවන්නාවූ; පරගුණපරමාණූන්, අන්‍යයන්ගේ ගුණ නැමති පරමාණු; පර්වතීකෘත්‍ය පර්වතයන් මෙන් (මහත්) කොට; නිත්‍යම්, නිතර; නිජහෘදි, සවකීය චිත්තයෙහි, විකසන්තඃ, ප්‍රකාශකරන්නාවූ; සන්තඃ, සජ්ජනයෝ; කියන්තඃ, කිදෙනෙක්; සන්ති, ඇත්තාහුද; (මෙහි "සන්ති" යන ක්‍රියාවෙන් "සන්තඃ" යනාදිය උකත කර්ත්‍රර්ථයෙහි ප්‍රථමාසි.)

b කුමාරාඃ, කුමාරයෝ; සෛවරං, සියකැමැත්තෙන්; ශෙරතෙ, හොවිත්; නාරකාඃ, නිරිසත්තු; රොරූයතෙන ච, අතිශයෙන් වැලපෙත්; ගීතඥාඃ, ගී දන්නෝ; ජෙගීයතෙන ච, අතිශයෙන් ගයත්; රාජර්දිතාඃ, රොගයෙන් පීඩිතවූවෝ; මෙම්‍රීයතෙන, අතිශයින් මියත්; (මෙහි "ශෙරතෙ" යන්නෙන් "කුමාරාඃ" යනුද; "රොරූයතෙන" යන්නෙන් "නාරකාඃ" යනුද, "ජෙගීයතෙන" යන්නෙන් "ගීතඥාඃ" යනුද, "මෙම්‍රීයතෙන" යන්නෙන් "රාජර්දිතාඃ" යනුද උක්තකර්ත්‍රර්ථයෙහි ප්‍රථමාසි.)

259. ආමන්ත්‍රණෙ ච, ආමන්ත්‍රණාර්ථයෙහිද; ප්‍රථමා විභක්තිය වේ.

a අමනන්ත්‍රණෙ අභිමුඛීකරණෙ ප්‍රථමා විභකතිර්භවති.

b මාං සමුඛර ගොවින්ද ප්‍රසීඛ පරමෙශ්වර,
කුමාරෙඌ සෙවරමාසාථාං ක්ෂමධවං හොස්තපස්විනඃ,

260. හොඃසිඃ, (හොසඃ 1' 3,)

c හොස් හගොස් අඝොස් එතෙ ශබ්දා නිපාත්‍යතෙන ධිවිෂයෙ (භවද්භගවදඝවඡබ්දානාං හොස් භගොස් අඝොස් ඉත්‍යෙතඡබ්දරූපත්‍රයං ක්‍රමෙණ නිපාත්‍යතෙ)

---

a ආමනන්ත්‍රණෙ, "ආමනන්ත්‍රණෙ" යයි සේයි, අභිමුඛීකරණෙ, අනභිමුඛවූවකු අභිමුඛකිරීමෙහි; ප්‍රථමාවිභකතිඃ භවති, ප්‍රථමා විභක්තිය වේ.

d ගොවින්ද (භවත්) විෂ්ණුදෙවරාජය; මාං, මා; සමුබර, (භව සාගරයෙන්) සමුද්‍රණය කරණු (ගොඩගණු) මැනව; පරමෙශ්වර, පරමෙශ්වරය (ඔබවහන්සේ); ප්‍රසීද, ප්‍රසන්නවනු මැනව; කුමාරෙඌ, එම්බා කුමාරවරු දෙදෙනෙනි; සෙවරං, සියකැමැත්තෙන් හෙවත් සැපසේ; ආසාථාං, හිඳිව්; හොඃ තපස්විනඃ, පින්වත් තපස් ඇත්තෙනි; ක්ෂමධවම්, ඉවසව්; (මෙහි "ගොවින්ද, පරමෙශ්වර" යන දෙක ආමන්ත්‍රණාඛ්‍ය ප්‍රථමා එකවචනයි, "කුමාරෙඌ" යනු ත්විවචනයි. "තපස්විනඃ" යනු බහුවචනයි.)

260. හොඃ, හොස් සමාහාරයෙහි වූවෝ හෙවත් "හොස් හගොස් අඝොස්" යන මොහු ආමන්ත්‍රණාඛ්‍යයෙහි නිපාතනය කරණුලැබෙත්.

c හොස් හගොස් අඝොස් එතෙ ශබ්දාඃ, "හොස් හගොස් අඝොස්" යන මේ ශබ්දයෝ; ධිවිෂයෙ, ධිසංඥවිෂයෙහි; නිපාත්‍යතෙ, නිපාතනය කරණුලැබෙත්; භවත් භගවත් අඝවත් ශබ්දානාං, "භවත් භගවත් අඝවත්" ශබ්දතුණට; හොස් හගොස් අඝොස් ඉති, "හොස් හගොස් අඝොස් යන; එතත් ශබ්දරූපත්‍රයම්, මේ ශබ්දරූපතුණ; ක්‍රමෙණ, පිළිවෙළින්; නිපාත්‍යතෙ, නිපාතනය කරණුලැබේ.

a **ඛමසව හො දුරුරුඛ්‍ය භගොඝතුඛ්‍යං නමොඝතුතෙ, අධිෂව හො මහාප්‍රඥ ඝානඝා යොඃ සවඝඝමරම්.**

261. ශෙෂාඃ කායේ‍යී කතීඃසාධනයොර්දානපාත්‍රෙ විශෙලෂාවධෙෞ සම්බන්ධි ආධාරභාවයොඃ.

(ශෙෂාඃ 1, 3; කායේ‍යී 7, 1; කතීඃසාධනයොඃ 7, 2; දානපාත්‍රෙ 7, 1; විශෙලෂාවධෙෞ 7, 1; සම්බන්ධෙ 7, 1; ආධාරභාවයොඃ 7, 2;)

b **ශෙෂා විභක්තයොඃ මිතීඃආද්‍ය එෂවර්ථෙෂු භවන්ති, කායේ‍යී කර්මකාරකෙ උත්පාදෙ ආපෙය සංඝාතෙ විකායේ‍යී ච මිතීයාවිභක්තිර්භවති.**

---

a හොඃ දුරුරුඛ්‍ය, එම්බා දුකසේ ආරුඛනය කටහැක්ක; ඛමසව, ඉවසව; භගොඃ, පිණැත්තෙනි; අඝතුතෙ, සතුති (වචන) රහිතවූ; තුභ්‍යම්, ඔබට; නමඃ, නමස්කාර වේවා; හොඃ මහ ප්‍රාඥ, එම්බා මහාපණ්ඩිතය; (ඔබවහන්සේ); අධිෂ්ව, හදුරණ මැනව; අඝොඃ, එම්බා පාපිෂ්ඨය; සවඝඝමරං, සවනාශකවූ පාපය; ඝාතය, නසව (මෙහි "හොඃ භගොඃ අඝොඃ" යනු මිට උදාහරණයි.)

මෙසේ ලිඞ්ගාඛ්‍යෙහි හා ආමන්ත්‍රණාඛ්‍යෙහි ප්‍රථමාව ලක්ෂ්‍ය ලක්ෂණවලින් නිරූපණය කොට ඉක්බිති මිතියාදිවිභක්තීහු සාමාන්‍යයෙන් මේ මේ අර්ථයන්හි වෙත්යයි විධානය කරන්නාහු "ශෙෂාඃ කයේ‍යී" යනාදි සූත්‍රය කිහු.

261. ශෙෂාඃ, මිතියාදී සෙසු විභක්තීහු; කායේ‍යී, කර්මකාරක යෙහි ද; කතීඃසාධනයොඃ, කතීඃකරණ කාරකවයෙහි ද; දානපාත්‍රෙ දානයට භාජනවූ සම්ප්‍රදානකාරකයෙහි ද; විශෙලෂාවධෙෞ, වියොගයෙහි ඉමවූ අවධිකාරකයෙහි ද; සම්බන්ධි, සම්බන්ධාර්ථ යෙහි ද; ආධාරභාවයොඃ, ආධාරකාරකය හා (ක්‍රියාලක්ෂණවූ, භාවය යන දෙක්හි ද (පිළිවෙළින්) වෙත්.

b මිතියාද්‍යඃ, මිතියාව ආදිකොට ඇත්තාවූ; ශෙෂාඃ විභක්තයඃ, සෙසු විභක්තීහු; එෂු අර්ථෙෂු, මෙකී කර්මාදිඅර්ථයන්හි; භවන්ති, වෙත්; කායේ‍යී, කායේ‍යීසඞ්ඛ්‍යාතවූ; කර්මකාරකෙ, කර්මකාරකයෙහි (වන්නාවූ); මිතියාවිභක්තිඃ, මිතියාවිභක්තිය; උත්පාදෙ, ඉපද

a "කත්‍රීප්සිතතමං කම්"

b කත්‍රික්‍රියයා ආප්තුමිෂ්ටතමං කාරකං කර්මසඥං ස්‍යාත්. හරිං හජති.

c "තථා යුක්තමානිප්සිතම්"

d ඊප්සිතතමවත් ක්‍රියයා යුක්තමනීප්සිතමපි කාරකං කර්මසංඥං ස්‍යාත්. නවමානීප්සිතං විවිධම්-චෙෂ්‍යම්තරවව. විෂංභුඩ්ක්තෙ, ග්‍රාමං ගච්ඡංස්තෘණං සඵයති.

වියයුත්තෙහි ද; ආප්‍යෙ, පැමිණිය යුත්තෙහි ද; සංසකාර්‍යෙ, සංසකාරකටයුත්තෙහි ද; විකාර්‍යෙ ව, විකාරකටයුත්තෙහි ද; භවති, වේ.

a කර්තෘ, කතෘට; ඊප්සිතතමම්, අතිශයින් අභිමතවූයේ; කම්, කම් නම් වේ.

b කර්තෘ, කතෘහු විසින්; ක්‍රියයා, ක්‍රියාවෙන්; ආප්තුං, පැමිණෙන්නට; ඉෂ්ටතමම්, අතිශයින් අභිමතවූ; කාරකම්, කාරකය; කර්ම සංඥං ස්‍යාත්, කම් නම් වන්නේය; හරිම්, ඊශ්වරයා; හජති, සෙවනය කෙරේ; (මෙහි "හරිම්" යනු කතෘහුගේ භජනක්‍රියාවෙන් අතිශයින් අභිමත පදාර්‍ථය බැවින් ඊප්සිත කර්මයි.)

c තථා, එපරිද්දෙන්; හෙවත් පූර්‍වොක්ත ඊප්සිතය මෙන්; යුක්තම්, (කතෘහුගේ ක්‍රියාව සමඟ) යුක්තවූ; අනීප්සිතච, අනීප්සිතය ද හෙවත් ක්‍රියාවෙන් පැමිණෙන්නට නොකැමති පදාර්‍ථය ද, කර්ම නම් වේ; (අනීප්සිතය වුවත් ක්‍රියාව හා යුක්තවූවොත් කර්මය වේ යනු භාවයයි.)

d ඊප්සිතතමවත්, ඊප්සිතතමය මෙන්; ක්‍රියයා යුක්තම්, ක්‍රියාවෙන් යුක්තවූ; අනීප්සිතං කාරකම් අපි, ඊප්සිතතුවූ කාරකය ද; කර්මසංඥං ස්‍යාත්, කම් නම් වන්නේය; තත් අනීප්සිතංච, ඒ අනීප්සිතය ද; හෙවත් ඒ කතෘක්‍රියාවෙන් ඊප්සා නොකරණ ලද්ද ද; විවිධම්, දෙවැදෑරුම් වේ; (එනම්)-චෙෂ්‍යම්, චෙෂ්‍ය කර්මයද; ඉතරත් ච, අන්‍යවූ අචෙෂ්‍ය (ඖදාසීන්‍ය) කර්මය දැයි කියයි; විෂං, විෂ; භුඩ්ක්තෙ, අනුභව කෙරේ; (මෙහි විෂානුභවය අනීප්සිතව චෙෂයෙන් කරණලද්දක් බැවින් "විෂම්" යනු අනීප්සිත චෙෂ්‍යකර්මයි); ග්‍රාමං ගච්ඡන්, ගමට යන්නේ; තෘණම්, තණ; ස්‍පෘශති, ස්පර්ශකෙරේ; (මෙහි "ග්‍රාමම්" යන්න "ගච්ඡන්"

a තවව කම්මකාරකං චතුර්විධම්-උත්පාද්‍යම් ආප්‍යං සංඝා
ය්‍යං විකාරය්‍යං ච, උත්පත්තය්‍යභිමුඛපාද්‍යම්, යදහුවා භාවි තදු
ත්පද්‍යං වා. යත් සිධමෙව ප්‍රාප්‍යතෙ තදාප්‍යම්, සංස්කාරෙ
නාම ප්‍රාක්තනතනකම්ජෝ ගුණඃ, කශ්චිද්ගුණාතිශයෝ වා
ගුණාධානං වා මලාපකර්ෂෝ වා ඉති චතුර්විධඃ සංස්කාරඃ,
සංස්කාරමහීතිති=සංස්කාර්‍යම්. විකාරෙ නාම පූර්වාවස්ථා
පරිත්‍යාගෙනාවස්ථානතරප්‍රාප්තිඃ.

b කටං කරෝති කාරුකො රූපං පශ්‍යති චාක්ෂුෂඃ,
රාජ්‍යං ප්‍රාපෙනාති ධර්මිෂ්ඨඃ සොමං සුනොති සොමපාඃ.

යන කෘදන්ත ක්‍රියාව හා ඊප්සිතඛයෙන් යුක්තවූයෙන් ඊප්සිත කම් වේ. ඒ අතරවූ තෘණසඳහිය වනාහි ප්‍රසඬ්ගයෙන් වූ බැවින් "තෘණම්" යනු ඊප්සිත අනිප්සිතවයෙන් අන්‍ය වූ ඔදසිත්‍යකම්සි.

පූර්වොක්ත උත්පාද්‍යාදි චතුර්විධකම්ය නිර්වචනයසින් විස්තර කරන්නාහු "තවව කම්මකාරකම්" යනාදිය කිහු.

a. තත් කම්මකාරකං ව, ඒ කම්මකාරකය ද, චතුර්විධම් සිවුවැදෑ රුම් වේ. (එනම්):-උත්පාද්‍යම්, උත්පාද්‍යකම්ය; ආප්‍යම්, ආප්‍යකම්ය; සංඝාය්‍යම්, සංඝාය්‍යකම්ය; විකාය්‍යං ව, විකාය්‍යකම්ය යන මේසි. උත්පත්තය්‍යභිම්, උත්පත්තියට සුදුස්ස හෙවත් ඉපදවිය යුත්ත; උත්පාද්‍යම්, උත්පාද්‍ය නම් වේ. යත්, යමක්; අභුවා, (පෙර) නොවී; භාවී, වනසුලු නම්; තත් වා, හෙද; උත්පාද්‍යම්, උත්පාද්‍ය නම් වේ. සිධම් එව, සිධවූම; යත්, යමක්; ප්‍රාප්‍යතෙ,(කතෘහුවිසින්) පැමිණෙනු ලැබේ නම්; තත්, එය; ආප්‍යම්, ආප්‍ය නම් වේ. සංස්කාරඃ නාම, සංස්කාර නම් (කෙසේදයත්); ප්‍රාක්තනතනකම්ජඃ, පූර්භව කර්මයෙන් උපන්නාවූ; ගුණඃ, ගුණය හෝ; කශ්චිද්ගුණාතිශයඃ වා, කිසියම් උතුකම් ගුණයක් හෝ; ගුණාධානං වා, ගුණපිහිටුවීම හෝ; මලාපකර්ෂඃ වා ඉති, කිලුටු හැරීම හෝ වේයසි; සංස්කාරඃ, සංස්කාරය; චතුර්විධඃ, සිවුවැදෑරුම්වේ. සංස්කාරං,(මෙකී චතුර්විධ) සංස්කාරයට; අහීතීති, සුදුසුවේනුයි; සංස්කාය්‍යම්, සංස්කාය්‍ය නම් වේ. විකාරඃ නාම, විකාර නම්; පූර්වාවස්ථාපරිත්‍යාගෙන, පූර්ව අවස්ථාව හැරීමෙන්, අවස්ථානතරප්‍රාප්තිඃ, අන්‍ය අවස්ථාවකට පැමිණීමසි.

b. කාරුකඃ, කළල්කරුතෙම; කටං, කළාල; කරොති, කෙරේ; චාක්ෂුෂඃ, ඇස් ඇත්තේ; රූපං, රූපය; පශ්‍යති, දකී, ධර්මිෂ්ඨඃ,

a කටාදිකමුත්පාද්‍යාදි චතුර්විධං කාම්. ගුණාතිශයසංසර්ගා යත්‍රං යථා-ව්‍රීහින් යවාන් වා ප්‍රොක්ෂති, ප්‍රොක්ෂණේන ව්‍රීහිෂු කශ්චිද්ගුණාතිශයෝ ජන්‍යතෙ. ගුණාධානමලාපකෂීයොරු දාහරණම්-වසන්‍රං රජයති දෙවදත්තඃ, රජකෝ වසන්‍රං ක්ෂාලයති.

අතිශයින් දෑහැම්වූයේ; රාජ්‍යං, රාජ්‍යයට; ප්‍රාපෙන්‍ගාති, පැමිණෙයි. ඒසෝමපාඃ, සොමවල්ලිරසපානය කරන්නාවූ බ්‍රාහ්මණතෙම; සෝමං, සොමලතාව; සුනොති, කඩයි.

a කටාදිකම්, කටාදිය; හෙවත් "කටං" යනාදි සතර; උත්පාද්‍යාදි, (යථොක්ත) උත්පාද්‍යාදිවූ; චතුර්විධං කම්, සිව්වැදෑරුම්වූ කම් යයි. හෙවත් සිවුවැදෑරුම් කමියට උදාහරණයි. ගුණාතිශයසංසර්ගා යත්‍රම්, උත්කර්ෂගුණයුත් සංස්කාර්‍ය්‍ය කමිය; යථා; මෙසේයි.(එනම් – ව්‍රීහින්, වී හෝ; යවාන් වා, යව හෝ; ප්‍රොක්ෂති, පොලයි. ප්‍රොක්ෂණෙන, පොලාලීමෙන්; ව්‍රීහිෂූ, වීවල; කශ්චිද්ගුණාතිශයඃ කිසියම් උත්කර්ෂගුණයක්; ජන්‍යතෙ, උපදවනු ලැබේ. ගුණාධානමලාපකර්‍ෂීයොඃ, ගුණාධානමලාපකර්‍ෂී සංසර්කාර්‍ය්‍යකර්මවයට; උදාහරණම්, උදාහරණ කියනු ලැබේ. (එනම්):- දෙවදත්තඃ, දෙවදත්තතෙම; වසන්‍රම්, වසන්‍රය; රජයති, රඳයි; හෙවත් සායම් කෙරේ. (මෙහි "වසන්‍රම්" යනු ගුණාධාන සංස්කාර්‍ය්‍ය කම්යි.) රජකඃ, රජකතෙම; වසන්‍රම්, වසන්‍රය; ක්ෂාලයති, සෝදයි. (මෙහි "වසන්‍රම්" යනු මලාපකර්‍ෂීසංස්කාර්‍ය්‍ය කම්යි).

මෙහි කර්මවිවක්ෂාවෙහි ලා පළමුකොට "කර්තුරීප්සිතතමං කර්ම" යන පාණිනීය සූත්‍රය හා වෘත්තිය ගෙණහැර දක්වා කර්තෘහට අතිශයින් කැමැති වූ පදාර්‍ථය කර්මයයි කිහු. කරණාදි අන්‍යකාරකද කර්තෘහට කැමැතිවුවත් තමන්ගේ ක්‍රියාවෙන් නිෂ්පාද්‍යපදාර්‍ථවූ කර්මයම ඔහට අතිශයින් කැමැති බැවින් "ඊප්සිතතමම්"යි කිහු. යමක් එසේ කැමැති නුවුවත් ඔහුගේ ක්‍රියාව හා යුක්තවූ වොත් හෙද කර්මය වේයයි දක්වනු පිණිස "තථායුක්තඤානීප්සිතම්" යන පාණිනීය සූත්‍රයද ගෙණහැර දක්වන ලදි. මේ අනීප්සිතය ද වෙෂ්‍යය ඉතරයයි විවිධකොට කිහු. මේ සියල්ලම "හරිං භජති" යනාදි උදාහරණ වලින් සපළවයි.

මෙහි යථොක්ත කර්මවය විභාගකරන්නාහු උත්පාද්‍යාදි චතුෂ්කය හා ඔවුන්ගේ අර්‍ථවිභාගයද පළකොට "කටං කරොති" යනාදි උදාහරණද ගෙණහැර දැක්වූහ. එහි "කටං කරොති" යන

තන්හි "කරොති" යන ක්‍රියාවෙන් අනුපපන්නකථොත්පත්තිය වූ බැවින් "කටම්" යනු උත්පාද්‍ය කර්මයි "ඝටං කරොති, පුත්‍රං ප්‍රසූයතෙ" යනාදිය ද මෙසේයි. "රූපං පශ්‍යති" යන තන්හි "රූපම්" යනු උත්පාද්‍යාදි ලක්ෂණවිරහිතව කර්තෘහුගේ දර්ශනක්‍රියා වෙන් පැමිණිය යුත්තක් වූ බැවින් ආප්‍යකර්මයි. "ග්‍රාමං ගච්ඡති" යනාදිය ද මෙසේයි. 'රාජ්‍යං ප්‍රාපෙනාති" යන තන්හි "රාජ්‍යම්" යනු ප්‍රාකථනකර්මජවූ අභිෂෙකාදි සංස්කාරයෙන් සිඩ බැවින් සංස්කාර්‍යකර්මයි. "සුඛං ප්‍රාපෙනාති" යනාදිය ද මෙසේ යි. "සොමං සුනොති" යන තන්හි "සොමම්" යනු සවන ක්‍රියාවෙන් අවස්ථානන්තරප්‍රාපනිය වූ බැවින් විකාර්‍ය කර්මයි. "කාෂ්ඨං දහති" යනාදිය ද මෙසේ යි.

යථොක්ත සංස්කාර්‍යවිභෙදවතුෂ්කයෙන් ප්‍රාකථනකර්මජ ගුණයට පමණක් උදාහරණ දක්වා අන්‍යභෙදත්‍රයට ද උදාහරණ දක්වන්නාහු "ව්‍රීහීන් යවාන් වා ප්‍රොක්ෂති" යනාදිය කිහු, මෙහි ප්‍රොක්ෂණ ක්‍රියාවෙන් ව්‍රීහ්‍යාදින්ගේ උත්කර්ෂගුණය සිඩ බැවින් "ව්‍රීහීන්" යනු ද "යවාන්" යනු ද ගුණාතිශය සංස්කාර්‍ය කර්මයි. "වස්ත්‍රං රජයති" යන තන්හි රජන ක්‍රියාවෙන් වස්ත්‍රයෙහි කිවිද් ගුණයක් පිහිටි බැවින් "වස්ත්‍රම්" යනු ගුණධාන සංස්කාර්‍ය කර්මයි "වස්ත්‍රං ක්ෂාලයති" යන තන්හි ක්ෂාලණ ක්‍රියාවෙන් වස්ත්‍රයාගේ මලාපකර්ෂණය සිඩවූ බැවින් "වස්ත්‍රම්" යනු මලාපකර්ෂ සංස්කාර්‍ය කර්මයි.

කර්මාර්ථය ව්‍යක්ත කරන්නා වූ ඇතැම් වෛයාකරණයෝ "ක්‍රියාව්‍යාප්‍යං කර්ම" යනු කිහු. ක්‍රියාවෙන් විශෙෂයෙන් පැමිණිය යුතු පදාර්ථය කර්මය වේ යනු එහි අර්ථයි. සමහරු "කර්තෘසම්බද්ධිඝටං කර්ම" යනු කිහු. කර්තෘහු විසින් මනාකොට උද්දෙශකරණලද (සම්පෙෂණය කරණලද හෝ අභිලාෂිතවූ) පදාර්ථය කර්මය වේ. යනු එහි අර්ථයි, සමහරු "යත් ක්‍රියතෙ තත් කර්ම" යනු කිහු. (කර්තෘහු විසින්) යමක් කරණු ලැබේ නම් ඒ කර්මය යනු එහි අර්ථයි. මෙකී කර්මාර්ථය විභාග කරන්නාවූ හර්තෘහරීන් විසින්:—

"නිර්වර්ත්‍යඤ්ච විකාර්‍යඤ්ච ප්‍රාප්‍යඤ්චෙති ත්‍රිධා මතම්,
තත්‍රෙප්සිතතමං කර්ම චතුර්ධාන්‍යත්තු කල්පිතම්.

ඔෞදාසීන්‍යෙන යත් ප්‍රාප්‍යං යච්ච කර්තුරනීප්සිතම්,
ඇඤ්ඤතරෙරිතාඛ්‍යාතං යදුච්චාප්‍යත්‍යපූර්වකම්,"

යනු කියන ලදී. එහි ඊප්සිතතමවූ කර්මය "නිර්වර්ත්‍ය විකාර්‍ය්‍ය ප්‍රාප්‍ය" වශයෙන් ත්‍රිවිධයයි දන්නා ලදී. අන්‍යවූ අනීප්සිතය වනාහි සිවුවැදෑරුම් යයි පිරිසිඳින ලදී. එනම්-උදාසීන භාවයෙන් යමක් පැමිණිය යුතු නම් එය ද, කර්‍තෘහට අනීප්සිත යමක් වේ නම් එයද, අපාදානාදී සංඥාවිශෙෂයෙන් අකථිත යමක් වේ නම් එය ද, (අධාරාදි) අන්‍යසංඥාවක් පූර්‍වකොට ඇති යමක් වේ නම් එය ද, කියා අනීප්සිත භෙදය සිවුවැදෑරුම් වේ යනු මෙහි අර්‍ථයි. සමහරු මෙකී නිර්වර්ත්‍යාදිත්‍රය ම පමණක් කර්‍ම විභාග යයි ද අන්‍ය විභාග යෝ ප්‍රාප්‍යකර්‍මයෙහිම ඇතුළති යයි ද කීහු. නිර්වර්ත්‍යාදි කර්‍මත්‍රයෙහි ලක්‍ෂණ දක්වන්නාහු:—

"යදසජ්ජායතෙ සවා ජනමනා යත් ප්‍රාකාශතෙ,
තනනිර්වර්ත්‍යං විකාර්‍ය්‍යනතු කර්‍ම වෙධා ව්‍යවසථිතම්.

ප්‍රකෘත්‍යවෙශදසම්භූතං කිඤ්චිත් කාෂ්‍යාදිහසමවත්,
කිඤ්චිද්ගුණාන්තරොත්පත්ත්‍යා සුවර්ණාදිවිකාරවත්.

ක්‍රියාකෘතවිශෙෂාණාං සිද්ධයත්‍රා න ගම්‍යතෙ,
දශීනාදනුමානවා තත් ප්‍රාප්‍යමිති කථ්‍යතෙ".

යනු කීහු. අවිද්‍යමානවූ යමක් උපදී නම් හෝ විද්‍යමානවූවක් උත්පත්තියෙන් ප්‍රකට වේ නම් හෝ ඒ නිර්වර්ත්‍ය කර්‍ම නම් වේ. විකාර්‍ය්‍යකර්‍මය වූකලි දෙපරිද්දෙකින් වෙන් කරණලදී. එනම්:— ප්‍රකෘතිය නසාලීමෙන් හටගත් කිසිවක් වේ නම් ඒ එහි ප්‍රථම භාගයයි. එනම්:-කාෂ්‍යාදීන්ගේ හසමය මෙහි. කිසිවක් අන්‍ය ගුණයක්හුගේ උත්පත්තියෙන් යුක්ත වේ නම් ඒ එහි ත්‍රිතීය භාගයයි එනම්:-සුවර්ණාදීන්ගේ විකෘති මෙහි. යම් තැනෙක්හි ක්‍රියාකෘත විශෙෂ සිද්ධියක් නො හැඟේ නම් දර්‍ශනයෙන් හෝ අනුමානයෙන් සිද්ධ වූ එය ප්‍රාප්‍යකර්‍මයයි කියනු ලැබේ යනු එහි අර්‍ථයි. "ඝටං කරොති, පුත්‍රං ප්‍රසූයතෙ" යනු නිර්වර්ත්‍ය කර්‍මයට උදාහරණයි. මෙහි පූර්‍වයෙහි අවිද්‍යමාන වූ ඝටය "කරොති" යන කරණ ක්‍රියාවෙන් නිපන් බැවින් ද, පූර්‍වයෙහි අප්‍රකාශ වූ පුත්‍රයා ජන්මයෙන් ප්‍රකාශ බැවින් ද "ඝටම්, පුත්‍රම්" යනු නිර්වර්ත්‍යකර්‍මයි. "කාෂ්‍යං හසම කරොති, සුවර්ණිණං කුණ්ඩලං කරොති" යනු විකාර්‍ය්‍යකර්‍මවයට උදාහරණයි, මෙහි ප්‍රකෘතිසථ කාෂ්‍යය උවෙශදයෙන් (නැසීමෙන්) විකෘතවූ බැවින් කුත්සිත කාෂ්‍යය ද, තද්ධවෙශ්දයෙන් උපන් ඵලය වූ හසමය ද,

a අභිඝඵීතයොඃ කාඝ්‍ඨා*ඩිගුපඝ්‍ඨාදිෂු නිඥු,
ඵීතීඝාමෙඩිතානෙනඥු නතොඝාඃඝ්‍ඨාඃපි දෘශ්‍යතෙ.

සුවණීණය ගුණානන්තරධානයෙන් විකෘත වූ බැවින් හෙ ද, තද්ගුණානන්තරධානයෙන් උපන් ඵලයවූ කුණඩලය ද, විකාර්‍ය්‍ය කර්මයි†. "රූපං පශ්‍යති" යනු ප්‍රාප්‍යකර්මයට උදාහරණයි. මෙහි රූපයාගේ විශෙෂ සිඩියක් නො ඇතෙන බැවින් නිර්වර්ත්‍ය හෝ විකාර්‍ය්‍ය නොවේ එහෙත් කර්තෘහුගේ දර්ශනක්‍රියාවෙන් පැමිණිය යුතු ඵලය බැවින් ප්‍රාප්‍යකර්මයි. "ග්‍රාමං ගවර්‍යාස් තෘණං සඵාඝති" යනු ඖදාසීන්‍යකර්මයට උදාහරණයි. මෙහි ග්‍රාමගමන මුත් තෘණ සඵාඝීය කර්තෘහුගේ උද්දෙශ්‍යභාවයෙන් තොරව ක්‍රියාජන්‍ය සංයොග රූප ඵලභෙදයෙන් සිඩ බැවින් "තෘණම්" යනු ඖදාසීන්‍ය කර්මයි. "අන්‍නං බුභුක්ෂුර්ඵීමං භුඬ්ක්ෂ්ව" යනු අනීප්සිත (වෙෂ්‍ය) කර්මයට උදාහරණයි. මෙහි අන්‍නාභක්ෂණයෙහි කැමැත්ත ඇත්ත හුගේ ක්‍රියාජන්‍යඵලය භොජනානුගත විෂානුභවය වූ බැවින් "විෂම්" යනු අනීප්සිත (වෙෂ්‍ය) කර්මයි. "ගාං පයෝ දෙග්ධි" යනු සංඥාන්තරනාඛ්‍යාත කර්මයට උදාහරණයි. මෙහි ඉෂ්ටභාවයෙන් වූ දොහන ක්‍රියාජන්‍ය ඵලය පයස බැවින් එය කර්මසංඥාසූත්‍රාඛ්‍යාතයි, "ගාම්" යන්න ක්‍රියාජන්‍යඵලය නොව තත්ඵලයට නිමිත්තභාවයෙන් ඵලඹ සිටි බැවින් කාරක සංඥ සූත්‍රොක්ත ලක්ෂණා භාවයෙන් තත්සංඥාන්තගීත නොට අනාඛ්‍යාත වේ. "හරිර්ඵලධිමධිශෙතෙ" යනු අන්‍යපූර්ඵක කර්මයට උදාහරණයි. මෙහි ජලධිය පූර්ඵයෙහි ශයන ක්‍රියාවට ආධාරභාවයෙන් යුත් බැවින් ආධාරසංඥාව ද ලබා පසුව "අධි" යොගයෙන් කර්මභාවයට පැමිණි බැවින් අන්‍ය පූර්ඵක කර්මයි. මෙහි කි නිර්වර්ත්‍යවිකාර්‍ය්‍ය ලක්ෂණභයට ඇතුළත් නොවන සියල්ලම ප්‍රාප්‍යකර්මය යනු මුග්ධබොධර්ඵිකාමතයි. මෙසේ කාරකභාවයෙන් විතීයාර්ථදීපනය කොට නැවත උපපදයොගයෙන් ෂෂ්ඨ්‍යර්ථාදියෙහි විතීයාව දක්වනු පිණිස වෘත්තිකාරයෝ "අභිඝඵීතයොඃ" යනාදිය කීහු.

a අභිඝඵීතයොඃ, "අභිතඃ ඝඵීතඃ" යන නිපාතදෙදෙනාගේ යොගයෙහි ද, ඩික්, "ඩික්" නිපාතයොගයෙහි ද; ආමෙඩිතා නෙනඥු, ආමෙඩිතය අන්තභොට ඇත්තාවූ; නොහොත් සම්පාර්ථියෙහි කරණ ලද විභක්තිය ඇති; උපඝ්‍ඨාදිෂු නිඥු, උපරි ආදි තුණ

---

* "ඩික්" යනු ලුප්තවිභක්තික සඵාමාන්‍යන්‍ය පදයි. "ඩික්‍යුපඝ්‍ඨාදිෂු" සමහර.

† මේ පුර්‍වාචාර්‍යමතයි, නුමුත් "කාඝඪ" යනු හා "ඝුවර්ණ" යනු විකාර්‍ය්‍ය කර්ම බව ද, "හඝම්" යනු හා "කුණඩල" යනු විකෘත කර්ම බව ද හැඟෙයි.

a අභිතෝ ග්‍රාමං නදී වහති, සළීතෝ ග්‍රාමං වනානි සන්ති, ධිග් දෙවදත්තම්.

b "උපර්‍යධ්‍යධසඃ සාමීප්‍යෙ"

c එෂාං මෙ සෙනා දෙශතඃ කාලතශ්ච සාමීප්‍යෙ.

d "තස්‍ය පරමාම්‍රෙඩිතම්."

ඇති කල්හි ද, හෙවත් "උපර්‍යධිපරි, අධ්‍යධි, අධොධඃ" යන මොවුන්ගේ යොගයෙහි ද; විතීයා, විතීයා විභත්තියය; කාර්‍යෂී, කටයුතුයි. තතඃ අන්‍යත්‍ර අපි, එයින් අන්තන්හි ද; දෘශ්‍යතෙ, දක්නා ලැබේ. (වක්‍ෂ්‍යමාණවූ "අභිතොග්‍රාමම්" යනාදිය පිළිවෙළින් මීට උදාහරණයි)

a ග්‍රාමං අභිතඃ, ගමට සමීපයෙහි; නදී, ගඞ්ගාතොමෝ; වහති, ගලා බසී. ග්‍රාමඃ සළීතඃ, ග්‍රාමය සම්බන්ධ සියලු දිශාවන්හි, වනානි සන්ති, ආරණ්‍යයෝ වෙත් (මේ දෙතන්හි "ග්‍රාමම්" යනු "අභිතඃ සළීතඃ" යන නිපාතයොගයෙහි ෂෂ්ඨ්‍යර්‍ථයෙහි විතීයායි.) දෙව දත්තම්, දෙවදත්තයාට; ධික්, නිතු වේවා. මෙහි "දෙවදත්තම්" යනු "ධික්" නිපාතයොගයෙහි ෂෂ්ඨ්‍යර්‍ථයෙහි විතීයායි.) නැවත මෙහි "උපරි" ආදීන් සම්පාර්‍ථයෙහි විභීවන වන බැවි දක්වනු පිණිස "උපර්‍යධ්‍යධසඃ සාමීප්‍යෙ" යන පාණිනීය සූත්‍රය ගෙණ හැර දක්වන ලදී.)

b උපර්‍යධ්‍යධසඃ, "උපරි අධි අධස්" යන තුණ; සාමීප්‍යෙ, (මෙහි) සමීපභාවයෙහි විභීවන වෙත්.

c එෂාං, මේ "උපරි" ආදින්නේ; දෙශතඃ, දෙශ වශයෙන් ද; කාලතඃ ච, කාල වශයෙන් ද; සාමීප්‍යෙ, සමීපභාවයෙහි; වෙසඃ, විරූප වෙත්, හෙවත් විභවය වේ. සමීපභාවයෙහි ම විභවූ මේ 'උපරි" ආදි තුන්දෙනාගේ යොගයෙහි විතීයාව වේ. විප්සාවෙහි විභ වූ තන්හි ෂඤ්ඩිවිභක්තියය වේ* යනු මෙහි භාවාර්‍යයි. ශ්ලෝක යෙහි "ආම්‍රෙඩිතාන්තෙෂු" යන තන්හි කියන ලද "ආම්‍රෙඩිත" යනු මේ යයි දක්වනු පිණිස "තස්‍ය පරමාම්‍රෙඩිතම්" යන පාණිනීය සූත්‍රය හා තද්වෘත්තියය ද ගෙණ හැර දක්වන ලදි.)

d තස්‍ය, ඒ විරූපයාගේ; පරම්, පරවූ රූපය; ආම්‍රෙඩිතම්, ආම්‍රෙඩිත නම් වේ.

---

* "උපර්‍යධ්‍යධි බ්‍රුඞිනඃ වරත්තෙ" යනාදිය ඊට උදාහරණයි.

a. **චිරුකතස්‍ය පරං රූපමාම්ලේඩිතසංඥං ස්‍යාත්, උපයෂ්ටිපරි පුරොහිතං යාවකාඃ පතන්ති, අධ්‍යධි ග්‍රාමං මෘගාශ්චරන්ති, අධොධො නගරං නිධානානි සන්ති.**

b **"පරිතඃ සමයා නිකෂා හා ප්‍රති යොගෙපි" පරිතඃ කෘෂ්ණං ශොභාඃ, "නිකෂා සමයා සාමීප්‍යෙ" සමයා ගාමං උපවනානි වර්තන්තෙ, නිකෂා ග්‍රාමං නිහතඃ ශත්‍රුඃ, හා කෘෂ්ණාභකතම්. තස්‍ය ශොච්‍යතෙ ඉත්‍යර්ථඃ. බුභුක්ෂිතං න ප්‍රතිභාති කිඤ්චත්.**

---

a චිරුකතස්‍ය, දෙවරක් කියන ලද්දහුගේ; පරං රූපම්, පරවූ රූපය; ආම්ලේඩිතසංඥං ස්‍යාත්, ආම්ලේඩිත නම් වන්නේය; පුරොහිතං උපයෂ්ටිපරි, පුරොහිතයාගේ මතු සමීපයෙහි; යාවකාඃ, යාවකයෝ; පතන්ති, වැටෙත්. (මෙහි "උපයෂ්ටිපරි" යන චිරුකත නිපාතයොගයෙහි "පුරොහිතම්" යනු ෂෂ්ඨ්‍යර්ථයෙහි විතියාසි) ග්‍රාමං අධ්‍යධි, ගම සමීපයෙහි ඔබමොබ; මෘගාඃ, මෘගයෝ; චරන්ති, හැසිරෙත්. (මෙහි "අධ්‍යධි' යන චිරුකත නිපාතයොග යෙහි "ග්‍රාමම්" යනු ෂෂ්ඨ්‍යර්ථයෙහි විතියාසි.) නගරං අධොධඃ, නුවරයට සමීපයෙහි; නිධානානි, නිධානයෝ; සන්ති, ඇත්තාහ. (මෙහි "අධොධඃ" යන චිරුකත නිපාතයොගයෙහි 'නගරම්" යනු ෂෂ්ඨ්‍යර්ථයෙහි විතියාසි.) (ශ්ලොකයෙහි "තතොන්‍යත්‍රාපි දෘශ්‍යතෙ' යනු කී බැවින් "ඩික්" යොගාදියෙන් අන්තන්හිද විතියාව වන බැව් දක්වන පිණිස "පරිතඃ සමයා" යනාදිය කිහු.)

b පරිතඃ සමයා නිකෂා හා ප්‍රතියොගෙ අපි, "පරිතඃ සමයා නිකෂා හා ප්‍රති" යන මේ අව්‍යය ශබ්දයන්ගේ යොගයෙහි ද විති යාව වේ. කෘෂ්ණා පරිතඃ, විෂ්ණුහු හාත්පස්හි; ශොභාඃ, ශොපල් ලෝ වෙත්. (මෙහි "කෘෂ්ණම්" යනු "පරිතස්' යන නිපාතයොග යෙහි ෂෂ්ඨ්‍යර්ථයෙහි විතියාසි.) නිකාෂාසමයා, "නිකෂා සමයා" යන නිපාතවය; සාමීප්‍ය සමීපභාවයෙහි වේ. ග්‍රාමං සමයා, ගම සමීපයෙහි; උපවනානි, උයන්, වර්තතෙ, පවතිත්. ග්‍රාමං නිකෂා, ගම සමීපයෙහි; ශත්‍රුඃ, සතුරුතෙම; නිහතඃ, නසනලදී. (මේ දෙතන්හි "සමයා නිකෂා" යන නිපාතයොගයෙහි "ග්‍රාමම්" යනු ෂෂ්ඨ්‍යර්ථයෙහි විතියාසි.) කෘෂ්ණාභකතං, විෂ්ණුහකති නැත්තහුට; හා, ශොකයෙකි. තස්‍ය, ඔහට; ශොච්‍යතෙ ඉති,

a "ලක්ෂණේත්ථම්භූතාඛ්‍යානභාගවීප්සාසු ප්‍රතිපදෝක්තයඃ"

b එෂ්වර්ථේෂු විෂයභූතෙෂු ප්‍රත්‍යාදයඃ කර්මප්‍රවචනීයසංඥඃ ස්යුඃ.

c "කර්මප්‍රවචනීයයුක්තෙ විතීයා"

d එතෙන යොගෙ විතීයා ස්‍යාත්. ලක්ෂණේ-වෘක්ෂං ප්‍රති පරි අනුවා විද්‍යුතතෙ විද්‍යුත්. ඉත්ථම්භූතාඛ්‍යානෙ-භෂකතා විෂ්ණුං ප්‍රති පරි අනු වා, භාගෙ-ලක්ෂ්මීර්ං ප්‍රති පරි අනු වා, භරතීෂ ඉත්‍යර්ථඃ, විප්සායාම්-වෘක්ෂං ප්‍රති පරි අනු වා සඤ්චරති,

---

ශොක කරණු ලැබේ යන; අර්ථඃ, අර්ථයි; (මෙහි "භා" යන නිපාත, යොගයෙහි "කෘෂණාහක්තම්" යනු ෂෂ්ඨ්‍යර්ථයෙහි විතීයායි.) බුභුක්ෂිතං, අනුභව කරණු කැමැත්තහුට; කිඤ්චත්, කිසිවක්; නප්‍රතිභාති, නොවැටහේ. (මෙහි "බුභුක්ෂිතම්" යනු "ප්‍රති" යොග යෙහි ෂෂ්ඨ්‍යර්ථයෙහි විතීයායි.

a ලක්ෂණෙත්ථම්භූතාඛ්‍යානවීප්සාසු,- ලක්ෂණ, ලක්ෂණාර්ථය; ඉත්ථම්භූතාඛ්‍යාන, ඉත්ථම්භූතාඛ්‍යානාර්ථය (කිවිත්ප්‍රකාරයකට පැමිණීමේ යයි පැවසීමය); භාග; භාගාර්ථය (කොටස); වීප්සාසු, වීප්සාර්ථය (භින්නවූ වස්තූන් සම්බන්ධ කොට කියනු කැමැත්තය) යන මෙහි; ප්‍රතිපදෝක්තයඃ, "ප්‍රති පරි අනු" යන මොහු කර්මප්‍රවචනීය සංඥ වෙත්.

b එෂු අර්ථෙෂු, මේ ලක්ෂණාදි අර්ථයන්; විෂයභූතෙෂු, විෂයවූ කල්හි; ප්‍රත්‍යාදයඃ, ප්‍රති ආදීහු; කර්මප්‍රවචනීයසංඥඃ ස්යුඃ, කර්මප්‍රවචනීය සංඥ ඇත්තෝ වන්නාහ.

c කර්මප්‍රවචනීයයුක්තෙ, කර්මප්‍රවචනීය සංඥයක් හා යුක්ත තන්හි; විතීයා, විතීයා විභක්තිය වේ.

d එතෙන යොගෙ, මේ කර්මප්‍රවචනීයසංඥය සමග යොග යෙහි; විතීයා ස්‍යාත්, විතීයා විභක්තිය වන්නීය. ලක්ෂණේ, ලක්ෂණාර්ථයෙහි (උදාහරණ කියනු ලැබේ.) විද්‍යුත්, විදුලිය; වෘක්ෂං ප්‍රති, වෘක්ෂය ලකුණු කොට; විද්‍යුතතෙ, බබලා. පරි අනු වා, "වෘක්ෂං පරි, වෘක්ෂං අනු" කියා ද වේ. (වෘක්ෂය ලකුණු කොට යන අර්ථ මැයි.) ඉත්ථම්භූතාඛ්‍යානෙ, ඉත්ථම්භූතාඛ්‍යානාර්ථයෙහි (උදාහරණ කියනු ලැබේ.) විෂ්ණුං, විෂ්ණුනු කෙරෙහි;

භක්තෘ, භක්ති ඇත්තේය; හෙවත් භක්තෘත්වකරයට පැමිණියේය. පරි අනු වා, "විෂ්ණුං පරි, විෂ්ණුං අනු" කියා හෝ වේ. (එම අර්ථයි.) භාගෙ, භාගාර්ථයෙහි (උදාහරණ කියනු ලැබේ.) ලක්ෂ්මීඃ, ශ්‍රීදෙවීතොමෝ, හරිං ප්‍රති, විෂ්ණුහුගේ කොටසක් වේ. පරි අනුවා, "හරිං පරි, හරිම් අනු" කියා හෝ වේ. (එම අර්ථයි.) හරෙඃ, විෂ්ණුහුගේ; භාගඃ ඉති, භාගය යන; අර්ථඃ, අර්ථයි. ඒප්සාර්ථයෙහි) උදාහරණ කියනු ලැබේ.) වෘක්ෂං වෘක්ෂං ප්‍රති, වෘක්ෂයක් පාසා; සඤ්චරති, හැසිරේ. පරි අනුවා, "වෘක්ෂං වෘක්ෂං පරි, වෘක්ෂං වෘක්ෂම් අනු" කියා හෝ වේ. (එම අර්ථයි.)

මෙහි "ලක්ෂණ" යනාදි පාණිනීයොකති ගෙණ හැර දක්වා ලක්ෂණාදි අර්ථයන්හි පවත්නා ප්‍රති ආදීන්ට කර්මප්‍රවචනීය සංඥා කොට නැවත ඒ කර්මප්‍රවචනීය සංඥාව ලැබූ ඔවුන්ගේ යොගයෙහි විතීඃවීහකතිය වේ යයි කිහු. "කර්මප්‍රවචනීය" සංඥාහුගේ අර්ථතාව නිර්වචනයෙන් දක්වන්නාවූ වෛයාකරණයෝ "කර්ම ක්‍රියාං ප්‍රොක්තවන්තඉති=කර්මප්‍රවචනීයාඃ" යනු කිහු. කර්මසඛ්‍යාතවූ ක්‍රියාව ප්‍රකාශකළාහු කර්මප්‍රවචනීය නම් වෙත් යනු එහි අර්ථයි. ඔහු නම් යළොකන ප්‍රත්‍යාදිහුයි. මෙය "කර්මන්" ශබ්දොපපද "ප්‍ර" දූවී "වච්" ධාතුවෙන් භූතාර්ථකතීඃකාරක "අනීයර්" ප්‍රත්‍යයව නිපන්නේ වේ. එබැවින් මේ කර්මප්‍රවචනීය සංඥකවූ ප්‍රත්‍යාදීහු සම්ප්‍රතික්‍රියාවක් නොකියත් තත්ක්‍රියාද්‍යොතකද නොවෙත්, එහෙත් ඔහු ක්‍රියානිරූපිතසම්බන්ධ විශෙෂද්‍යොතකවූවෝ වෙත්. භර්තෘහරීන් විසින් දඃ-

"ක්‍රියායා ද්‍යොතකෝ නාඥං සම්බන්ධස්‍ය න වාචකාඃ,
නාපි ක්‍රියාපදඤ්ඤපි සම්බන්ධස්‍ය තු භෙදකාඃ"යි

කියනලදී. මේ කර්මප්‍රවචනීයසංඥය තෙමේ "අනුභූයතෙ" යනාදියෙහි උපසර්ගීයන් මෙන් ධාත්වර්ථය ප්‍රකාශ නොකරන්නේ වේ. ෂෂ්ඨීවිභක්තිය මෙන් සම්බන්ධත්වය කියන්නේ ද නො වේ. "ප්‍රාදෙශං විපරිලිඛති" යනාදියෙහි "ච්" ආදීන් මෙන් ක්‍රියානන්තරයක් ආකාඞ්ක්ෂය කරන්නේ ද නො වේ. වැළි කුමක් කෙරේ ද? යත්, ලක්ෂ්‍යලක්ෂණභාවාදි සම්බන්ධයට විශෙෂක වන්නේ වේ. හෙවත් සම්බන්ධ විශෙෂය ප්‍රකාශ කෙරේ. එනම් මෙහිද උදාහෘත "වෘක්ෂං ප්‍රති පරි අනු වා විද්‍යුතතෙ විද්‍යුත්" යන තන්හි වෘක්ෂය තෙමේ ලක්ෂණ ද, විද්‍යුත්තොමෝ ලක්ෂ්‍යද වේ. මේ දෙදෙනාගේ තල්ලක්ෂ්‍ය ලක්ෂණ භාවසම්බන්ධ විශෙෂය ප්‍රත්‍යාදීහු

a "කාලාධ්වනෝරත්‍යන්තසංයෝගේ"

b අව්‍යවධානසංයොගඤ්ච නෛරන්තර්‍යම්. කාලාධ්වවාචක ශබ්දානාං නෛරන්තර්‍යේඤ්ච වාච්‍යේ සති ද්විතීයා විභක්තිර්භවති, මාසමධීතෙ දෙවදත්තඃ. ක්‍රොශං පථිතඃ, නෛරන්තර්‍යෙඤ්කිම්? මාසස්‍ය ච්‍රධීතෙ, ක්‍රොශස්‍යෛකදෙශෙ පථිතඃ.

ප්‍රකාශ කෙරෙත්. "භක්තෝ විෂ්ණුං ප්‍රති පරි අනු වා" යන තන්හි විෂ්ණු තෙමේ විෂය ද භක්ත තෙමේ විෂයී ද වේ. එබැවින් මේ දෙදෙනාගේ විෂය විෂයිභාව සම්බන්ධ විශෙෂය ප්‍රත්‍යාදීහු ප්‍රකාශ කෙරෙත්. අන්තන්හි ද මෙසේයි.

මෙහි ලක්ෂණාදි අර්ථවතුෂ්කයෙහි පවත්නා ප්‍රත්‍යාදියට කර්මප්‍රවචනීය සංඥා කොට තද්‍යොගයෙහි විතීයාවට උදාහරණ ගෙණ හැර දක්වන ලද්දාහ. මුග්ධබොධයෙහි "අනුර්ලක්ෂණෙ" යනාදි පාණිනීය සූත්‍ර අසුරා කොට මෙකී විතියාවිධානයට විෂයවූ තැන් දක්වන්නාහු:-

"විප්සත්ථමභාවවිහෙහාභිඤ්ඤාභාගෙ පරිප්‍රතී,
අනුසෙත්‍රූ සහාර්‍ථෙ ච හීනෙත්‍රූපෙ මතාවිහ.

යනු කිහු. විතීයා විධානයෙහි ලා විප්සාර්‍ථ ඉත්ථම්භාවාර්‍ථ විත්තාර්‍ථයන්හි "අභි" යන්න ද, ඒ විප්සාදි අර්ථයෙහි හා භාගාර්‍ථයෙහි "පරි ප්‍රති" යන දෙක ද, ඒ "විප්සාඉත්ථම්භාවවිත්තභාග" යන අර්ථ චතුෂ්කයෙහි හා සහාර්‍ථහීනාර්‍ථවයෙහි "අනු" යන්න ද, හීනාර්‍ථයෙහි "උප" යන්න ද දන්නා ලද්දාහ යනු එහි අර්ථයි. මෙකී අර්ථයන්හි පවත්නා "අභි" ආදීන්ට කර්මප්‍රවචනීය සංඥාව ද ඔවුන්ගේ යොගයෙහි විතීයාව ද වේ. මෙහි විප්සාර්‍ථාදියෙහි උදාහරණ කියන ලද්දාහ. "විෂ්ණුමභිර්වර්‍තතෙ භගීඃ" යනු සහාර්‍ථ "අනු" යොගයෙහි උදාහරණයි. භගීඃ, ඊශ්වරතෙම; විෂ්ණුම් අනු, විෂ්ණුහු සමග; අර්වතෙ. පුදනු ලැබේ." යනු එහි අර්ථයි. "ශක්‍රාදය උපාව්‍යුතම්" යනු හීනාර්‍ථ "උප" යොගයෙහි උදාහරණයි. "ශක්‍රාදයඃ, ශක්‍රාදි දෙවියෝ; අව්‍යුතම් අනු, විෂ්ණුට හීන වෙත් යනු එහි අර්ථයි. "අනු" යොගයෙහි ද මෙසේයි.

a කාලාධ්වනොඃ, කාලවාචක මාගීවාචක ශබ්ද දෙදෙනාගේ; නෛරන්තර්‍යෙ, නිරන්තරභාවය වාච්‍යකල්හි විතීයාවිභක්තිය වේ.

b අව්‍යවධානසංයොගත්වම්, නුසුන් යෙදීම ඇති බව; නෛරන්තර්‍යම්, නෛරන්තර්‍ය (නිරන්තරභාව) නම් වේ. කාලාධ්වවාචක

a "කතීඃසාධනයොඃසෘතීයා"

ශබ්දානාම්, කාලවාචක මාගධීවාචක ශබ්දයන්ගේ; නෛරන්තර්‍යෙ අර්‍ථේ, නිරන්තරභාවාර්‍ථය; වාච්‍යෙ සති, කියයුතු කල්හි; විතීයා විභක්තිඃ භවති, විතීයාවිභක්තිය වේ. දෙවදත්තඃ, දෙවදත්තතෙම; මාසම්, මසක්මුලුල්ලෙහි; අධීතෙ, හදාරයි. ක්‍රොශම්, හඬසනක් පැහිර; පඨිතඃ, පඨිතයයි. නෛරන්තර්‍යෙ, නිරන්තරභාවාර්‍ථයෙහි යනු; කිම්, කිම්?; මාසස්‍ය, මසකට; විඃ, දෙවරක්; අධීතෙ, හදාරයි (යන තන්හි ද); ක්‍රොශස්‍ය, හඬසනක් සම්බන්ධිවූ; එකදෙශෙ, එක් පෙදෙසෙක්හි; පඨිතඃ. පඨිතයයි; (යනතන්හි ද අව්‍යභිචාරසංයොග රහිත බැවින් විතීයාව නොවන හෙයිනි).

මෙහි කියන ලද්දේ දිවස මාසාදි කාලවාචක ශබ්දයක් හෝ අඩක්‍රොශාදි මාගධී වාචක ශබ්දයක් (ක්‍රියාගුණද්‍රව්‍යවලින්) අනන්තරව (අනතුරුව) යෙදුනොත් ඒ කාලමාගධීවාචකශබ්දයන් කෙරෙන් විතීයාවිභක්තිය වනබවයි. මෙහි "මාසමධීතෙ දෙවදත්තඃ" යන තන්හි "මාස" යන කාලවාචකශබ්දය "අධීතෙ" යන අධ්‍යයන ක්‍රියාවෙන් අනන්තරව යෙදුනු බැවින් "මාසම්" යි විතීයා විය. "ක්‍රොශං පඨිතඃ" යන තන්හි මාගධීවාචකවූ "ක්‍රොශ" ශබ්දය "පඨිත" යන ද්‍රව්‍යයෙන් අනන්තරව යෙදුනු බැවින් "ක්‍රොශම්" යි විතීයා විය. "මසස්‍ය විරධීතෙ" යන තන්හි මසකට දෙවරක් මුත් මුලුල්ල අධ්‍යයන ක්‍රියාවෙන් අනන්තරව නොයෙදුන බැවින් විතීයා නොව "මාසස්‍ය"යි ෂෂ්ඨී විය. "ක්‍රොශස්‍යෙකදෙශෙ පඨිතඃ" යන තන්හි පඨිතයෙන් ක්‍රොශයාගේ එක් දෙසක් මුත් මුලුල්ල නිරන්තරව නොයෙදුන බැවින් විතීයා නොව "ක්‍රොශස්‍ය" යි ෂෂ්ඨීවිය.

වාත්තිකයෝ "ශෙෂාඃ කාර්‍යේ" යනාදි සූත්‍රයෙහි "කාර්‍යේ" යන්න මුල්කොට විතීයාවිභක්තියට යොග්‍යස්ථානයන්ගෙන් බොහෝ තැන් දක්වා ඉක්බිති එහි "කතීඃසාධනයොඃ" යන්න මුල් කොට තෘතීයාවිභක්තියට යොග්‍යස්ථාන දක්වන්නාහු "කතීඃසාධනයොඃ" යනාදිය කිහු.

a කතීඃසාධනයොඃ, කතීඃසාධනදෙක්හි; තෘතීයා, තෘතීයා විභක්තිය වේ,

a කතීරි ප්‍රධානෙ ක්‍රියාශ්‍රයෙ, සාධනෙ ච ක්‍රියාසිද්ධ්‍යුප
කාරකෙ කරණෙජෙී තෘතීයා විභක්තිර්භවති.

b ක්‍රියායාඃ පරිනිෂ්පන්නිඝ්‍යාපාරාදනන්තරම්,
විවක්ෂ්‍යතෙ යදා, යත්‍ර කරණං තත් තදා සම්‍යතම්.

c භින්නඃ ශරෙණ රාමෙණ රාවණො ලොකරාවණඃ,
කරාග්‍රෙණ විදිතෙෝපි වාතරෙරර්ජුධාවතෙ පුනඃ.

---

a ප්‍රධානෙ, ප්‍රධානවූ; ක්‍රියාශ්‍රයෙ, ක්‍රියාවට ආශ්‍රය වූ; හෙවත් ක්‍රියාව කිරීම පිණිස පැවැත්තාවූ; කතීරි, කර්තෘකාරකයෙහිද; සාධනෙ, "සාධනෙ" යයි සේයි; ක්‍රියාසිද්ධ්‍යුපකාරකෙ, ක්‍රියාසිද්ධියට උපකාරවූ; කරණෙජෙී ච, කරණාර්ථයෙහි ද; තෘතීයාවිභක්තිඃ භවති, තෘතීයාවිභක්තිය වේ.

b යදා, යම්කලෙක්හි; යද්ව්‍යාපාරාත්, යම්උත්සාහයෙකින් හෙවත් යම්කාරකයක් සම්බන්ධවූ ක්‍රියායෙන්; අනන්තරම්, අනතුරුව; හෙවත් අන්‍යකාරකව්‍යවධාන රහිතව; යත්‍ර, යම්තැනෙක්හි, ක්‍රියායාඃ, ක්‍රියාහුගේ: පරිනිෂ්පත්තිඃ, සංසිද්ධිය; හෙවත් ආතමලාභය; විවක්ෂ්‍යතෙ, විවක්ෂාකරණ්ලැබේ ද; තදා, එකල්හි; තත්, ඒකාරකය; කරණම්, කාරණයයි; සම්‍යතම්, දන්නාලදී

c රාමෙණ, රාමයා විසින්; ලොකරාවණඃ, ලොකයා හඬවන්නාවූ; රාවණඃ. රාවණතෙම; ශරෙණ, ඊයෙන්; භින්නඃ, විදරණය කරණ (පළත) ලදී; වාතරෙඃ, වදුරන්විසින්; කරාග්‍රෙණ, අතගින් හෙවත් නියෙන්; විදිතෙඃ අපි, විදරණයකරණලද්දේද; පුනඃ; නැවත; ධාවතෙ, (ඔවුන් හා) යුද්ධ කෙරේ. (මෙහි "රාමෙණ" යනුද "වානරෙඃ" යනුද ක්‍රියාශ්‍රයත්වයෙන් ප්‍රධානව ක්‍රියාසිද්ධිය කළ බැවින් කර්තෘර්ථයෙහි තෘතීයායි, "ශරෙණ" යනුද "කරාග්‍රෙණ" යනු ද යථොක්ත කර්තෘන් විසින් තමන්ගේ ක්‍රියාසිද්ධ්‍යුපකාරිත්වයෙන් විවක්ෂිත බැවින් කරණසාධනයෙහි තෘතීයායි).

කර්තෘර්ථයෙහි හා සාධනාර්ථයෙහි තෘතීයාවිභක්තිය වේය යයි කියා තත්කර්තෘසාධනවයෙහි විශෙෂ දක්වන්නාහු "ප්‍රධානෙ" යනාදියද "ක්‍රියාසිද්ධ්‍යුපකාරකෙ" යනාදියද කීහු, අන්‍යකාරකයන්ට ප්‍රධානව ක්‍රියාසිද්ධිය කරන්නාවූ කර්තෘර්ථයෙහි ද (ඒ කර්තෘහුගේ)

ක්‍රියා සිඩියට උපකාරවූ කරණාදීසඞ්ඛ්‍යාත සාධනයෙහිද තෘතී යාව වේ යනු එහි භාවයයි. මෙහි කී ක්‍රියාශ්‍රයත්වය කර්‍මාදි අන්‍ය කාරකයන්හි ද ඇතිවත්ම (අන්‍යකාරකප්‍රයොජකත්වයෙන්) ප්‍රධානවූ කර්‍තෘකාරකයෙහි යයි දක්වනු පිණිස "ප්‍රධානෙ" යනු කිහු. එහෙයින් පාණිනීයෙහිද "ස්වතන්ත්‍රඃ කර්‍තා"යි සූත්‍රය හදුරා ක්‍රියා යෙහි ස්වාධීනත්වයෙන් විවක්ෂිතවූ අර්‍ථය කර්‍තෘයයි කිහු. එසේම අන්‍යකාරකයන්ගේ ද ක්‍රියාසිඩ්‍යුපකාරකත්වය ඇතිවත්ම බොහෝ කාරකයන් මධ්‍යයෙහි යම් වසතුවක් අව්‍යවධානත්වයෙන් ක්‍රියා නිෂ්පත්තියයි විවක්ෂාකරණලද්දේ නම් එයම මෙහි සාධනයයි දක්වනු පිණිස "ක්‍රියායාඃ" යනාදි ශ්ලෝකය කිහු. ඒ සඳහා පාණිනියෙහි ද "සාධකතමඛ්කරණම්" යි සූත්‍රය හදුරා ක්‍රියාසිඩියෙහි ප්‍රකෘෂ්ටොපකාරවූයේ කරණයයි කිහු. ඔබොක්ත කර්‍තෘලක්ෂණ දක්වන්නාවූ ඇතැම් වෛයාකරණයෝ:-

"ප්‍රවෘත්තෙෂු ච නිවෘත්තෙෂු ච කාරකාණාං ය ඊශ්වරඃ,
ස කර්‍තා නාම විඥෙයඃ කාරකාණාං ප්‍රයොජකඃ."

යනු කිහු. කාරකයන්ගේ පැවැත්මෙහි හා නැවැත්මෙහි යමෙක් අධිපති වේ නම් කාරකත්‍වන් (ක්‍රියාවෙහි) මෙහෙයන්නාවූ හෙතෙම කර්‍තෘයයි දතයුත්තු වේ යනු එහි අර්‍ථයි මෙකී කර්‍තෘත්වය විභාග කරන්නාවූ බොහෝ වෛයාකරණයෝ "තත්‍ර තාවත් කර්‍තා ත්‍රිවිධඃ" යනාදීන් කිහු. එනම් එහි කර්‍තෘ තෙමේ පළමුකොට ත්‍රිවිධ වේ, එනම්-"ස්වතන්ත්‍රය ප්‍රයොජක" යයි කියායි. ස්වතන්ත්‍ර නම් ස්වාධීනත්වයෙන් ක්‍රියා සිඩිය කරන්නාවූ කර්‍තෘ තෙමේයි, ප්‍රයොජක නම් අන්‍යයෙකු ක්‍රියාවෙහි යොදන්නාවූ කර්‍තෘ තෙමේයි, එහි ප්‍රයොජක තෙමේ ද "ප්‍රෙෂක අඩ්‍යෙෂක ආනුකූල්‍යභාගින්" යයි ත්‍රිවිධ වේ. ප්‍රභුත්වයෙන් අනෙකකු මෙහෙයන්නේ ප්‍රෙෂක නම් වේ. එනම්-"ගුරුඃ ශිෂ්‍යෙණ කාරයති" යන තන්හි ගුරුතෙම ප්‍රභුත්වයෙන් ශිෂ්‍යයා ක්‍රියාවෙහි මෙහෙයන්නේ නුයි ප්‍රෙෂක නම් වේ. අඩ්‍යෙෂක නම් හීනත්වයෙන් මෙහෙයන්නේ වේ. එනම් "ශිෂ්‍යෝ ගුරුං හොජයති" යන තන්හි ශිෂ්‍යතෙමේ හීනත්වයෙන් ගුරුහු මෙහෙයන්නේ නුයි අඩ්‍යෙෂක වේ. ප්‍රභුත්ව හීනත්වදෙකින් විරහිතව අනුකූලමාත්‍රභාවයෙන් (සහායභාවයෙන්) මෙහෙයන්නේ ආනුකූල්‍ය භාගින් නම් වේ, එනම් 'ආනඳයති පිතරං සත්පුත්‍රඃ" යන තන්හි සත්පුත්‍ර තෙමේ ප්‍රභුත්වයෙන් හා හීනත්වයෙන් ද විරහිතව පිතෘහු ක්‍රියායෙහි මෙහෙයන්නේ නුයි ආනුකූල්‍යභාගින් වේ. සමහරු

a "ප්‍රකෘත්‍යාදිභ්‍යඃ"

b ප්‍රකෘත්‍යාදිභ්‍යඃ ශබ්දභ්‍යඃනෘතීයා ස්‍යාත්. ප්‍රකෘත්‍යා චාරුඃ, ප්‍රායේණ අලඃ, සුඛේන යාති, ගොත්‍රේණ ගාගීඃ, ගාග්‍යස්‍ය ගොත්‍රමිත්‍යර්ථඃ.†

"සවතන්ත්‍රය ප්‍රයොජකය කර්තෘ" යයි ත්‍රිවිධ කොට කියත්. එහි කර්තෘ නම් කර්මවයෙන් ද යුත් කර්තෘ තෙමේයි. එනම්- "ගම යති කෘෂ්ණං ගොකුලම්" යන තන්හි කෘෂ්ණ තෙමේ කිසිවෙකුගේ ප්‍රේරණයට යටත්වූ හෙයින් කර්මවයෙන් ද ගමනක්‍රියාව කරණ හෙයින් කර්තෘවයෙන් ද යුක්තවූයේ නුයි කර්මකර්තෘ වේ. නිරුත්සාහ යෙන් ක්‍රියා සිද්ධය වන්නාවූ ඇතැම්තන්හි ද මේ කර්මකර්තෘවය ලැබේ. එනම්-'සවයමෙව භිද්‍යතෙ කාෂ්ඨම්" යන තන්හි ක්‍රියාසිද්ධය නිරුත්සාහයෙන් බැවින් කර්මවූයේ ද කර්තෘවූයේ ද කාෂ්ඨය වේ. එහි විසතර ආඛ්‍යාතයෙහි වක්‍ෂ්‍යමාණ බැවින් මෙහි ප්‍රකාශ නොක රන්නෙමු. යථොක්ත කරණසාධනය ද ආධ්‍යාත්මික බාහ්‍යව යෙන් විවිධවේ, එහි ක්‍රියා සිද්ධය කරන්නාවූ කර්තෘහු පිළිබඳවූවක් ම තත් ක්‍රියා 'සිද්ධයට උපකාරවූයේ නම් ආධ්‍යාත්මික වේ. පූර්වොක්ත "කරණේන" යනු ආධ්‍යාත්මික කරණයි. "ශරේණ" යනු බාහ්‍ය කරණයි, මෙකී සියලු කර්තෘඊයෝ ද අභිහිතතන්හි ප්‍රථමා විභක්ති යෙන් ද අනභිහිතතන්හි තෘතීයාවිභක්තියෙන් ද යුක්තවෙත්. අන්‍යවූ කරණාදියද එසේයි.

a ප්‍රකෘත්‍යාදිභ්‍යඃ ව, ප්‍රකෘති ශබ්දාදීන් කෙරෙන් ද තෘතීයා විභක්තිය වේ.

b ප්‍රකෘත්‍යාදිභ්‍යඃ ශබ්දභ්‍යඃ, ප්‍රකෘති ආදි ශබ්දයන්කෙරෙන්; තෘතීයා ස්‍යාත්, තෘතීයා විභක්තිය වන්නේය. ප්‍රකෘත්‍යා, සවභාව යෙන්; චාරුඃ, මනොඥයි (විශිෂ්ටරූප ඇත්තේය.) ප්‍රායේණ, බොහෝ සෙයින්; අලඃ, අලඝයි. සුඛේන, සැපයෙන් හෙවත් සැපසේ; යාති, යෙයි. ගොත්‍රේණ, ගොත්‍රයෙන්; ගාග්‍යඃ ඉති, ගාග්‍ය යන; අර්ථඃ, අර්ථයි.

මේ "ප්‍රකෘති" ආදි ශබ්දයන් කෙරෙන් ප්‍රථමාදි අන්‍යවිභක්තීන් ගේද පැමිණීම ඇතිවත්ම ඇතම් තන්හි තදපවාදයෙන් තෘතීයා

---

† "ගාග්‍යස්‍ය ගොත්‍රම්" යි එක පොතකවත් නොදැකිණි.

a **"දානපාත්‍රෙ සම්ප්‍රදානකාරකෙ චතුර්ථී"**

b **සම්‍යක් ශ්‍රෙයොබුධ්‍යා ප්‍රදීයතෙ යස්මෙඅ තත්සම්ප්‍රදාන කාරකම්. වෙදවිදෙ ගාං දදාති; අන්‍යත්‍ර රාඥෙ දණ්ඩං දදාති, රජකස්‍ය වස්ත්‍රං දදාති.**

විභක්තිය වේයයි මෙහි කියනලදී, එහි "ප්‍රකෘත්‍යා වාරුෂ" යන තන්හි ක්‍රියාහුගේ අශ්‍රවණයෙන් කර්තෘකරණයන්ගේ ලැබීමනැති කල්හි සම්බන්ධාර්ථයාගේ පැමිණීම ඇතිවත්ම 'කෘතෂ' යන ක්‍රියානන්තරයකට කරණත්වයෙන් "ප්‍රකෘත්‍යා"යි තෘතීයා විය. "ප්‍රායෙන අලසෂ" යන තන්හි ප්‍රථමාහුගේ පැමිණීම ඇති වත්ම "ඥතෂ" යන ක්‍රියානන්තරාපෙක්ෂාවෙන් කරණත්වයට පැමිණ තෘතීයා විය, "සුඛෙන යාති" යන තන්හි ගමන ක්‍රියාවෙන් සාධ්‍යත්වයට පැමිණෙන්ම එහි කරණත්වවිවක්ෂාවෙන් "සුඛෙන" යි තෘතීයා විය. "ගොත්‍රෙණ ගාගර්‍ෂෂ" යන තන්හි "ගොත්‍රම්" යි ප්‍රථමාහුගේ පැමිණීම ඇතිවත්ම "ඥයතෙ" යන ක්‍රියානන්තරාපෙක්ෂාවෙන් කරණත්වය විවක්ෂිතවූයේනුයි "ගොත්‍රෙණ"යි තෘතීයා විය. "සමෙ නෙති, විෂමෙ ණෙති, විද්‍රොණෙන ධාන්‍යං ක්‍රිණාති" යනාදිය ද මෙසේයි. මෙසේ "ශෙෂාෂ" යනාදි සූත්‍රොක්ත "කර්තෘසාධනයොෂ" යන්න මුල්කොට තෘතීයාවිභක්තියට සුදුසුතැන් බොහොමයක් දක්වා ඉක්බිති "දානපාත්‍රෙ" යන්න මුල්කොට චතුර්ථී විභක්තියට යොග්‍යස්ථාන දක්වන්නාහු "දානපාත්‍රෙ" යනාදිය කිහු.

a දානපාත්‍රෙ; "දානපාත්‍රෙ" ඔයි සේයි (දානයට යොග්‍යවූ); සම්ප්‍රදානකාරකෙ, සම්ප්‍රදානකාරකයෙහි; චතුර්ථී, චතුර්ථී විභක්තිය වේ.

b සම්‍යක්, මනාකොට; ශ්‍රෙයොබුධ්‍යා, කල්‍යාණාධ්‍යාසයෙන්; යස්මෙ, යමෙකුට; ප්‍රදීයතෙ, දෙනුලැබේ ද; තත්, ඒ; සම්ප්‍රදාන කාරකම්, සම්ප්‍රදානකාරක නම් වේ. වෙදවිදෙ, වෙදය දන්නහුට; ගාම්, ගොධනය; දදාති, දෙයි (යන තන්හි "වෙදවිදෙ" යනු සම්ප්‍රදානකාරකයෙහි චතුර්ථීවි). අන්‍යත්‍ර, අන්තන්හි හෙවත් සම්ප්‍රදානරහිත තන්හි, රාඥෂ, රජහට; දණ්ඩං දදාති, දඬ දෙයි (කියාද); රජකස්‍ය, රජකයාට; වස්ත්‍රං, වස්ත්‍රය; දදාති, දෙයි (කියාද වේ). මෙහි ශ්‍රෙයොබුධ්‍යභාවයෙන් සම්ප්‍රදානනුවූයේ නුයි "රාඥෂ, රජකස්‍ය" සි ෂෂ්ඨී විය).

a දදාති දණ්ඩං පුරුෂෝ මහිපතෙ
නීවාපි භක්ෂ්‍යා නව දූනකාම්‍යයා,*
ශද්ධියතෙ වාසනයා සුපාත්‍රෙ
තත්සම්ප්‍රදානං කථිතං කවීන්ද්‍රෛඃ.

b (අනභිහිතෙ ඉත්‍යෙව, දූනීයෝ විප්‍රඃ) කිඛිත්සම්‍යක් ශ්‍රෙයොබුධ්‍යභාවෙපි මතුර්පි, "ව්‍යාඡන රසවෙ කර" ම්නි මහාකවිප්‍රයොගදර්ශනාත්. නවව සම්ප්‍රදානං නිර්විඛම්-ප්‍රෙරකම නිරාකර්තුකුමත්තඃ වෙති.

---

a පුරුෂඃ, (රාජ) පුරුෂතෙම; මහිපතෙඃ, රජහට; දණ්ඩං දදාති, දඩ දෙයි; භක්ෂ්‍යා අපි නව, (ඒ) භක්ෂියෙන්ද නොවේ; නව දූනකාම්‍යයා, දෙනුකැමැත්තෙන් ද නොවේ. (එහෙයින් "මහිපතයෙ"යි සම්ප්‍රදානය නොව "මහිපතෙඃ" යි ෂෂ්ඨී විය). වාසනයා, ලාභාශාවෙන්; යත්, යමක්; සුපාත්‍රෙ, යම්ගුණඅාජනවූ වෙකුට; දීයතෙ, දෙනු ලැබේ ද; කවීන්ද්‍රෛඃ, පණ්ඩිතොත්තමයන් විසින්, තත්, ඒ ගුණ අජනය, සම්ප්‍රදානං, සම්ප්‍රදානයයි; කථිතම්, කියනලදී.

මෙහි "දූනපාත්‍රෙ" යනාදියෙහි කී සම්ප්‍රදානලක්ෂණ නිර්වචන නයින් දක්වන්නාහු "සම්‍යක්ශ්‍රෙයොබුධ්‍යා" යනාදිය කීහු. මෙහි "දූන" නම් පූජාබුද්ධියෙන් හෝ අනුග්‍රහබුද්ධියෙන් යම් වස්තුවක් පිළිබඳ සවාධීනත්වය හැර පරාධීනත්වයෙන් අපුනර්ග්‍රහණය පිණිස දීමයි. කර්‍ම්හුගේ තදූනක්‍රියාවට (ඒ දූනය පිළිගැණීමට) යොග්‍යවූ කාරකය ප්‍රම්ප්‍රදාන නම් වේ, "රාඥෙ දණ්ඩං දදාති" යන තන්හි දණ්ඩදූනය අපුනර්ග්‍රහණය පිණිස වූවත් ශ්‍රෙයොබුද්ධිරහිත බැවින් (පූජානුග්‍රහබුද්ධිරහිත බැවින්) තත්ප්‍රතිග්‍රාහක රජහුගේ සම්ප්‍රදානත්වය නොව 'රාඥඃ'යි ෂෂ්ඨී විය. "රජකස්‍ය වස්ත්‍රං දදාති" යන තන්හි වස්ත්‍රදූනය කිඤ්චින්මාත්‍ර අනුග්‍රහබුද්ධියකින් වූවත් පුනර්ග්‍රහණය පිණිසවූ බැවින් තත්ප්‍රතිග්‍රාහක රජකයාගේ සම්ප්‍රදානත්වය නොව "රජකස්‍ය" යි ෂෂ්ඨී විය.

b අනභිහිතෙ ඉති එව, (ප්‍රත්‍යයාදියකින්) අනුක්තකල්හිම යයි කියයුතු වේ. (උක්තකල්හි)-දූනීයඃ, දූනාහීවූයේ; විප්‍රඃ, බ්‍රාහ්මණතෙමේයි. (මෙහි "දූනීයඃ" යන තන්හි සම්ප්‍රදූන කාරක "අනීය" ප්‍රත්‍යයෙන් "විප්‍රඃ" යනු උක්තසම්ප්‍රදූනාඛ්‍යයෙහි ප්‍රථමාවි). කිඛිත්, කියිතන්හි; සම්‍යක්, මොනවට; ශ්‍රෙයොබුද්ධිඅභාවෙ

---

* "නවාත්‍ර භක්ෂිර්නව දූනකාමතා" ඝමහර.

a **"තාහගෙන කම්මණා ව්‍යාපතං ප්‍රේරකං වානුමන්තෘ ච, අනිරාකතීෘ චෙතාහගත් සම්ප්‍රදානං ත්‍රිධා සමෘතම්.**

b **දෙහීති ප්‍රේරණකි තනෙප්‍රේරකම්, ඝථා-ඔටමවේ භික්ෂාං දදාති; යන්තු ඉදමහං දදාම්‍යන්‍යකෙන'නුමන්‍යතෙ ඔමින්‍යාහ තදනුමන්තෘ, ඝථා-ශිෂ්‍යෙ ගුරවේ භාං දදාති, යත්තු නානු මන්‍යතෙ න නිරාකරෝති තදනිරාකතීෘ, ඝථා-සුඝ්‍යාඝ්‍යං දදාති.**

අපි, කල්‍යාණාධ්‍යාසයක් නැති කල්හි ද; වතුර්‍ථී, වතුර්‍ථී විභක්තිය වේ. (එනම්)-ව්‍යාජේන රඝවෙ කරම් ඉති, "ව්‍යාජේන රඝවෙ කරම්" ඝන; මහාකවිප්‍රයොගදර්ශනාත්, මහාකවීන්ගේ ප්‍රයොග දක්නා හෙයිනි; (ව්‍යාජේන, අපරාන්තමහිපාලව්‍යාජයෙන්; රඝවෙ, රඝුභට; කරම්, බිලි දුන්නේය; ඝනු එහි අර්‍ථයි. මෙහි දන ක්‍රියාව ශ්‍රෙයොබුද්ධි රහිතව ව්‍යාජසහගතවූ බැවින් සම්ප්‍රදානාඛ්‍ය නුවූවත් "රඝවෙ"යි වතුර්‍ථී විභක්තියෙන් යෙදීම මහාකවීන්ට අභිමත විය) තවද සම්ප්‍රදානම්, ඒ සම්ප්‍රදානයද; ත්‍රිවිධම්, තුන් වැදෑරුම් වේ. එනම්-ප්‍රෙරකම්, ප්‍රේරක සම්ප්‍රදානය; අනිරාකතීෘ, අනිරාකතීෘ සම්ප්‍රදානය, අනුමන්තෘ ව ඉති, අනුමන්තෘ සම්ප්‍රදානය දැයි කියායි.

a තාහගෙන කම්මණා, තාහග ක්‍රියාවෙන්; ව්‍යාපතම්, ව්‍යාපතවූ (විශෙෂයෙන් පැමිණෙන ලද්දවූ); එතත් සම්ප්‍රදානම්, මේ සම්ප්‍රදානය; ප්‍රෙරකං ව, ප්‍රේරකය ද; අනුමන්තෘ ව, අනුමන්තෘ ද; අනිරාකතීෘ ව ඉති, අනිරාකතීෘ දැයි; ත්‍රිධා, තුන්පරිද්දෙකින්; සමෘතම්, දන්නාලදී. (මෙහි සම්ප්‍රදාන කාරකය ප්‍රේරකාදි වශයෙන් ත්‍රිභෙද කොට දක්වා තල්ලක්‍ෂණ නිරූක්තිනයින් දක්වන්නාහු "දෙහීති" ඝනාදිය කිහු.

b දෙහීති, (මට) දෙවයි; ප්‍රේරයති, (ඝමෙක් දනකතීෘහු මෙහෙ ඝාද; තත්, ඒ (ප්‍රේරණය කරන්නේ); ප්‍රෙරකම්, ප්‍රේරක නම් වේ. ඝථා, එනම්; බටවෙ, තාපසයාට නොහොත් කොලුවාට; භික්ෂාම්, භික්ෂාව; දදාති, දෙයි. (ඝනු ඊට උදාහරණයි); මෙහි "බටවෙ" ඝන්නෙහි සම්ප්‍රදානත්වය දන කර්‍තෘහු ක්‍රියාවෙහි මෙහෙයා ලත් බැවින් ප්‍රේරක වේ. (තාපසයන්ගේ දෙවයි කියා මෙහෙයීම වනාහි වාක්සමාචාරයෙන් නොව කායසමාචාරයෙන් වේ). ඝත්තු, ඝම් සම්ප්‍රදානයක් නෙම වනාහි; ඉදම්, මෙය; අහම්, මම, දදාම්

a "ක්‍රියයා යමභිප්‍රෙති සොපි සම්ප්‍රදානම්"-පත්‍යෙ ශෙතෙ.

ඉති, දෙම්සි; උකෙන, කි කල්හි; අනුමන්‍යතෙ, (දානඝතීන්ගේ ප්‍රොත්සාහය පිණිස අනුමත කෙරේද; ඔම් ඉති, ඔම් කියා (යහ පත්යසි); ආහ, කියාද; තත්, ඒ (සම්ප්‍රදානය); අනුමන්තෘ, අනුමන්තෘ නම් වේ. යථා, එනම්; ශිෂ්‍යඃ, ශිෂ්‍යතෙම; ගුරවෙ, ගුරුහට; ගාම්, ගොධනය; දදාති, දෙසි; (යනු ඊට උදාහරණයි මෙහි "ගුරවෙ" යන්නෙහි සම්ප්‍රදානත්වය ශිෂ්‍යයාගේ දානක්‍රියාවට අනුමතවීමෙන් ලත් බැවින් "අනුමන්තෘ" නම් වේ). යත්තු, යම් සම්ප්‍රදානකාරකයක් වනාහි; න අනුමන්‍යතෙ, අනුමත නොකෙරේද; නතිරාකරොති. නිවාරණයත් නොකෙරේද (දානක්‍රියාව නොවළක්වාද : තත්, ඒ (සම්ප්‍රදානය); අනිරාකතීඃ, අනිරාකතීඃ නම් වේ. යථා, එනම්; සූයමීඃය, සූයමීයාට; අඝ්‍යම්. පූජොපහාර ජලය; දදාති, දෙයි (යනු ඊට උදාහරණයි). මෙහි "සූයමීඃය" යන්නෙහි සම්ප්‍රදානත්වය කතීෘන්ගේ දානක්‍රියාව අනුමත නොකිරීමෙන් හා ඒ නිවාරණය නොකිරීමෙන්ද ලත් බැවින් "අනිරාකතීඃ" නම් වේ.)

a ක්‍රියයා, ක්‍රියාවෙන්; යම්, යමෙකු; අභිප්‍රෙති, (කතීෘතෙම) අභිප්‍රාය කෙරේද; සඃ අපි, ඔතෙමේ ද; සම්ප්‍රදානම්, සම්ප්‍රදාන නම් වේ. පත්‍යෙ සවාමියාට අභිමුඛව; හෙවත් සවාමියා අනුකූල කරන්නට (පක්ෂපාත කරන්ට); ශෙතෙ, ශයනය කෙරේ. (මෙහි පත්නියගේ "ශෙතෙ" යන ශයන ක්‍රියාවෙන් සවාමියාගේ අභිමුඛභාවය හෝ අනුකූලත්වය අභිප්‍රෙත බැවින් තත් සවම්යා "පත්‍යෙ' සි සම්ප්‍රදාන විය.

මෙකී සම්ප්‍රදාන විෂයෙහි ඵලිතාර්ථය දක්වන්නාවූ සිබාන්න කොමුදී සරලාටීකාකාරයෝ "සවක්‍රියා යත්ක්‍රියොද්දෙශිකා තත් සම්ප්‍රදානමිති ඵලිතාර්ථඃ" යනු කිහු, (යම් කිසිවෙකුගේ සවකීය ක්‍රියාව යමෙකුගේ ක්‍රියාවක් උද්දෙශකොට ඇත්නී නම් තදුද්දිශ්‍යයා සම්ප්‍රදාන වේ යනු මෙහි ඵලිතාර්ථය (මූලු අදහස) යනු මෙහි අර්ථයි. මෙසේ කියා තත්ඵලිතාර්ථත්වය විස්තරකරන්නාහු "භවති ච පත්‍යෙ ශෙතෙ ඉත්‍යාදෙඃ !පත්නීශයනං පතිශයන ඵලකමිති පත්‍යුඃ සම්ප්‍රදානතා, අත්‍ර ක්‍රියා'කාමීකෙවෙති සම්ප්‍රදාය විදඃ" යනු කිහු. "පත්‍යෙ ශෙතෙ" යනාදියෙහි පත්නියගේ ශයන ක්‍රියාව පතියහුගේ ශයන ක්‍රියාව ඵලකොට ඇති බැවින් පතියහුගේ සම්ප්‍රදානත්වය වේ. මෙහි කී මේ ක්‍රියාව නම් අකර්මකක්‍රියාවක්ම

a "විශෙලෂාවධෙෘ පඤ්චමී"

b **විශ්ලෙෂෂ විභාගඝනත්‍ර යොවඩිශවලතයා අවලතයා වා විවක්ෂිතඝනඝ්‍රාපාදනෙ පවමී. (විශ්ලෙෂෂ නාම සංයොග පූර්ෂකො විභාගඃ, ආධාරාධෙයයොර්මධ්‍යෙ ආධාරතොන්‍ය යො ඝ්‍රුයමානඃ සොවධිඃ, ආධියතෙනෙනාෂෙෘ=ආධාරඃ, ආධාතුං යොග්‍ය ආධෙයඃ). ධාවතාශවාදපතන්, භූහෘතොවතරති ගඞ්ගා.**

විධයුතුයයි සම්ප්‍රදාය දන්නෝ කිහු යනු මෙහි අර්ථයි, මින් ප්‍රකාශිතවූයේ කර්තෘහුගේ ක්‍රියාව යමෙකු පිළිබඳ ක්‍රියාවක් ඵලය කොට පවතී නම් තත්ක්‍රියාශ්‍රය පදාර්ථය සම්ප්‍රදානය වනබව ද, ඒ කර්තෘහුගේ ක්‍රියාව අකර්මකක්‍රියාවක් විය යුතු බව ද වේ.

මෙසේ "දානපාත්‍රෙ" යන්න මූල්කොට සම්ප්‍රදානයට යොග්‍ය සථාන බොහොමයක් දක්වා ඉක්බිති "විශෙලෂාවධෙෘ" යන්න මූල්කොට අවධිකාරකය විසතර කරන්නාහු "විශෙලෂාවධෙෘ" යනාදිය කිහු.

a **විශෙලෂාවධෙෘ,** විශෙෂණයෙහි ඉමවූ අවධිකාරකයෙහි; පඤ්චමී, පඤ්චම්විභක්තිය වේ.

b **විශ්ලෙෂෂඃ**, විශ්ලෙෂ නම්; විභාගඃ, විවෙර්දයයි; හෙවත් **පෘථග්භාවයයි**. තත්‍ර, එහි; යඃ අවධිඃ, යම් ආශ්‍රයක් (ආධාරත්වයෙන් සිටි ඉමක්; චලතයා. චලස්වභාවයෙන් හෝ; අචලතයාවා, අචලස්වභාවයෙන් හෝ; විවක්ෂිතඃ, විවක්ෂාකරණලද්දේ වේද; තත්‍රාපාදනෙ, ඒ (අවධිඝඛ්‍යාත) අපාදානකාරකයෙහි; පඤ්චමී, පඤ්චම්විභක්තිය වේ. විශ්ලෙෂෂඃ නාම්, විශ්ලෙෂ නම්; සංයොග පූර්ෂඃ, සංයොගයක් (එකතුවීමක්) පූර්ෂකොට ඇත්තාවූ; විභාගඃ, විවෙර්දයයි. ආධාරාධෙයයොඃ මධ්‍යෙ, ආධාර ආධෙය දෙක අතුරෙන්; ආධාරතොන්‍ය, ආධාරභාවයෙන්; ඝ්‍රුයමානඃ, දන්නා ලබන්නාවූ; යඃ, යමක් වේද; සඃ, හෙතෙම; අවධිඃ, අවධි නම් වේ. අනෙන, මොහුවිසින්; ආධියතෙ ඉති. දරණුලැබේනුයි; අසෞ, මෙතෙම; ආධාරඃ ආධාර නම් වේ. ආධාතුම්, දරාගන්නට; යොග්‍යඃ, යොග්‍යවූයේ; ආධෙයඃ, ආධෙය නම් වේ. ධාවතඃ, දුවන්නාවූ; අශ්වාත්, අශ්වයාකෙරෙන්; අපතත්, වැටුනේය. (මෙහි "අශ්වාත්" යනු වියොගයෙහි චලභාවයෙන් විවක්ෂිත හෙයින් චලාපාදානයි). ගඞ්ගා, ගඞ්ගාතොමෝ; භූහෘතඃ, පර්වත යෙන්; අවතරති, ගලාබසී (මෙහි "භූහෘතඃ" යනු වියොගයෙහි

අවලඟාවයෙන් විවක්ෂිතකෙයින් අවලාපාදනයි) ආධාරාධෙයත්ව යෙන් සංයොගවූ යම් වසතුදෙකක් අතුරෙන් ආධාරයාකෙරෙන් ආධෙයයාගේ වෙන්වීම වේ නම් ඒ ආධාරවූ වසතුව අවධි සඞ්ඛ්‍යාත අපාදානයයි ද ඔහුකෙරෙන් පඤ්චම්විභක්තිය වේයයි ද ඒ වෙන්වීම ආධාරවසතුහුගේ වචලත්වයෙන් හා නිශ්චලත්වයෙන් ඵල වෛවිධ්‍යයෙන් ම වේයයි ද යනු මෙහි ඵලිතාර්ථයි. මෙකී අවධිලක්ෂණ දක්වන්නාවූ භර්තෘහරීන්වහන්:-

"අපායෙ යදුදසිතං වලං වා යදි වාවලං,
ධ්‍රුවමෙවාතදාවෙශාත් තදපාදානමුච්‍යතෙ.
පතතෝ ධ්‍රුව එවාශ්වෝ යසමාදශ්වාත් පතත්‍යසෞ,
තස්‍යාපාශ්වස්‍ය පතනෙ කුඛ්‍යාදි ධ්‍රුවමිෂ්‍යතෙ.
මෙෂානතරක්‍රියාපෙක්ෂමවධිත්වං පෘථක් පෘථක්,
මෙෂයොඃ සවක්‍රියාපෙක්ෂං කතෘත්වඤ්ච පෘථක් පෘථක්."

යනු කියනලදී. අපායසඞ්ඛ්‍යාත විශ්ලෙෂය සාධ්‍යකල්හි යම් ධ්‍රුවයක් (සථිරවසතුවක්) වේ නම් ඒ අපාදානයයි කියනුලැබේ. ඒ එහි විශ්ලෙෂජනකක්‍රියාවක්හුගේ අනුප්‍රවෙශය නැතිහෙයිනි, හෙ ද වල අවල උදසිතයයි ත්‍රිවිධ වේ. (කෙසේදයත්)? වැටෙන්නාවූ යම් අශ්වයෙකු කෙරෙන් මෙතෙමේ වැටේ යයි කීකල්හි අශ්වතෙමේ ම ධ්‍රුවය වේ, ඒ අශ්වයාගේ ද වැටීමෙහිදී (ඔහුගේ වැටීමට ඉමවූ) භූතභූදිය ධ්‍රුවයයි අභිමත වේ. එඑවන් දෙදෙනෙකු අතරවූ ක්‍රියාවන් අපෙක්ෂා කොට ඇත්තාවූ අවධිභාවය වනාහි වෙන් වෙන් වශයෙන් වේ. ඒ එඑවන් දෙදෙනාගේ සවකීය ක්‍රියාව අපෙක්ෂා කොට ඇත්තාවූ කර්තෘභාවය ද වෙන් වසයෙන් වේ යනු මෙහි අර්ථයි.

මේ ශ්ලොකත්‍රය "ධ්‍රුවමපායෙපාදානම්" යන පාණිනීය සූත්‍රය ඇසුරු කොට කියනලදී. මේ සූත්‍රයෙහි තත්ත්වාර්ථය නම් අපායසඞ්ඛ්‍යාත වියොග ඵජනකව්‍යාපාරය ආශ්‍රයකොට නැත්තාවූ ධ්‍රුවය අපාදානය යනුයි, මෙහි ධ්‍රුවය අපාදාන යයි කීමෙන් විශ්ලෙෂක්‍රියාජන්‍යකර්තෘභට අපාදානත්වය නොලැබේ. මෙහි ඒ විස්තර කරන්නාහු විශ්ලෙෂය ඇතිකල්හි තද්විශ්ලෙෂජනක ක්‍රියාශ්‍රයරහිත ධ්‍රුවය ම අපාදාන යයි කියා "පතතඃ"යනාදිය ඊට නිදර්ශන කළාහ, එනම් 'කුඛ්‍යාතපතතොශ්වාද් මෛත්‍රඃ පතති" යන තන්හි මෛත්‍රයාගේ පතනයෙහි අශ්වයා ද, අශ්වයාගේ පතනයෙහි කුඛ්‍යාදිය ද ධ්‍රුවය වේ. සමහරතන්හි විශ්ලෙෂක්‍රියා ශ්‍රය ඇති දෙකක් එකිනෙකට අවධි වන බවත් තද්විශ්ලෙෂයෙහි

a "සම්බන්ධෙ ෂෂ්ඨී"

b සම්බන්ධිනොශ්චඛ්‍ය යොප්‍රධානඤ්ච ෂෂ්ඨී.

කතීඃඛ්‍යය ද ලබන බවත් ප්‍රකාශකරණු පිණිස "මේෂාන්තර" යනා දිය කිහු. එනම්-"මේෂාවපසරතඃ" යනුවෙන් එළුවෝ දෙදෙනා වෙන් ව යෙත් කිකල්හි අපසරණ ක්‍රියා ශ්‍රයෙන් එළුවන් දෙදෙනා, ගේ එකිනෙකට අවධිභූය ද කතීඃඛ්‍යය ද වේ. මෙකී අවධිය බොහෝ තන්හි වලාවල වශයෙන් විවිධ යයි දක්නා ලැබේ. උදාසීන හෙදය ද ඇතම් තන්හි දක්නා ලැබේ. ඒ "රාඥෙධනං ගෘණාති විප්‍රඃ" යනාදියෙහි යයි ඕතිය හැකි වේ. අවධියෙහි විෂයභෙද දක්වන්නාහු:-

"නිර්දිෂ්ටවිෂයං කිඤ්චිදුපාත්තවිෂයං තථා,
අපෙක්ෂිතක්‍රියඤ්චෙති ත්‍රිධාපාදානමිෂ්‍යතෙ"

යනු කීහු. කිසි අවධියෙක් දක්වනලද ක්‍රියාව විෂයකොට ඇත්තේ ද, කි වෙක් අධ්‍යාහාරකරණලද ක්‍රියාව විෂයකොට ඇත්තේ ද, කිසිවෙක් අපෙක්ෂාකරණලද (සිතාගත්නාලද) ක්‍රියාව විෂයකොට ඇත්තේ දැයි කියා අපාදානය තුන්පරිද්දෙකින් අභිමත වේ යනු මෙහි අර්ථයි මෙහි "වෘක්ෂාත් පත්‍රං ඵතති" යන තන්හි අපාදානාර්ථවූ "පතති" යන ක්‍රියාව නිර්දිෂ්ට බැවින් "වෘක්ෂාත්" යනු නිර්දිෂ්ටවිෂයාපාදානයි. "වලාහකාද් විද්‍යොතතෙ විද්‍යුත්" යන තන්හි "වලාහකාත්" යනු නිඃසරණ පුර්‍ව්ක විද්‍යොතනාර්ථක්‍රියායොගයෙහි "නිඃසෘත්‍ය" යි අධ්‍යාහාර්‍ය්‍ය ක්‍රියාව විෂයකොට ඇති බැවින් උපාත්තවිෂයාපාදානයි. ගමනය කරන්නෙකු දැක "කුතො භවාන්"යි ප්‍රශ්න කිරීමෙහි යුක්තවූ "කුතඃ" යන අපාදානය "ආගතඃ" යනාදීන් අපෙක්ෂිත ගමනාර්ථ ක්‍රියාව විෂය කොට ඇති බැවින් අපෙක්ෂිත ක්‍රියාවිෂයාපාදානයි. (මෙසේ "විශ්ලෙෂාවධෙඃ" යන්න මුල් කොට අපාදානලක්ෂණ හා තද්යොග්‍යස්ථාන සවල්පයක් දක්වා නැවත "සම්බන්ධෙ" යන්න මුල්කොට සම්බන්ධලක්ෂණාදිය දක්වන්නාහු "සම්බන්ධෙ ෂෂ්ඨී" යනාදිය කිහු).

a සම්බන්ධ, සම්බන්ධාර්ථයෙහි; ෂෂ්ඨී, ෂෂ්ඨී විභක්තිය වේ.

b සම්බන්ධිනොඃ මධ්‍යෙ, සම්බන්ධය ඇත්තවුන් දෙදෙනෙකු අතුරෙන්; යඃ, යමෙක්; අප්‍රධානඃ, අප්‍රධාන වේ ද; තත්‍ර, එහි; ෂෂ්ඨී, ෂෂ්ඨී විභක්තිය වේ.

a "හෙද්‍යහෙදකයෝඃ ශ්ලිෂ්ටඃ*සම්බන්ධොලන්‍යෝලන්‍යමුච්‍යතෙ,
විශෙෂා යද්‍යපි සම්බන්ධඃ ෂෂ්ඨ්‍යුත්පත්තිහෙතවඃ හෙදකාත්.

b හෙද්‍යං විශෙෂ්‍යමිත්‍යාහුර්භෙදකං තු විශෙෂණම්,
විශෙෂ්‍යනතු ප්‍රධානං ස්‍යාදප්‍රධානං විශෙෂණම්.

c ප්‍රධානාප්‍රධානයොර්ම්ඩෙ'ප්‍රධානෙ ෂෂ්ඨී, ක්‍රියානවසි ප්‍රධානං
ක්‍රියානඩ්‍යප්‍රධානම්.

d රාඥඃ ස පුරුෂො ඥෙයඃ පිත්‍රොරෙතත්ප්‍රපූජනම්,
ගුරූණාං වචනං පථ්‍යං කවීනාං රසවද්වචඃ

---

a හෙද්‍යහෙදකයෝඃ, හෙදහෙදක දෙදෙනාගේ; අන්‍යොන්‍යං ශ්ලිෂ්ටඃ, ඔවුනොවුන් පිළිබඳ එකතුවීම; සම්බන්ධඃ, සම්බන්ධ නමැයි; උච්‍යතෙ, කියනු ලැබේ. යදි ඉදින්; සම්බන්ධඃ, සම්බන්ධයතෙම; විශෙෂඃ අපි, දෙදෙනකු කෙරෙහි පිහිටි නුමුත්; ෂෂ්ඨ්‍යුත්පත්තිහෙතවඃ තු, ෂෂ්ඨිවිභක්තිහුගේ උත්පත්තිය වනාහි; හෙදකාත්, හෙදකයා කෙරෙන් (විශෙෂණයා කෙරෙන්) වේ.

b හෙද්‍යම් හෙද්‍යඃ, විශෙෂ්‍යම් ඉති, විශෙෂ්‍යයයි; අහුඃ, කියත්; හෙදකං තු, හෙදකඃ වනාහි; විශෙෂණම්, විශෙෂණයයි කියත්; විශෙෂ්‍යං තු විශෙෂ්‍යඃ වනාහි; ප්‍රධානං ස්‍යාත්, ප්‍රධාන වන්නේය; විශෙෂණම්, විශෙෂණඃ; අප්‍රධානම්, අප්‍රධාන වන්නේය.

c ප්‍රධාන අප්‍රධානයොඃ මඬෙ, ප්‍රධාන අප්‍රධාන දෙදෙනා අතුරෙන්; අප්‍රධානෙ, අප්‍රධානයා කෙරෙහි; ෂෂ්ඨී ෂෂ්ඨිවිභක්තිඃ වේ; ක්‍රියාඅඩ්‍යයි, ක්‍රියාව අනුව යන්නේ; ප්‍රධානම්, ප්‍රධාන වේ; ක්‍රියා අනඩ්‍යයි, ක්‍රියාව අනුව නොයන්නේ; අප්‍රධානම්, අප්‍රධාන වේ.

d සඃ, හෙතෙම; රඥඃ, රජහුගේ; පුරුෂඃ, පුරුෂයයි; ඥෙයඃ, දතයුතු; එතත්, මෙය; පිත්‍රොඃ, මවුපිය දෙදෙනාගේ; ප්‍රපූජනම් ප්‍රකෂ්ට පූජාව හෙවත් පූජොපකරණය වේ; ගුරූණාම්, ගුරුන් සම්බන්ධවූ; වචනම්, වචනය; පථ්‍යම්, හිතකර වේ; කවීනාම්, කවීන් සම්බන්ධවූ; වචඃ, වචනය; රසවත්, රසයුක්ත වේ හෙවත් මිහිරි වේ; (මෙහි "රාඥඃ පිත්‍රොඃ, ගුරූණාම්, කවීනාම්" යන තන්හි සම්බන්ධාර්ථයෙහි ෂෂ්ඨියි.)

---

* ශ්ලිෂ්ටඃ-සමහර.

a සෙව්‍යසෙවකභාවසම්බන්ධඃ පූජ්‍යපූජකභාවසම්බන්ධෝ බෝධ්‍යබෝධකභාවසම්බන්ධෝ වාච්‍යවාචකභාවසම්බන්ධ ඉති සම්බන්ධශ්චතුර්විධඃ.

---

a සෙව්‍යසෙවකභාවසම්බන්ධඃ, සෙව්‍යසෙවකභාවසම්බන්ධය (සෙවනයකටයුත්ත හා සෙවනය කරන්නාය යන දෙදෙනා ලක්‍ෂණ කොට ඇති සම්බන්ධය); පූජ්‍යපූජකභාවභාවසම්බන්ධඃ පූජ්‍ය-පූජක භාවසම්බන්ධය (පිදියයුත්ත හා පුදන්නාය යන දෙදෙනා ලක්‍ෂණ කොට ඇති සම්බන්ධය); බෝධ්‍යබෝධකභාවසම්බන්ධඃ බෝධ්‍යබෝධක භාවසම්බන්ධය (අවබෝධ කටයුත්තය අවබෝධ කරන්නාය යන දෙදෙනා ලක්‍ෂණ කොට ඇති සම්බන්ධය); වාච්‍යවාචකභාවසම්බන්ධඃ ඉති, වාච්‍යවාචකභාවසම්බන්ධය (කියයුත්තය කියන්නාය යන දෙදෙනා ලක්‍ෂණකොට ඇති සම්බන්ධය කියා; සම්බන්ධඃ, (මෙහි කී) සම්බන්ධය; චතුර්විධඃ, සිවුවැදෑරුම් වේ.

මෙහි පළමුකොට "සම්බන්ධෙ ෂෂ්ඨී" යනුවෙන් සම්බන්ධාර්ථ යෙහි ෂෂ්ඨී විභක්තිය වේයයි කියා තත් සම්බන්ධලක්‍ෂණ දක්වන්නාහු "භෙද්‍යභෙදකයොඃ" යනාදිය කිහු. එනම්- භෙද්‍යභෙදක ලක්‍ෂණවූ විශෙෂ්‍යවිශෙෂණ දෙනාක්හුගේ එකතුවීම සම්බන්ධයයි ද ඒ සම්බන්ධය වනාහි එක්නෙකා (භෙද්‍යභෙදක දෙදෙනාම) පිළිබඳ යයි ද කියා නැවත ඒ සම්බන්ධය භෙද්‍යභෙදක දෙදෙනාම පිළිබඳ වුවත් ෂෂ්ඨී විභක්තිහුගේ පැමිණීම භෙදකයා (විශෙෂණයා) කෙරෙන්ම වේ යයි කිහු. පසුව 'භෙද්‍යං විශෙෂ්‍ය" යනාදියෙන් මෙහි කී "භෙද්‍ය" නම් විශෙෂ්‍යයයි ද "භෙදක" නම් විශෙෂණයයි ද එහි විශෙෂ්‍යය ප්‍රධානයයි ද විශෙෂණය අප්‍රධානයයි ද කියා ඒ ප්‍රධානාප්‍රධාන ලක්‍ෂණ දක්වන්නාහු "ක්‍රියාඛ්‍යෙ ප්‍රධානම්" යනාදිය කිහු. එනම් "රාඥඃ පුරුෂො භවති" යනාදියෙහි "රාජන්, පුරුෂ" දෙදෙනාගේ සෙව්‍යසෙවකභාවසම්බන්ධයෙහි "භවති" යන ක්‍රියාව අනුව යන්නාවූ පුරුෂපදජන්‍ය ප්‍රධානයයි ද ඊට විශෙෂණව (එය වෙනස් කොට) සිටි රාජපදජන්‍ය ක්‍රියාව අනුව නොයන බැවින් අප්‍රධානයයි ද කිහු. නැවත "රාඥඃ" යනාදීන් සම්බන්ධයට උදාහරණ දක්වා මෙකී සම්බන්ධය වනාහි සෙව්‍ය සෙවක ලක්‍ෂණාදි වශයෙන් නානාප්‍රකාර වේ යයි දක්වනු පිණිස "සෙව්‍යසෙවකභාව" යනාදිය කිහු. එනම්- "රාඥඃ, පුරුෂඃ" යන තන්හි රජතෙමේ සෙවනය කටයුත්තේ ද පුරුෂතෙමේ සෙවනය කරන්නේ ද වේ. එබැවින් ඒ දෙදෙනාගේ සම්බන්ධය සෙව්‍ය

a "ආධාරෙ සපතමී"

b ආධාරෝ නාමාධිකරණම්, තත් ත්‍රිවිධම්-ඖපශ්ලේෂිකං සාමීපිකමභිව්‍යාපකං වෛෂයිකං චෙතී. ඖපශ්ලේෂිකං ත්‍රිවිධමිති චෙෂාෂ්ඨීන්මතම්. යථා-එකදෙශවතති අභිව්‍යාප්‍යවතති ව්‍යඤනවතත්ති.*

සෙවකභාවසම්බන්ධය වේ. මෙහි කි "ප්‍රත්‍රෝඃ" යනාදි පූජ්‍යපූජක භාවසම්බන්ධාදිය ද මේ ක්‍රමයෙන් දතයුතුයි. මෙහි මෙය සෙව්‍ය සෙවකභාවාදිවශයෙන් චතුර්විධ යයි කිව ද "ජන්‍යජනක, අව යවාවයවී, ගුණගුණී, සමූහසමූහී, පාල්‍යපාලක, වාහ්‍යවාහක, ව්‍යාප්‍යව්‍යාපක" භාවාදිවශයෙන් බහුවිධ වේ.

"ශෙෂෙ ෂෂ්ඨී" යන පාණිනීයසූත්‍රය ඇසුරුකොට සම්බන්ධ ලක්ෂණ දක්වන්නාවූ හර්‍යෘහරින්විසින්:-

"සම්බන්ධඃ කාරකෙභ්‍යොන්‍යඃ ක්‍රියාකාරකපූර්‍වකඃ,
අශ්‍රුතායාං ශ්‍රුතායාං වා ක්‍රියායාමභිධීයතෙ".

යනු කියනලදී-කතෘකර්මාදිකාරකයන්කෙරන් ව්‍යතිරික්තවූ ක්‍රියාකාරකදෙදෙනා පූර්‍වීකොට ඇති පදාර්‍ථයතෙම සම්බන්ධ නම් වන්නේය. "රාඥඃ පුරුෂඃ" යනාදියෙහි ක්‍රියාව උච්චාරණය නොකරණලද කල්හි ද, "මාතුඃ සමර්‍යතෙ" යනාදියෙහි ක්‍රියාව උච්චාරණය කරණකල්හි ද (ඒ සම්බන්ධයතෙම) කියනුලැබේ යනු එහි අර්‍ථයි. මෙහි ප්‍රකාශිතවූයේ සම්බන්ධය කාරකයන් කෙරෙන් අනෙකක් බව ද එහෙත් එය ක්‍රියාකාරයන් පූර්‍වීකොට ඇත්තක් බව ද එය ක්‍රියාවක්හුගේ උච්චාරණය ඇතත් නැතත් වන බව ද වේ. එනම්-'රාඥඃ පුරුෂඃ" යන තන්හි "රාඥඃ"යන්න කාරකයෙන් අන්‍යවූවත් එහි සම්බන්ධ්‍යය වනාහි අශ්‍රුතවූ සෙවනාදික්‍රියාවක් හා තත් ක්‍රියාකාරකකර්තෘත්වාදියක් ද පූර්‍වීකොට ඇතිවූයේ වේ. "මාතුඃ සමර්‍යතෙ" යන තන්හි සම්බන්ධ්‍යය ශ්‍රුතවූ සමරණක්‍රියාව හා තත්කර්මත්වය ද පූර්‍වීකොට වූයේ වේ. මෙසේ "සම්බන්ධෙ" යන්න මූල්කොට "සම්බන්ධලක්ෂණාදිය දක්වා තැවත "ආධාරභාවයොඃ" යන්න මූල්කොට ආධාර භාවලක්ෂණාදිය දක්වන්නාහු "ආධාරෙ සපතමී" යනාදිය කිහු.

a ආධාරෙ, ආධාරකාරකයෙහි; සපතමී, සපතමීවිභක්තිය වේ.

b ආධාරඃ නාම්, ආධාර නම්; අධිකරණම්, අධිකරණයයි; තත් ඒ අධිකරණය; ත්‍රිවිධම්, සවැදෑරුම් වේ. (එනම්)-ඖපශ්ලේෂිකම්

---

* ව්‍යඤනවතති-සම්හර.

a කතෙ ශයනෙ කුමාරෝ'සෙෂ වතෙ ගාවඃ සුශෙරතෙ
තිලෙෂු විද්‍යමන තෙලං හෘදි බ්‍රහම්මඃ නං පරම්.

b යුඩෙ සනනහ්‍යතෙ ධීරඅඬ්ගුල්‍යග්‍රෙ කතිණාං ශතම්
භූභෘත්සු පාදපාඃ සගාණි ගඛගාඝාං වරවාලුකාඃ.

ඔපශ්ලෙෂිකාධිකරණය, (උපරිභාවයෙන් හෝ සමීප භාවයෙන් ආධෙයයාගේ සම්බන්ධය ඇති ආධාරය); සාමීපිකම්, සාමීපිකාධිකරණය (ආධෙයයාගේ සමීපභාවයෙහිවූ හෝ සම්පභාවය ඇති ආධාරය); අභිව්‍යාපකම්, අභිව්‍යාපකාධිකරණය (ආධෙයයෙන් හාත්පසින් පැතිරගන්නාලද ආධාරය); වෛෂයිකම්, වෛෂයිකාධිකරණය (ආධෙයයාගේ විෂයෙහිවූ හෙවත් අන්‍යත්‍ර භාවයෙහිවූ ආධාරය); නෛමිත්තිකම්, නෛමිත්තිකාධිකරණය (ආධෙයයට හෙතුවූ හෝ ආධෙයය ඵලය කොට ඇති ආධාරය); ඔපචාරිකඤ්ච ඉති, ඔපචාරිකාධිකරණයයි; (ආධෙයයාගේ උපචාරයෙහිවූ හෝ උපචාරය ඇති ආධාරයයි කියයි); ඔපශ්ලෙෂිකම්, (යථොක්ත) ඔපශ්ලෙෂිකාධිකරණය; ත්‍රිවිධම් ඉති, තුන්වදුරුම් යයි; කෙෂාඤ්චිත්, කිසිවෙකුන්ගේ; මතම්, මතයයි අදහසයි); යථා එනම්; එකදෙශවෘත්ති, (ආධෙයයාගේ) එක් දෙසක් වැලඳ ගැණීම ඇත්තය; අභිව්‍යාප්‍යවෘත්ති, (ආධෙයය හා) සාකල්‍යයොගයෙන් වැලඳගැණීම ඇත්තය; ව්‍යප්‍තාවෘත්ති ඉති, (ආධෙයයෙන්) ආකුලව වැලඳ ගැණීම ඇත්තය; හෙවත් තන්හි තන්හි ආධෙයයාගේ වැලඳ ගැණීම ඇත්තය කියයි.

a අසෙෂ කුමාරඃ, මේ කුමාරතෙම; තවෙ, සළාලෙහි; (කළාලය වැලඳගෙණ); ශෙතෙ, ශයනය කෙරේ; (මෙහි 'තවෙ" යනු ඔපශ්ලෙෂිකාධාරයි); ගාවඃ, ගොධෙනූහු; වවෙ, නුගරුක සමීපයෙහි; සුශෙරතෙ; හොවිත්; (මෙහි "වවෙ" යනු සාමීප්‍යාධාරයි; තිලෙෂු, තිලබීජයන්හි හෙවත් තිලබීජයන් පැතිර; තෙලම්, තෙල; විද්‍යතෙ, විද්‍යමාන වේ. (මෙහි "තිලෙෂු" යනු අභිව්‍යාපිකාධාරයි), හෘදි හෘදයශ්‍රියයෙහි, අමෘතම්, මරණශූන්‍යවූ හෙවත් සුඛස්වරූපවූ; පරම්, උතුම්වූ, බ්‍රහම, බ්‍රහමතෙම පවතී. (මෙහි "හෘදි" යනු වෛෂයිකාධාරයි.)

b ධීරඃ, ධෛර්‍යවත් ඇත්තේ; යුඩෙ, යුඬය නිමිතිකොට; සන්නහ්‍යතෙ, කවච දරයි; (මෙහි "යුඩෙ" යනු නෛමිත්තිකාධාරයි); අඬ්ගුල්‍යග්‍රෙ, ඇඟිලි අග හෙවත් ඇඟිලි අග උපචාර කොට;

කරිණාං ශතම්, ඇතුන් සියයක් පවතී; (මෙහි "අඞ්ගුල්‍යග්‍රෙ" යනු ඕපචාරිකාධාරයි), භූහෘත්සු, පඨිතයන්හි; පාදපාඃ, වෘක්ෂයෝ; සන්ති, ඇත්තාහ; (මෙහි "භූ භෘත්සු" යනු අභිව්‍යාප්‍යවෘත්තියි ඕපශ්ලෙෂිකාධාරයි); ගඞ්ගායාම්, ගඞ්ගාවෙහි; වරවාලුකාඃ, උතුම් වැලි ඇත්තාහ. මෙහි "ගඞ්ගායාම්" යනු ව්‍යඤ්ජනවෘත්තී (ව්‍යඞ්ගවෘත්තී) ඕපශ්ලෙෂිකාධාරයි).

මෙහි 'ආධාරෙ සප්තමී" යනුවෙන් ආධාරකාරකයෙහි සප්තමී විභක්තිය වන බව ද නැවත ඒ ආධාරය පාණිනීන්‍යාදීන් විසින් තාත්පර්‍යයී සංඥාවශයෙන් "අධිකරණ" යයි ව්‍යවහාරකළ බව ද ඒ අධිකරණය ඕපශ්ලෙෂිකාදි වශයෙන් සවැදෑරුම් බව ද, එහි ඕපශ්ලෙෂිකය මතානන්තර වශයෙන් තෙවැදෑරුම් බව ද කියා "කටෙ ශෙතෙ" යනාදි වශයෙන් උදාහරණ කරණලදී. "ආධියතෙ. සම්නන්ති=ආධාරඃ" යනු නිර්වචන බැවින් යම් තැනෙක්හි (කතෘ කර්මාදිකාරයෙන් ක්‍රියාව) දරණු ලැබේ නුයි (පිණ්ඩාර්‍ථයි) ඒ ආධාර වේ. එහි-යමෙක්හි අධෙයය හා උපශ්ලෙෂ ඇතිව (අනන්තර සංයෝග ඇතිව) දරණු ලැබේ නම් ඒ ඕපශ්ලෙෂිකාධාරයයි කියනු ලැබේ. එනම්- "කටෙ ශෙතෙ" යන තන්හි "කටෙ" යනු ආධෙයවූ කතෘහා අනන්තරසංයොග ඇතිව තත් ක්‍රියාව දරණු ලබන බැවින් ඕපශ්ලෙෂිකාධාරයි. යමෙක්හි ආධෙයය හා සංයොග රහිතව තත්සමීපවර්‍තිත්වයෙන් දරණු ලැබේ නම් ඒ සාමීපිකාධාරයයි කියනු ලැබේ. එනම්- "වටෙ ගාවඃ සුඅරතෙ" යන තන්හි 'වටෙ' යනු ගොඝඛ්‍යාත ආධෙයයවූ කතෘහුගේ ශයනක්‍රියාව සමීප වර්‍තිත්වයෙන් දරණු ලබන බැවින් සාමීපික වේ. යමෙක්හි ආධෙයය සමීපවයවසම්බන්ධයෙන් දරණු ලැබේ නම් ඒ අභිව්‍යාපිකාධාරයයි කියනු ලැබේ. එනම්- "තිලෙෂු විද්‍යතෙ තෙලම්" යන තන්හි තෙලඝඛ්‍යාත ආධෙය කතෘහුගේ විද්‍යමානත්වය සමීපවයවසංයොගත්වයෙන් (සැමතන්හි පැතිරීමෙන්) දරණු ලබන බැවින් "තිලෙෂු" යනු අභිව්‍යාපකාධාරයි; යමෙක්හි ආධෙයය විෂයකොට (ගොචරකොට) ඇත්තක්ව දරණු ලැබේ නම් ඒ වෛෂයිකාධාරයයි කියනු ලැබේ. එනම්- "ඖදි බ්‍රහ්ම" යන තන්හි "ඖදි" යනු බ්‍රහ්ම ඝඛ්‍යාත ආධෙය කතෘහුගේ ප්‍රවෘත්තිය ඕපශ්ලෙෂිකාදි ලක්ෂණ විරහිතව විෂයභාවයෙන් දරණු ලබන බැවින් වෛෂයිකාධාරයි යමෙක්හි ආධෙයයෙහි හෙතුවක්ව හෝ ආධෙයය ඵලයකොට ඇතිව දරණු ලැබේ නම් ඒ නෛමිත්තිකාධාරයයි කියනු ලැබේ. එනම්- "යුඞ්ඛෙ සන්නාහ්‍යතෙ ධීරඃ" යන තන්හි ආධෙයඝඛ්‍යාතවූ

ධිරයාගේ සන්නහනක්‍රියාව තන්නිමිත්තභූතයෙන් දරණුලබන බැවින් "යුඬෙ" යනු නෛමිත්තිකාධාරයි, යමෙක්හි අනිතක් සම්බන්ධි ආධෙය ක්‍රියාවක් ඕපචාරිකභූතයෙන් දරණුලැබේ නම් ඒ ඕපචාරිකාධාරයයි කියනුලැබේ. එනම්-"අඞ්ගුල්‍යග්‍රෙ කරිණාං ශතම්" යන තන්හි හුම්හුගේ ආධෙයභූතයෙන් අන්තැනක සිටි ක රිශතප්‍රවෘත්තිය ඕපචාරිකභූතයෙන් දරණුලබන බැවින් "අඞ්ගුල්‍යඃග්‍ර" යනු ඕපචාරිකාධාරයි, ඕපශ්ලෙෂිකාධිකරණය සම්බන්ධි භෙදත්‍රයෙන් එකාදෙශවෘත්තිය "කටෙ ශෙතෙ" යන්තෙන් ප්‍රකාශිතයි. එනම්-එහි ආධෙයයෙන් කවය මුලුල්ලම නොව එක්දෙසක් වැලඳ ගැණීම ඇතිබැවින් "කටෙ" යනු එකදෙශවෘත්ති ඕපශ්ලෙෂිකයි. "භුභෘතසු පාදපාඃ සන්ති" යන තන්හි පාදපසඞ්ඛ්‍යාතආධෙයයෙන් භූභෘත්හුගේ එක්දෙසක් නොව මුලුල්ලම වැලඳගැණීම ඇතිබැවින් "භූභෘත්සු" යනු අභිව්‍යාප්‍යවෘත්ති ඕපශ්ලෙෂිකයි, "ගඞ්ගායාං වරවාලුකාඃ" යන තන්හි වරවාලුකාසඞ්ඛ්‍යාත ආධෙයයෙන් ගඞ්ගාහුගේ එක්දෙසක්ද මුලුල්ලමද නොව තන්හි තන්හි වැලඳ ගැණීම ඇතිබැවින් "ගඞ්ගායාම්"යනු ව්‍යප්තවෘත්ති ඕපශ්ලෙෂිකයි. තවද "ආධාරොධිකරණම්"යන පාණිනීයසූත්‍රය ඇසුරුකොට අධිකරණලක්ෂණ දක්වන්නාවූ භර්තෘහරීන් මෙසින්:-

"කර්තෘකර්මව්‍යවහිතාමසාක්ෂාධාරයත් ක්‍රියාම්,
උපකුර්වත් ක්‍රියාසිද්ධෙ ශාස්ත්‍රෘධිකරණං සමෘතම්"

යනු කියනලදි. යමෙක් කර්තෘකර්මයෙන් ව්‍යවධානවත්වූ එහෙයින්ම අප්‍රත්‍යක්ෂවූ ක්‍රියාව දරමින් ක්‍රියාසිද්ධියෙහි උපකාර වන්නේ නම් ඒ ශාස්ත්‍රවිෂයෙහි අධිකරණයයි දන්නාලදී යනු මෙහි අර්ථයි. "කුමාරඃ කටෙ ශෙතෙ" යන තන්හි "කුමාරඃ"යන කර්තෘහුගෙන් ව්‍යවධානවත්වූ "ශෙතෙ" යන ශයනක්‍රියාව දරණ බැවින් "කටෙ" යනු අධිකරණයි. "සප්තාල්‍යාමොදනං පචති"යන තන්හි 'ඔදනම්" යන කර්මයෙන් ව්‍යවධානවත්වූ "පචති" යන පචන ක්‍රියාව දරණබැවින් "සප්තාල්‍යාම්" යනු අධිකරණයි. මෙකී අධිකරණය සිද්ධාන්තකෞමුදියෙහි "ඕපශ්ලෙෂික වෛෂයික අභිව්‍යාපක" යයි ත්‍රිභෙද කොට කිහුහ. මෙසේ අධිකරණයෙහි සප්තමී විභක්තිය කියා භාවසප්තමී නිර්දිශය කරන්නාහු "භාවෙ ච" යනාදිය කිහුහ.

a "භාවෙ ච සපතමී"

b **ක්‍රියාලක්ෂණං භාවඤ්ච්‍යාපි සපතමී, ප්‍රසිඛක්‍රියයා අප්‍රසිඛ ක්‍රියායා ලක්ෂණබොධනං භාවඃ, දෙවෙ වෂීනි වෛර ආයාතඃ, පතත්‍යංශුමාලිනි පතිනොරතිඃ.**

---

a භාවෙ ච, ක්‍රියාලක්ෂණවූ භාවය ඇතිකල්හිද; හෙවත් ප්‍රසිඛ ක්‍රියාව ඇත්තෙහි ද; සපතමී, සපතමීවිභක්තිය වේ.

b ක්‍රියාලක්ෂණම්, අප්‍රසිඛ ක්‍රියාහුගේ ලක්ෂණය හෙවත් අප්‍රසිඛ ක්‍රියාලක්ෂණයට ඉවහල්වූයේ; භාවඃ, භාව නම් වේ. තත්‍ර අපි, ඒ භාවාඛ්‍යෙහි ද; සපතමී, සපතමීවිභක්තිය වේ. ප්‍රසිඛක්‍රියයා, ප්‍රසිඛවූ ක්‍රියාවෙන්; අප්‍රසිඛක්‍රියායාඃ, අප්‍රසිඛවූ ක්‍රියාහුගේ; ලක්ෂණ බොධනම්, ලකුණ දැනීමට ඉවහල්වූයේ; භාවඃ, භාවයයි. දෙවෙ වෂීනි, වැස්ස වසිනකල්හි වෛරඃ, වෛරතෙම; ආයාතඃ, ආයේය. අංශුමාලිනි, සූර්‍යයා; පතති, අස්තයට යනකල්හි; අරතිඃ ඝත්‍රුතෙම; පතිතඃ, (යුඛයට අවුත්) වැටුනේය; හෙවත් නැසුනේය. (මෙහි "වෂීනි" යන භාවාඛ්‍යෙහි 'දෙවෙ' යනුද, "පතති' යන භාවාඛ්‍යෙහි "අංශුමාලිනි" යනුද සපතමීයි).

භාවසපතතමීනිදේශවාරයෙන් භාවලක්ෂණ දක්වන්නාහු "ක්‍රියාලක්ෂණම්" යනාදිය කිහු. ප්‍රසිඛවූ ක්‍රියාවකින් අප්‍රසිඛවූ ක්‍රියාවක්හුගේ තත්ත්වය ඇඟවීමෙහි ඒ ප්‍රසිඛක්‍රියාව ඇත්තහු කෙරෙන් ද (තද්විශෙෂණත්වයෙන් ඒ ප්‍රසිඛක්‍රියාවකෙරෙන්ද) සපතමීවිභක්තිය වේය යනු මෙහි එලිතාඛ්‍යයි. මෙහි ප්‍රසිඛක්‍රියාව ඇත්තහු කතෘ හෝ කර්මයද වියයුතුබැවින් මේ සපතමීවිභක්තිය යද කර්ත්‍රාඛ්‍යෙහි හෝ කර්මාඛ්‍යෙහි වියයුතුයි). "දෙවෙ වෂීනි වෛරආයාතඃ"යන තන්හි සජ්ජනප්‍රසිඛවූ දෙවවෂීණක්‍රියාවෙන් අප්‍රසිඛවූ වෛරාගමන ක්‍රියාව ලක්ෂිතබැවින් ඒ ප්‍රසිඛක්‍රියාවත්වූ "දෙව" ශබ්දයාකෙරෙන්ද තද්විශෙෂණත්වයෙන් "වෂීත්" යන ඒ (භාව සඞ්ඛ්‍යාත) කෘදන්තක්‍රියාව කෙරෙන්ද සපතමීවිභක්තිය වීය. මෙහි "දෙවෙ" යන්න වෂීණක්‍රියාවෙහි කතෘත්වයෙන් සිටි බැවින් කර්ත්‍රාඛ්‍යෙහි සපතමීයයි. "පතත්‍යංශුමාලිනි" යනාදියෙහි ද මෙස්සි.('ගොෂ්ඨු දුහ්‍යමානාසු වෛරොගතඃ' යනතන්හි 'ගොෂ්ඨු යන්න "දුහ්‍යමානාසු" යන දෙහනක්‍රියාවෙහි කර්මත්වයෙන් සිටි බැවින් කර්මාඛ්‍යෙහි සපතමීයයි.) මෙයේ තත් තත් කාරකාඛ්‍යි

261 විනාසහනමඃතෙනිර්ධාරණසවාම්‍යාදිභිශ්ච.

(විනාසහනමඃතෙනිර්ධාරණසවාම්‍යාදිභිඃ 3, 3; ච 1, 1;

a එතෛරපි යොගෙ විතීයාද්‍යා විභක්තයෝ භවන්ති. "විනා අනන්තරෙණ අනන්තරා" ඉත්‍යාදියොගෙ විතීයා. විනා පාපං සර්‍ෂිං ඵලති, අනන්තරෙණාක්ෂිණී ජීවිතෙන කිම්, අන්තරා ත්වාං මාං මධුරිපු * ඉත්‍යාදිපදෘදග්‍රාහ්‍යම්.

සූත්‍රක විතීයාදිවිභක්තීන් දක්වා නැවත අව්‍යයාදීන්ගේ උපපද යොගයෙන් විශෙෂාර්‍ථසූත්‍රකයින් විතීයාදිවිභක්තීන් විධාන කරන්නාහු "විනා" යනාදී සූත්‍රය කීහු

261 විනාසහනමඃතෙනිර්ධාරණසවාම්‍යාදිභිඃ ච,–විනා, විතා නිපාතාදියඃ; සහ, සහ නිපාතාදියඃ; නමස්, නමස් නිපාතාදියඃ; සඃතෙ, සඃතෙ නිපාතාදියඃ; නිර්ධාරණ, නිර්ධාරණාර්‍ථාදියඃ; සවාම්‍ය දිභිඃ ච, සවාමින් ශබ්දාදිය යන මෙවුන් හා යොගයෙහි ද (විතීයා දීහු පිළිවෙළින් වෙත්.)

a එතෛඃ යොගෙ අපි, මේ "විනා" යනාදි නිපාතයන් හා යොග යෙහි ද; විතීයාද්‍යා විභක්තයඃ, විතීයාදි විභක්තීහු; භවන්ති, වෙත්. (එනම්–විනා අනන්තරෙණ අනන්තරා ඉති, "විනා අනන්තරෙ අනන්තරා" යන; ආදියොගෙ, මේ ආදීන් හා යොගයෙහි, විතීයා, විතීයා විභක්තිය වේ. පාපං විනා, පාපය නැතිකල්හි; සර්‍ෂිම්, සියල්ල; ඵලති, පල දේ; (මෙහි "පාපම්" යනු විනා යොගයෙහි ෂෂ්ඨ්‍යර්‍ථයෙහි විතීයායි); අක්ෂිණී අනන්තරෙණ, ඇස්දෙක නැති කල්හි; ජීවිතෙන, ජීවිතයෙන්; කිම්, කිම;? (මෙහි "අක්ෂිණී" යනු "අනන්තරෙණ" යන නිපාත යොගයෙහි ෂෂ්ඨ්‍යර්‍ථයෙහි විති යායි); ත්වාං මාම් අන්තරා, තාගේ හා මාගේ අතර; මධුරිපුඃ, විෂ්ණු තෙම පවතී. (මෙහි "ත්වාං මාම්" යනු "අන්තරා" යන නිපාතයොග යෙහි ෂෂ්ඨ්‍යර්‍ථයෙහි විතීයායි. ආදි පදත්, ආදි පදයෙන් හෙවත් මේ සූත්‍රයෙහි කී ආදිශබ්දයෙන්; ඉති, මෙසේ; (උපපද විතීයානන්තය) ග්‍රාහ්‍යම්, ගත යුතුයි.

"ඛන්දවානෙන ශ්‍රැයමාණං පදං ප්‍රත්‍යෙකමභිසම්බධ්‍යතෙ" යන න්‍යායයෙන් ඛන්දවසමාසානන්තයෙහි උච්චාරණයකරණු ලබන පදය වෙන් වසයෙන් සම්බන්ධකරණු ලැබේයයි කී බැවින්

---

* "මධවිත්‍යාදි"ගිද. පෙණෙයි, එහිද 'මධු' යන්නොත් මධූසූදන සඛ්‍යාතු විෂ්ණුය යන අර්‍ථයි.

a "අධිශීඞ්ස්ථාසාං කර්ම"

b අධිපූර්‍වාණාමෙෂාමාධාරඃ කර්ම ස්‍යාත්. අධිශෙතෙ අධිතිෂ්ඨති අධ්‍යාස්තෙ වා වෛකුණ්ඨං හරිඃ.

c "අභිනිර්විශශ්ච"

මේ සූත්‍රයෙහි ආදි ශබ්දය ද 'විනා" ආදිය සමග වෙන් වසයෙන් යොදනු ලැබේ. එසේ යොදුගත් කල ප්‍රකාශිත තෘතීයාර්‍ථය නම් විනාදි යොගයෙහි ත්‍රිතීයාව ද, සහාදි යොගයෙහි තෘතීයාව ද, නමස්ආදි යොගයෙහි චතුර්‍ථීය ද, ඍතෙ ආදි යොගයෙහි පඤ්චම්‍ය ද, නිර්ධාරණාර්‍ථාදියෙහි ෂෂ්ඨිය ද, සප්තම්‍යර්‍ථාදි යොගයෙහි සප්තම්‍යද වේය යනුයි මෙහි (ටීකාවන්හි මෙසේ ඇතත් නිර්ධාරණාර්‍ථාදියෙහි හා සාමීප්‍යාදි යොගයෙහි ෂෂ්ඨිසප්තම් දෙකම වෙත්). ව ශබ්දයෙන් මෙකී යොගයන්හි මෙකී පිළිවෙළින් ත්‍රිතීයාදීහුම නොව අන්‍යව්‍යවකහිනු ද වෙත්. එනම්- "පාපෙන විනා, පාපාද්විනා" යනාදි වශයෙනි, මෙහි "විනා" යොගයෙහි තෘතීයාව හා පඤ්චම්‍ය විය. මෙසේ මේ උපපදයොගත්වයෙන් ත්‍රිතීයාදි විධාන සූත්‍රයෙන් එක් එක් පදය ගෙණ විස්තරකරන්නාවූ වාර්තිකයෝ "විනා අන්තරෙණ' යනාදිය කීහු. තවද මේ ත්‍රිතීයාවිධාන විස්තරයෙහි ලා පාණිනීය සූත්‍ර කිපයක් ද ගෙණහැර දක්වනු කැමැත්තාහු වක්ෂ්‍යමාණ සූත්‍රත්‍රය හා වෘත්තිත්‍රය ද ඊට උදාහරණද කීහු.

a අධිශීඞ්ස්ථාසාම්, අධිපූර්‍වී "ශීඞ් සථා ආස්" යන ධාතූන්ගේ ආධාරය; කර්මී, කර්මය වේ.

b අධිපූර්‍වාණාම්, "අධි" යන උපසර්‍ගීය පූර්‍වීකොට ඇත්තාවූ; එෂාම්, මේ ' ශීඞ්" ධාත්වාදීන්ගේ; ආධාරඃ, ආධාරය; කර්මී ස්‍යාත්, කර්මසංඥ වන්නේය. හරිඃ, විෂ්ණුතෙම; වෛකුණ්ඨම්, ගරුඩ වාහනයෙහි; අධිශෙතෙ, ශයනය කෙරේ; අධිතිෂ්ඨති, සිටී; අධ්‍යාස්තෙ වා, හිඳී කියා හෝ (යෙදේ); (මෙහි 'අධි" පූර්‍වී "ශීඞ් සවපෙන, සථාගතිනිවෘත්තෙෂු, ආස්-උපවෙශනෙ" යන ධාතූන්ගේ යොගයෙහි "වෛකුණ්ඨම්" යනු ආධාරාර්‍ථයෙහි කර්මීයි.)

c අභිනිර්විශඃ ච, අභි නි පූර්‍වී "විශ්" ධාතුගේ ආධාරයද කර්මීය වේ.

a අභිනිත්‍යනභඝඤාතපූර්‍වස්‍ය විශතෙරාධාරඃ කර්‍ම ස්‍යාත්. ග්‍රාමං අභිනිවිශතෙ.

b "උපාඛ්‍යාඞ්වසඃ"

c උපාදිපූර්‍වස්‍ය වශතෙරාධාරඃ කර්‍ම ස්‍යාත්-ආවසථ්‍යං උපවසති, අනුවසති, අධිවසති, ආවසති.

d "සහාදියොගෙ තෘතීයා'ප්‍රධානෙ"

---

a අභිනි ඉති, "අභිනි" යන එතත්සඤ්ඤාත පූර්‍වස්‍ය, මේ (දෙදෙනාගේ) සංඥතිය පූර්‍වකොට ඇත්තාවූ; විශතෙඃ විශ්ධාතුහුගේ, ආධාරඃ, ආධාරය; කර්‍ම ස්‍යාත්. කර්‍මය වන්නේය. ග්‍රාමම්, ගමෙහි; අභිනිවිශතෙ, ඇතුල්වේ. (මෙහි "අභි නි" පූර්‍ව 'විශ ප්‍රවෙශෙ" යන ධාර්‍යොගයෙහි "ග්‍රාමම්" යනු ආධාරාර්‍ථයෙහි කර්‍මයි) මේ සූත්‍රයෙහි "අභිනි" දෙදෙනාගේ වඤ්චසමාසයෙහි අල්ප සවරත්වයෙන් නියන්න පූර්‍වයෙහි යෙදියයුතුවත්ම එසේ නොයොදා මෙසේ යොදනලද්දේ මේ දෙදෙනාගේ ප්‍රත්‍යෙකයොගයෙහි හෝ මීට විපරීතව යොගයෙහි හෝ මෙහි කර්‍මය නොවේයයි දැක්වීම පිණිසයි).

b උපාඛ්‍යාඞ්වසඃ, "උප අනු අධි ආඞ්" යන මොවුන් පූර්‍වකොට ඇති "වස්" ධාතුහුගේ ආධාරය කර්‍මය වේ.

c උපාදි පූර්‍වස්‍ය, "උප" ආදි (මේ) උපසර්‍ගයන් පූර්‍වකොට ඇත්තාවූ; වසතෙඃ, වසධාතුහුගේ; ආධාරඃ, ආධාරය; කර්‍ම ස්‍යාත්, කර්‍මය වන්නේය. ආවසථ්‍යම්, ආවාසයෙහි; උපවසති, වෙසේ. "අනුවසති අධිවසති ආවසති" යනුද මෙම අර්‍ථයි. (මෙහි "ආවසථ්‍යම්" යනු "උප" යනාදීන් පූර්‍වකොට ඇති "වස-නිවාසෙ" යන ධාතුනුගේ යොගයෙහි ආධාරාර්‍ථයෙහි කර්‍මයි). 'අභිසර්‍පත සොඃ" යනාදීන් පූර්‍වෝක්ත විතීයායොග ද මෙහි ඇතුළත් වෙති. මෙසේ "විතා" යනාදි සූත්‍රයෙහි "විතා" යන්න මුල්කොට ඇත්තවුන් සම්බන්ධි උපපදවිතීයාව දක්වා නැවත එහි "සහ" යන්න මුල්කොට ඇත්තවුන් හා යෙදෙන තෘතීයාවිභක්තිය දක්වන්නාහු, "සහාදියොගෙ" යනාදිය කීහු.

d සහාදියොගෙ, සහශබ්දාදීන් හා යොගයෙහි; අප්‍රධානෙ අප්‍රධානයාකෙරෙහි; තෘතීයා, තෘතීයා විභක්තිය වේ.

a සහ සදෘශං සාකං සාර්ධං සමම්ති සහාදයඃ, සහ ශිෂ්‍යේණාගතෝ ගුරුඃ, සදෘශශෛවත්‍රෝ මෛත්‍රේණ, සාකං නයනාභ්‍යාං ශ්ලක්ෂ්ණඃ දන්තඃ, සාර්ධං ධනින්‍යා ධෘතඃ සාධුඃ, සමං ශිෂ්‍යාභ්‍යාමධීතෙ, සමං ශිෂ්‍යේණ ගුරුණා භුජ්‍යතෙ.

---

a සහ සදෘශං සාකං සාර්ධං සමම් ඉති, 'සහ සදෘශං සාකං සාර්ධං සමම්" යන මොහු; සහාදයඃ, සහාදිහුයි. ගුරුඃ, ගුරුතෙම; ශිෂ්‍යේණ සහ, ශිෂ්‍යයා සමග; ආගතඃ, ආයේය–(මෙහි "ශිෂ්‍යේණ" යනු "සහ" යොගයෙහි තෘතීයායි) වෛත්‍රඃ, වෛත්‍රතම් තැනැත්තේ; මෛත්‍රේණ සදෘශඃ, මෛත්‍රතම් තැනැත්තහු සමානයි.(මෙහි "මෛත්‍රේණ" යනු "සදෘශ" යොගයෙහි තෘතීයායි). දන්තඃ; දත්; නයනාභ්‍යාං සාකම් නෙත් දෙක සමග; ශ්ලක්ෂ්ණඃ, සනිග්ධ වෙත් හෙවත් මනොඥ වෙත්. (මෙහි "නයනාභ්‍යාම්" යනු "සාකම්" යන නිපාතයොගයෙහි තෘතීයායි). සාධුඃ, සත්පුරුෂ තෙම; ධනින්‍යා සාර්ධම්, ධනවත්හු සමග; ධෘතඃ, ධරණලද්දේය, හෙවත් එක්කොට ගන්නාලද්දේය. (මෙහි "ධනින්‍යා" යනු "සාර්ධම්" යන නිපාතයොගයෙහි තෘතීයායි). ශිෂ්‍යාභ්‍යාං සමම්, ශිෂ්‍යයන් දෙදෙනා සමග; අධීතෙ, හදාරයි. මෙහි "ශිෂ්‍යාභ්‍යාම්" යනු "සමම්" යන නිපාතයොගයෙහි තෘතීයායි). ගුරුණා, ගුරුහු විසින්; ශිෂ්‍යේණ සමම්, ශිෂ්‍යයා සමග; භුජ්‍යතෙ, අනුභවකරණු ලැබේ).

මෙකී "සහ" ශබ්දාදීන්ගේ යොගය දෙදෙනෙකුසම්බන්ධවුවත් ඒ දෙතන්හිම තෘතීයාව නොව එකෙකුකෙරෙහි වේයයි දක්වනු පිණිස "අප්‍රධානෙ" යනු කීහු. එනම් ඒදෙදෙනාගෙන් අප්‍රධානයාකෙරෙහිම තෘතීයාව වේය යනුයි. ඒ ප්‍රධානත්වය හෝ අප්‍රධානත්වය කෙසේ වේදයත්? සහාදිසම්බන්ධය ඇතිදෙදෙනෙකු අතුරෙන් යමෙක් අතිශයින් ක්‍රියාව ඇසුරුකෙරේ නම් ඒ ප්‍රධාන වේ. ඊට අනුකූලව පවත්නේ අප්‍රධානවේ එනම්–'සහ ශිෂ්‍යේණාගතෝ ගුරුඃ' යනතන්හි ආගමනක්‍රියායෙහි මුඛ්‍යත්වයෙන් අතිශයින් ඒ ක්‍රියාව ඇසුරුකොට පැවැත්තේ ගුරුතෙමේයි. එබැවින් ගුරුතෙමේ ප්‍රධාන වේ. ශිෂ්‍යයා වනාහි ඊට අනුකූලව පැවැති බැවින් ගුරුහුට වඩා අප්‍රධාන වේ, එබැවින් අප්‍රධාන තන්හි තෘතීයායි. එසේම 'තිලෛඃ සහ මාෂාන් වපති"යි කී කල්හි කතෘභූට මුඛ්‍යත්වයෙන් අතිශයින් අභිමතවූයේ මාෂ වපනය බැවින් එහි "මාෂ" ශබ්දය ප්‍රධාන වේ. තිලවපනය වනාහි

a "අශිෂ්ටව්‍යවහාරෙ දෘණඃ ප්‍රයොගෙ චතුර්ත්‍යන්තෙ තෘතීයා" දෘස්‍යා සංයච්ඡතෙ කාමුකඃ, ධර්මේ තු භාය්‍යායෛ සංයච්ඡතිඃ

b "වාරණාර්ථානාමෙ තෘතීයා" අලං විවාදෙන.

එසේ මුඛ්‍යත්වයෙන් අනභිමත බැවින් "තිල" ශබ්දය අප්‍රධාන වේ. එබැවින් එහි සහ යොගයෙහි තෘතීයාය. යම්හෙයකින් මෙහි තිලවපනය කතෘ හට මුඛ්‍යත්වයෙන් අතිශයින් අභිමතවුවොත් එකල්හි 'මාෂ" ශබ්දය අප්‍රධානව "මාෂෛඃ සහ තිලාන් වපති" කියා වේ. ඇතැම්හොත් මේ සහාදීන්ගේ ශබ්ද සම්බන්ධය (ශබ්දවශයෙන් යෙදීම) ප්‍රධානයයිද, ආර්ථසම්බන්ධය (අර්ථවශයෙන් යෙදීම) අප්‍රධානයයි ද කියත්. එනමි යථොක්ත උදාහරණයෙහි ගුරුහුගේ ආගමන ක්‍රියාව හා "සහ" ශබ්දයාගේ සම්බන්ධය ශාබ්ද සම්බන්ධයයි ද, ශිෂ්‍යශබ්දය හා සම්බන්ධය අර්ථසම්බන්ධයයි ද කිහු. සමහර තන්හි "සහ" ශබ්දාදීන්ගේ යොගය නැතත් ඔවුන්ගේ අර්ථවිවක්ෂාව ඇති කල්හි තෘතීයාව වේයයි ද කිහු. එය "තවමහං සිතා" යනාදි සූත්‍රනිර්දේශ හෙයින් යයි ද කිහු. එනම් මෙහි "සිතා" යනු සහාර්ථවිවක්ෂාවෙහි තෘතීයාය.

a අශිෂ්ටව්‍යවහාරෙ අශිෂ්ටයන්ගේ ව්‍යවහාරයෙහි; හෙවත් සඞ්කීර්ණාචාර ඇත්තවුන්ගේ ක්‍රියායෙහි; දෘණඃප්‍රයොගෙ, "දෘණ්" ධාතුහුගේ ප්‍රයොගය ඇතිකල්හි; චතුර්ත්‍යන්තෙ, චතුර්ත්‍යර්ථවිභක්තියෙහි; තෘතීයා, තෘතීයා විභක්තිය වේ. කාමුකඃ කාමුක තැනැත්තේ; දෘස්‍යා, දෘයට; සංයච්ඡතෙ, (කැමැත්ත) දෙයි. (මෙහි අශිෂ්ට ව්‍යවහාරයෙහි "දෘණ්" ධාතුයොගය බැවින් "දෘස්‍යා". යනු චතුර්ත්‍යර්ථෙ තෘතීයාය.) ධර්මේ තු, ධර්ම්‍යව්‍යවහාරයෙහි වනාහි; (තෘතීයා නොව චතුර්ත්‍යර්ථය වේ. එනම්) භාය්‍යායෛ, භාර්‍යාවට; සංයච්ඡති, කැමැත්ත දෙයි. (කියාවේ.)

මෙහි කී අශිෂ්ටව්‍යවහාරය නම් අන්‍යවාංශිකයෙකු විසින් අන්‍යවාංශිකස්ත්‍රියක් හා කරණලද ජාතිසම්භෙදක්‍රියාවයි. "දෘණ්" ධාතුව පරසෛපදීවුවත් අශිෂ්ටව්‍යවහාරයෙහි "සම්" පූර්ව "දෘණ්" ධාතුව ආත්මනෙපදී වේ.

b වාරණාර්ථයොගෙ, නිෂෙධාර්ථනිපාතයොගයෙහි; තෘතීයා, තෘතීයාවිභක්තිය වේ. විවාදෙන, විරුඬවාදයෙන්; අලම්, කම්

a "නමඃසඞ්සනිස්වාහාසඞ්ඛාලංවෂඞ්යොගෙ චතුර්ථී"- නමොනාරායණාය, සඞ්සඞ්කී රාඥෙ, සොමාය ස්වාහා, පිතෘභ්‍යඃ සඞ්ඛා, අලං මල්ලෙ මල්ලාය, වඞ්ඉද්‍රාය.

b "රුච්‍යර්ථානාමප්‍රීයමාණඃ"

නැත. (මෙහි "අලම්" යන වාරණාර්ථනිපාතයොගයෙහි "විවාදෙන" යනු තෘතීයාසි. "ප්‍රකෘත්‍යාදිභ්‍යශව" යනාදියෙන් කී තෘතීයාභෙද ද මෙකී සහාදිවිධානයෙහි ඇතුළත් වෙයි.) මෙසේ සූත්‍රොක්ත "සහ" යන්න ආදිකොට ඇත්තවුන්ගේ යොගයෙහි තෘතීයාව දක්වා නැවත "නමස්" යන්න ආදිකොට ඇත්තවුන්ගේ යොග යෙහි චතුර්ථිය දක්වන්නාහු "නමඃ සවසති" යනාදිය කීහු.

a නමසවසතිස්වාහා සවධාලංවඞ්යොගෙ, "නමස් සවසති සවා හාසවධා අලං වෂට්" යන මේ නිපාතයන්ගේ යොගයෙහි; චතුර්ථී, චතුර්ථීවිභක්තිය වේ. නාරායණාය, විෂ්ණුහට; නමඃ, නමස්කාර වේවා. (මෙහි "නාරායණාය" යනු "නමස්" නිපාතයොගයෙහි චතුර්ථිසි). රාඥෙ, රජහට; සවසති යහපත වේවා; (මෙහි "රාඥෙ" යනු "සවසති" නිපාතයොගයෙහි චතුර්ථිය). සොමාය, චන්ද්‍රයාට; සවාහා, "සවාහා" කියා පිදියයුතුසි; (මෙහි "සොමාය" යනු "සවා හා" යොගයෙහි චතුර්ථිය) පිතෘභ්‍යඃ, පිතෘදෙවතාවුන්ට (ළඟිය මුතුන්මුත්තන්ට); සවධා, "සවධා" කියා පිදියයුතුසි. (මෙහි "පිතෘ භ්‍යඃ" යනු 'සවධා" යොගයෙහි චතුර්ථිය). මල්ලඃ, මල්ලතෙමේ; මල්ලාය, මල්ලයාට; අලම්, සමර්ථවේ. (මෙහි 'මල්ලාය' යනු 'අලම්" යොගයෙහි චතුර්ථිය) ඉන්ද්‍රාය ශක්‍රයාට, වෂට්, "වෂට්" කියා පිදිය යුතුසි. (මෙහි "ඉන්ද්‍රාය" යනු "වෂට්" යොගයෙහි චතුර්පිසි).

"නාරායණං නමසකෘත්‍ය" යනාදී තන්හි "නමස්" යොගය ඇතත් චතුර්ථිවිභක්තිය නොව විතියාව වේ. ඒ උපපදවිභක්තෙඃ කාරකවිභක්තිගරීයසි" යන න්‍යායහෙයිනි. එනම් උපපද වශයෙන් යෙදෙන විභක්තියට වඩා කාරක වශයෙන් යෙදෙන විභක්තිය ඉතා බලවත්යසි කි හෙයින් මෙහිද "නමසකෘත්‍ය" යන පූර්ක්‍රියාවට "නාරායණ" ශබ්දයාගේ කර්මත්වය වීම බලවත් වේ. තවද මෙහි කි "අලම්" යන්නෙන් ශක්තාර්ථවූ "අලං ශක්ත ප්‍රභූ සමර්ථ පර්‍යාප්ත" යන මේ ආදීහු ගණුලැබෙත්.

b රුච්‍යර්ථානාම්, රුචිය අර්ථකොට ඇති ධාතූන්ගේ යොග යෙහි; ප්‍රීයමාණඃ, පිණවනුලබන අර්ථය (සම්ප්‍රදාන නම් වේ).

a රුවාදීනාං ධාතූනාං ප්‍රයොගෙ ප්‍රියමාණොදීහි සම්ප්‍ර දානං සියා. හරයෙ ගොවනෙ භකතිහි.

d "සෘතාදිභ්‍යොගෙ පඤ්චම්" - "සෘතෙ අනිහි ආරාත් ඉතරහි අවුත්තසද්දං දිගාවාචකා සද්දා ආහි ආවි" එතෙ සෘත ආදයො, අන්‍යශබ්දත්‍යාදීහි යොගෙ. සෘත ඝුනාත්ත මුකතිහි, අත්‍ය ඉතරාදිවිසයෙ, ආරාද් වනාත්, ඉතරෙ ග්‍රාමාත්, "සෘතාදියොගෙ භිතියා" ඝුනම් සෘතෙ, චකාර විනාදියොගෙ කාරකිසංඛ්‍යාසද්දාදීහි සහ; විනා ඝුනාත්, ඝුනෙන විනා

---

a රුවාදීනාං ධාතූනාම්, රොචනාදීධාතූන්ගේ; ප්‍රයොගෙ, ප්‍රයොගයෙහි; ප්‍රියමාණෙ අර්ථෙ, ප්‍රිය කරණු ලබන අර්ථය; සම්ප්‍ර දානං සියාත්, සම්ප්‍රදාන නම් වේවා. භකතිහි, භකති තොමෝ; හරයෙ විෂ්ණුහට; රොචතෙ, රුචි කෙරේ. (මෙහි "හරයෙ" යනු රොචනාදී ධාතුයොගයෙහි වැටුණේය.)

